# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/57 – 2022 අගෝස්තු 13 වැනි සෙනසුරාදා – 2022.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2017

**2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත**

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා උත්තේජක මර්දන
නියෝජ්‍යායතනය.

2022 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2022 ශ්‍රී ලංකා උත්තේජක මර්දන රීති යනුවෙන් හඳුන්වනු ලබන අතර 2022.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**උත්තේජක මර්දන රීති අදාළ වීම**

2. මේ රීති -

(අ) (මෙහි මින්මතු ''එස්.එල්.ඒ.ඩී.ඒ'') යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ උත්තේජක පාලන අංශයක සේවයේ යෙදී සිටින එහි පාලන මණ්ඩලයේ සාමාජිකයන්, අධ්‍යක්ෂවරයන්, නිලධරයන්, විශේෂිත සේවා නියුක්තකයන් සහ අභිනියෝජිත තුන්වන පාර්ශවයන් සහ ඔවුන්ගේ සේවා නියුක්තයන් ද ඇතුළුව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය;

(ආ) ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක යම් උත්තේජක පාලන අංශයක සේවයේ යෙදී සිටින මණ්ඩලයේ සාමාජිකයන්, අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ විශේෂ සේවා නියුක්තයන් සහ අභිනියෝජිත තුන්වන පාර්ශ්වයන් සහ ඔවුන්ගේ සේවා නියුක්තයන් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක්; සහ

(ඇ) ජාතික මට්ටමේ සිටින හෝ නොසිටින හෝ නේවාසිකව සිටින හෝ නොසිටින පහත සඳහන් ක්‍රීඩකයන්, ක්‍රීඩා සහායකයන් සහ අනෙකුත් ක්‍රීඩකයන් සඳහා :-

(i) යම් ක්‍රීඩා සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති යම් ක්‍රීඩා සංවිධානයක සාමාජිකයකු හෝ බලපත්‍ර දරන්නකු හෝ යම් ක්‍රීඩා සාමාජිකයකු අනුබද්ධිත සංවිධානයක් වන සෑම ක්‍රීඩකයකු ම හෝ ක්‍රීඩා සහායකයකු;

(ii) යම් ඉසව්වක්, තරගයක් හෝ වෙනත් ක්‍රියාකාරකමක් එම ඉසව්ව, තරගය හෝ ක්‍රියාකාරකම පවත්වනු ලබන ස්ථානය නොසලකා, යම් සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළු ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක් විසින් හෝ ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුබද්ධ සංවිධානයක් විසින් සංවිධානය කරනු ලබන, කැඳවනු ලබන, බලය දෙනු ලබන හෝ පිළිගනු ලබන එකී ඉසව්වට, තරඟයට හෝ වෙනත් ක්‍රීඩාවකට යම් ශක්‍යතාවකින් සහභාගී වන සෑම ක්‍රීඩකයකුම හෝ ක්‍රීඩා සහායකයකු;

(iii) උත්තේජක ද්‍රව්‍ය මර්දන කාර්යයේ දී යම් රජයේ ක්‍රීඩා සංවිධානයක් විසින් ප්‍රදානය කරන ලද ප්‍රතීතනයක්, බලපත්‍රයක් හෝ වෙනත් ගිවිසුම්ගත වැඩපිළිවෙළක් හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක අධිකරණ බලයට හෝ යම් සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළු ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක අධිකරණ බලයට යටත් වන යම් ක්‍රීඩකයකු හෝ ක්‍රීඩා සහායක තැනැත්තකු;

(iv) ක්‍රීඩා සංවිධානයකට අනුබද්ධ නොවන ජාතික ඉසව්වක හෝ ජාතික ලීගයක යම් සංවිධායකයකු විසින් සංවිධානය කරනු ලබන, පවත්වනු ලබන, කැඳවනු ලබන හෝ බලය දෙනු ලබන ඕනෑම ක්‍රියාකාරකමකට යම් ශක්‍යතාවයකින් සහභාගි වන සෑම ක්‍රීඩකයකුම හෝ ක්‍රීඩා සහායකයකුම;

(v) විනෝදාත්මක කාර්යයන් සඳහා ක්‍රීඩාවල හෝ යෝග්‍යතා ක්‍රියාකාරකම්වල යෙදෙන හෝ ඒවාට සහභාගි වන එහෙත් ක්‍රීඩා සංවිධාන විසින් හෝ යම් අනුබද්ධ හෝ අනුබද්ධිත නොවන සංගමයක්, සංවිධානයක්, ක්‍රීඩා සමාජයක්, කණ්ඩායමක් හෝ ලීගයක් විසින් සංවිධානය කරනු ලබන, පිළිගනු ලබන හෝ සත්කාරකත්වය දරනු ලබන තරඟ හෝ ඉසව් සඳහා තරඟ නොවදින යම් තැනැත්තකු සහ යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කිරීමට පෙරාතුව අවුරුදු පහක් ඇතුළත ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු නොවූ යම් තැනැත්තකු හෝ පරීක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන හෝ යම් විවෘත කාණ්ඩයක හෝ වෙනත් යම් ජාත්‍යන්තර සම්මේලනයක්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හෝ වෙනත් ජාතික උත්තේජක මර්දන සංවිධානයක් විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර ඉසව්වක ශ්‍රී ලංකාව හෝ වෙනත් යම් රටක් නියෝජනය නොකරන ලද ජාතික මට්ටමේ ක්‍රීඩකයකු හෝ වෙනත් ජාතික උත්තේජක මර්දන සංවිධානයක්;

(vi) ශ්‍රී ලංකාවේ යම් ජාතික මට්ටමේ හෝ නේවාසිකව සිටින යම් ක්‍රීඩකයකු ඇතුළුව තරඟ කිරීම සඳහා, පුහුණු කටයුතු සඳහා හෝ අන්‍යාකාරයක් කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ බලය ලබාදෙනු ලබන යම් තැනැත්තකු,

සඳහා මේ රීති අදාළ විය යුතු ය.

3.2 වන රීතියේ කාර්යය සඳහා, ජාතික මට්ටමේ ක්‍රීඩකයකු යන්නට -

(අ) ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක හෝ ක්‍රීඩා සංගම්, සමාජ, කණ්ඩායම් හෝ ලීගයන් ඇතුළු ක්‍රීඩා සංවිධානයකට අනුබද්ධ වෙනත් යම් සංවිධානයක සාමාජිකයකු හෝ බලපත්‍ර දරන්නකු වන යම් ක්‍රීඩකයකු;

(ආ) ක්‍රීඩා සංවිධානයක් විසින් හෝ යම් අනුබද්ධිත ක්‍රීඩා සංගමයක්, සංවිධානයක්, සමාජයක්, කණ්ඩායමක් හෝ ලීගයක් විසින් සංවිධානය කරනු ලබන, පිළිගනු ලබන හෝ සත්කාරකත්වය දරනු ලබන යම් තරඟයකට, ඉසව්වකට හෝ ක්‍රීඩාවකට සහභාගී වන හෝ තරඟ වදින යම් ක්‍රීඩකයකු;

(ඇ) ශ්‍රී ලංකාවේ දී උත්තේජක ද්‍රව්‍ය භාවිතයට එරෙහිව සටන් කිරීමේ කාර්යය සඳහා ප්‍රතීතනයක්, බලපත්‍රයක් හෝ වෙනත් යම් ගිවිසුම්ගත එකඟතාවක් මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවිධානයක හෝ ශ්‍රී ලංකාවේ යම් අනුබද්ධිත සංගමයක, සංවිධානයක, ක්‍රීඩා සමාජයක, කණ්ඩායමක හෝ ලීගයක නිපුණත්වයට අයත් වන යම් ක්‍රීඩකයකු; සහ

(ඇ) ක්‍රීඩා සංවිධානයකට අනුබද්ධිත නොවන ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ඉසව් සංවිධායකයකු හෝ වෙනත් යම් ජාතික ලීගයක් විසින් සංවිධානය කරනු ලබන, පිළිගනු ලබන හෝ සත්කාරකත්වය දරනු ලබන යම් ක්‍රීඩාවකට සහභාගි වන යම් ක්‍රීඩකයකු,

ඇතුළත් වේ.

4.2 වන රීතියේ (අ), (ආ) සහ (ඇ) වන ඡේදයන් හි නිශ්චිතව දක්වා ඇති යම් තැනැත්තකු, මෙම උත්තේජක මර්දන රීතිවලට යටත්වීමට එකඟ වී ඇති බවට සහ මේ රීති බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධිකාරයට සහ යම් ක්‍රීඩාවකට ඔවුන්ගේ සාමාජිකත්වය, ප්‍රතිනිධානය හෝ සහභාගීත්වය සඳහා වන කොන්දේසියක් වශයෙන් මේ රීති යටතේ ඉදිරිපත් කරන ලද නඩු සහ අභියාචනා විභාග කොට තීරණය කිරීම සඳහා වන 38 වන රීතියේ සහ 70 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති නඩු විභාග කිරීමේ මණ්ඩලයන් හි අධිකරණ බලයට යටත් වන බවට සලකනු ලැබිය යුතු ය.

<u>උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම්</u>

5. උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට පහත සඳහන් දේ ඇතුළත් වන්නේ යඃ-

(අ) (i) 'බී' නියැදියේ විශ්ලේෂණය ක්‍රීඩකයා විසින් අත්හැර දමන ලද අවස්ථාවක සහ 'බී' නියැදිය විශ්ලේෂණය නොකරනු ලැබූ අවස්ථාවක ක්‍රීඩකයාගේ 'ඒ' නියැදියේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ එහි ඇති පරිවෘත්තීය ද්‍රව්‍යයක හෝ සලකුණු පැවතීම හෝ ක්‍රීඩකයාගේ 'බී' නියැදිය විශ්ලේෂණය කරනු ලැබ එම 'බී' නියැදියේ විශ්ලේෂණය මගින් ක්‍රීඩකයාගේ 'ඒ' නියැදියෙන් සොයා ගත් තහනම් කරන ලද ද්‍රව්‍යය හෝ එහි ඇති පරිවෘත්තීය ද්‍රව්‍යය හෝ සලකුණු 'බී' නියැදියේ පවතින බව තහවුරු කරනු ලබන අවස්ථාවක හෝ ක්‍රීඩකයාගේ 'ඒ' හෝ 'බී' නියැදිය කොටස් දෙකකට වෙන්කර එම වෙන් කරන ලද නියැදියේ තහවුරු කරන ලද කොටසෙහි විශ්ලේෂණය මගින් වෙන් කරන ලද නියැදියේ පළමුවන කොටසෙහි සොයාගත් තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ එහි ඇති පරිවෘත්තීය ද්‍රව්‍ය හෝ සලකුණු පවතින බව තහවුරු කරනු ලබන අවස්ථාවක් හෝ ක්‍රීඩකයා විසින්, වෙන් කරන ලද නියැදියේ තහවුරු කරන ලද කොටසෙහි විශ්ලේෂණය අත්හැර දමන අවස්ථාවක්;

(ii) තහනම් කරන ලද ලැයිස්තුවේ හෝ තාක්ෂණික ලේඛනයක තීරණ ගැනීමේ සීමාවක් නිශ්චිතව හඳුනාගෙන ඇති ද්‍රව්‍ය හැර, ක්‍රීඩකයකුගේ නියැදියේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ එහි ඇති පරිවෘත්තීය ද්‍රව්‍ය හෝ සලකුණු යම් වාර්තාගත ප්‍රමාණයක් පැවතීම;

(iii) (i) වන සහ (ii) වන ඡේදයන් හි කාර්යය සඳහා, තහනම් කරන ලද ද්‍රව්‍යයක් තම ශරීරයට ඇතුළු කර නොගන්නා බව සහ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත නොකරන බවට සහතික වීම එක් එක් ක්‍රීඩකයාගේ වගකීම වේ. ඒ අනුව, 5 වන රීතිය යටතේ, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සනාථ කිරීම සඳහා ක්‍රීඩකයාගේ පාර්ශ්වයෙන් චේතාන්විත වරදකින්, නොසැලකිලිමත්භාවයකින් හෝ දැන දැනම තහනම් උත්තේජක භාවිත කිරීම යනාදී කරුණු දැක්වීම අවශ්‍ය නොවේ.

(ආ) යම් ක්‍රීඩකයකු විසින් තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම, හෝ භාවිත කිරීමට උත්සාහ කිරීම, තහනම් කරන ලද ද්‍රව්‍යයක් තම ශරීරයට ඇතුළත් වී නොමැති බව සහ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කර නොමැති බව සහතික කිරීම ක්‍රීඩකයාගේ පෞද්ගලික යුතුකම වන්නේ ය. තහනම් කරන ලද ද්‍රව්‍යයන් හෝ ක්‍රමයන් භාවිතයෙන් හෝ ක්‍රීඩකයා විසින් තහනම් කරන ලද ද්‍රව්‍යයන් හෝ ක්‍රමය භාවිත කිරීමට ගත් උත්සාහයක් මගින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සනාථ කිරීම සඳහා ක්‍රීඩකයාගේ පර්ශ්වයෙන් චේතාන්විත වරදක්, නොසැලකිලිමත්භාවයක් හෝ දැනුවත්ව භාවිත කිරීමක් යනාදී කරුණු දැක්වීමක් අවශ්‍ය නොවන්නේ ය. ක්‍රීඩකයකු විසින් තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට උත්සහ කිරීම සාර්ථක වන්නේ ද අසාර්ථක වන්නේ ද යන වග වැදගත් නොවන්නේ ය.

(ඇ) මෙම උත්තේජක මර්දන රීති මගින් නිසි පරිදි බලයලත් තැනැත්තකු විසින් දැනුම් දීමෙන් පසු පිළිගත හැකි සාධාරණීකරණයක් නොමැතිව නියැදි එකතු කිරීම මඟ හැරීම, ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම, හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමක්;

(ඈ) ලියාපදිංචි පරීක්ෂණ සංචිතයක සිටින ක්‍රීඩකයකු විසින් මාස දොළහක කාලසීමාවක් ඇතුළත ප්‍රතිඵල පාලනය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙහි අර්ථ දක්වා ඇති පරිදි මඟ හැරුණු පරීක්ෂණ හෝ ගොනු කිරීම අසාර්ථක වීම් යන ඕනෑම අවස්ථා තුනක සංයෝගයක්;

(ඉ) ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් උත්තේජක ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් වන යම් කොටසකට මැදිහත් වීම හෝ මැදිහත් වීමට තැත්කිරීමක්;

(ඊ) ක්‍රීඩකයකු හෝ ක්‍රීඩා සහායක තැනැත්තකු විසින් තහනම් කරන ලද ද්‍රව්‍යයක් සන්තකයේ තබා ගැනීම හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම. ඊට -

(i) ක්‍රීඩකයකු විසින්, තරඟයෙන් පිටත දී තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් තරඟය අතරතුර තමා සන්තකයේ තබා ගැනීම හෝ තහනම් කරන ලද යම් ක්‍රමයක් භාවිත කිරීම හෝ, එසේ සන්තකයේ තබා ගැනීම හෝ තරඟයෙන් පිටත දී එසේ තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් සන්තකයේ තබා ගෙන සිටීම හෝ තහනම් ක්‍රමයක් භාවිත කිරීම හෝ ගැනීම 17 වන රීතියට හෝ වෙනත් පිළිගත හැකි සාධාරණීකරණයකට අනුව ප්‍රදානය කරන ලද (මෙහි මින් මතු "ටී.යූ.ඊ" යනුවෙන් සඳහන් කරනු ලබන) චිකිත්සක භාවිතය සඳහා මුක්තියකට අනුකූල වන බව ක්‍රීඩකයා විසින් සනාථ කරනු ලබන්නේ නම් මිස, එවැනි තහනම් කරන ලද ද්‍රව්‍යයක් ඔහු ළඟ තබා ගැනීමක්; සහ

(ii) ක්‍රීඩා සහායක තැනැත්තකු විසින්, යම් ක්‍රීඩකයකු, යම් තරඟයක් හෝ පුහුණුවීමක් සම්බන්ධයෙන් තරඟයෙන් පිටත දී තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් තරඟය අතරතුර තමා සන්තකයේ තබා ගැනීම හෝ තහනම් කරන ලද යම් ක්‍රමයක් භාවිත කිරීම හෝ තරඟයෙන් පිටත දී තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද යම් ක්‍රමයක් භාවිතා කිරීම 17 වන රීතියට හෝ වෙනත් පිළිගත හැකි සාධාරණීකරණයකට අනුව ප්‍රදානය කරන ලද ටී.යූ.ඊ මුක්තියකට අනුකූල වන බව ක්‍රීඩා සහායක තැනැත්තා විසින් සනාථ කරනු ලබන්නේ නම් මිස, ක්‍රීඩකයකු, එවැනි ද්‍රව්‍යයක් තමා සන්තකයේ තබා ගැනීම,

ඇතුළත් වේ.

(උ) තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් නීති විරෝධීව ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කිරීමට උත්සහ කිරීම;

(ඌ) ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින්, තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් තරඟය අතරතුර යම් ක්‍රීඩකයකු වෙත යෙදීමට උත්සහ කිරීම, හෝ තරඟයකින් පිටත දී තහනම් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද යම් ක්‍රමයක්, යම් ක්‍රීඩකයකු වෙත යෙදීමට හෝ යෙදවීමට උත්සාහ කිරීම;

(එ) 61 වන රීතිය යටතේ වෙනත් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමකට අදාළව යම් කිසි දෙයක් සිදු කිරීමට හෝ උල්ලංඝනය කිරීමට යම් උත්සාහ කිරීමක් සම්බන්ධ වීමක්, දිරිමත් කිරීමක්, උදව් කිරීමක්, අනුබල දීමක්, කුමන්ත්‍රණය කිරීමක්, සැඟවීමක් හෝ හිතාමතාම සිදු කරන වෙනත් යම් මැදිහත්වීමක් හෝ මැදිහත්වීමක් සඳහා උත්සාහ කිරීමක්;

(ඒ) එස්.එල්.ඒ.ඩී.ඒ. හි අධිකාරයට යටත් වන වෘත්තීමය හෝ ක්‍රීඩාවට අදාළ ශක්‍යතාවයක් දරනු ලබන ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් පහත සඳහන් ආකාරයට ක්‍රීඩා සහායකයකු සමඟ කටයුතු කිරීම තහනම් වේ:-

(i) උත්තේජක මර්දන සංවිධානයක අධිකාරි බලයට යටත්ව නම්, සුදුසුකම් නොලද කාලසීමාවක් ගත කරන යම් ක්‍රීඩා සහායකයකු සමඟ කටයුතු කිරීම;

(ii) උත්තේජක මර්දන සංවිධානයක අධිකාරයට යටත් නොවන්නේ නම්, සහ (මෙහි මින් මතු "නීති සංග්‍රහය" ලෙස හඳුන්වනු ලබන) ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය ප්‍රකාරව අනුකූල වූ ප්‍රතිඵල පාලනය කිරීමේ ක්‍රියාවලියක දී සුදුසුකම් නොලැබීම පිළිබඳ කරුණු දක්වා නොමැති අවස්ථාවක, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය යම් තැනැත්තකු වෙත අදාළ වී ඇත්නම්, යම් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් ඇතුළත් විය හැකි හැසිරීමක නිරත වීම නිසා අපරාධ, විනය හෝ වෘත්තීය නඩු කටයුත්තක වරදකරු වූ හෝ වරදකරු බවට සොයාගත් යම් ක්‍රීඩා සහායකයකු එකී තැනැත්තාගේ සුදුසුකම් නොලැබීමේ තත්ත්වය, අපරාධ, වෘත්තීය හෝ විනය පිළිබඳ තීරණය ලබා දුන් දින සිට හෝ අපරාධ, විනය හෝ වෘත්තීය දණ්ඩනය පැන වූ දින සිට අවුරුදු හයක කාලසීමාවක් සඳහා බලාත්මක විය යුතු ය; හෝ

(iii) (i) වන සහ (ii) වන ඡේදයන් හි විස්තර කර ඇති පුද්ගලයකු වෙනුවෙන් පූර්වගාමී හෝ අතරමැදියකු වශයෙන් කටයුතු කරන යම් ක්‍රීඩා සහායකයකු සමඟ කටයුතු කිරීම.

(ඔ) බලධරීන්ට වාර්තා කිරීම අධෛර්යමත් කිරීමට හෝ ඔවුන්ට එරෙහිව පළිගැනීමට ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් සිදු කරනු ලබන 5 (ඉ) වන රීතියේ සඳහන් ක්‍රියාවක් වෙනත් ආකාරයකින් උල්ලංඝනය සිදු කිරීමක් නොවන පහත සඳහන් ක්‍රියා :-

(i) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නීති සංග්‍රහයට, උත්තේජකනක මර්දන සංවිධානයක, නීති බලාත්මක කිරීමකට හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ උත්තේජක මර්දන සංවිධානය වෙනුවෙන් විමර්ශනයක් පවත්වන නියාමන හෝ වෘත්තීය විනය මණ්ඩලයට, නඩු විභාග කිරීමේ මණ්ඩලය හෝ තැනැත්තා වෙත චෝදනා කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට හෝ චෝදිත අනනුකූලතාවකට

අදාළ තොරතුරු සද්භාවයෙන් වාර්තා කරන තැනැත්තාට තර්ජනය කරන හෝ ඔහුව අධෛර්යමත් කිරීමේ අපේක්ෂාවෙන් තැති ගන්වන යම් ක්‍රියාවක්;

(ii) (මෙහි මින්මතු ඩබ්.ඒ.ඩී.ඒ. යනුවෙන් හඳුන්වනු ලබන) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට නීති සංග්‍රහයට, උත්තේජක මර්දන සංවිධානයකට, නීති බලාත්මක කිරීමකට හෝ 'ඩබ්.ඒ.ඩී.ඒ. හෝ උත්තේජක මර්දන සංවිධානය වෙනුවෙන් විමර්ශනයක් පවත්වන නියාමන හෝ වෘත්තීය විනය මණ්ඩලයට, නඩු විභාග කිරීමේ මණ්ඩලය හෝ තැනැත්තා වෙත චෝදනා කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට හෝ චෝදනා කරන ලද අනනුකූලතාවකට අදාළ සාක්ෂි හෝ තොරතුරු සද්භාවයෙන් ලබා දී ඇති තැනැත්තකුට එරෙහිව පළිගැනීමක්;

(iii) (ඔ) ඡේදයේ (i) වන සහ (ii) වන උපඡේදයන් හි කාර්ය සඳහා, පළිගැනීම, තර්ජනය කිරීම සහ තැතිගැන්වීම යන්නට, යම් ක්‍රියාවක සද්භාවයක් නොපවතින අවස්ථාවක හෝ එම ක්‍රියාව අසමානුපාතික ප්‍රතිචාරයක් වන අවස්ථාවක යම් තැනැත්තකුට එරෙහිව සිදු කරනු ලබන එවැනි ක්‍රියාවක් ඇතුළත් වේ.

<u>උත්තේජක ද්‍රව්‍ය භාවිතය ඔප්පු කිරීම</u>

6. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු වී ඇති බව සනාථ කිරීමේ භාරය, එස්.එල්.ඒ.ඩී.ඒ වෙත පැවරිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව කරන ලද චෝදනාවෙහි, බරපතළකම පිළිබඳව අවධානය යොමුකරමින් නඩු විභාග කිරීමේ මණ්ඩලය සෑහීමකට පත්වන පරිදි උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් සිදු වී ඇද්ද යන්න පිළිබඳව තහවුරු කිරීම ඔප්පු කිරීමේ ප්‍රමිතිය විය යුතු ය.

(3) සෑම අවස්ථාවක දී ම මෙම ඔප්පු කිරීමේ ප්‍රමිතිය, හුදු සම්භාවිතාවේ ශේෂයකට වඩා වැඩි විය යුතු නමුත් සාධාරණ සැකයකට එහා ගිය සනාථ කිරීමකට වඩා අඩු විය යුතු ය.

(4) මෙම උත්තේජක මර්දන රීති මගින්, පූර්ව නිගමනයක් අසත්‍ය යැයි ඔප්පු කිරීම සඳහා හෝ නිශ්චිත සාධක හෝ කරුණු සනාථ කිරීම සඳහා උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බවට සැලකෙන ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු මත ඔප්පු කිරීමේ භාරය පවරනු ලබන අවස්ථාවක, 9 වන සහ 10 වන රීතිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර, සනාථ කිරීමේ ප්‍රමිතිය සම්භාවිතාවේ ශේෂයක් මගින් විය යුතු ය.

<u>කරුණු සහ පූර්ව නිගමන තහවුරු කිරීමේ විධි ක්‍රම</u>

7. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආයතනය විසින් ක්‍රීඩකයාගේ රුධිර නියැදිය, මූත්‍රා නියදිය වැනි ජීව විද්‍යාත්මක තොරතුරු අනුව එළැඹෙන නිගමන මත 5 (ආ) වන රීතියේ ඇති උදාහරණ මගින් විධිවිධාන සලසා ඇති පරිදි ක්‍රීඩකයාගේ 'ඒ' නියැදිය හෝ 'බී' නියැදියෙන් ලබාගත් තහවුරු වූ විශ්ලේෂණාත්මක දත්ත, තුන්වන පාර්ශවයකින් කෙරෙන විශ්වාසදායක සාක්ෂි, විශ්වාසදයක ලිපිලේඛන සාක්ෂි, හෝ ක්‍රීඩකයාගේ වරද පිළිගැනීම පිළිබඳ වූ ප්‍රකාශ මත පදනම්ව උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් තහවුරු කරනු ලැබීය හැකිය.

8. අදළ විද්‍යාත්මක ප්‍රජාව තුළින් අදහස් විමසීමෙන් අනතුරුව ලෝක උත්තේජන මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කරන ලද තත්කාලීන සමාලෝචනයට බඳුන් වූ විශ්ලේෂණාත්මක ක්‍රම හෝ තීරණ ගැනීමේ සීමාවන් විද්‍යාත්මකව වලංගු ලෙස පූර්ව උපකල්පනය කරනු ලැබේ. එවැනි පූර්ව නිගමනයක් සඳහා වන කොන්දේසි සපුරා ඇතැයි හෝ විද්‍යාත්මක වලංගුභාවය පිළිබඳ මෙම පූර්ව නිගමනය අසත්‍ය යැයි ඔප්පු කිරීම අභියෝග කිරීමට අපේක්ෂා කරන යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින්, ප්‍රථමයෙන්ම එවැනි අභියෝගයක පූර්ව කොන්දේසියක් වශයෙන්, අභියෝගය සහ අභියෝගයේ පදනම පිළිබඳ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දිය යුතු ය. මුල් නඩු විභාග කිරීමේ මණ්ඩලය, අභියාචනා මණ්ඩලය හෝ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (CAS) විසින් ද, තමන්ගේ ම මූලිකත්වයෙන් එවැනි යම් අභියෝගයක් පිළිබඳ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දිය යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම දැන්වීම සහ එකී අභියෝගයට අදළ නඩු ගොනුව එම නියෝජ්‍යායතනයට ලැබී දින දහයක් (10) ඇතුළත පාර්ශවයන් ලෙස එම නඩුවට මැදිහත් වීමේ අයිතිය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත තිබිය යුතු අතර එම නඩු කටයුත්තෙහි සාක්ෂි ලබා දිය යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ඉල්ලීම මත (මෙහි මින් මතු සී.ඒ.එස්. යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය ඉදිරියේ ඇති නඩුවල ක්‍රීඩා බේරුම්කරණ අධිකරණ මණ්ඩලය විසින් ඇගයීමට ලක්කිරීම සඳහා සහ සහාය ලබා දීම සඳහා සුදුසු විද්‍යාත්මක ප්‍රවීණයකු පත් කරනු ලැබිය යුතුය.

9. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතීතනය කරන ලද රසායනාගාර සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත අනෙකුත් රසායනාගාර විසින් රසායනාගාර සම්බන්ධයෙන් වන ප්‍රමිතීන්ට අනුව නියැදි

විශ්ලේෂණය හා රක්ෂිත ක්‍රියාපටිපාටීන් සිදු කරනු ලැබ තිබෙන බව උපකල්පනය කෙරෙනු ලැබිය යුතු ය. ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් මෙම උපකල්පනය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක්කේ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් ගෙන් බැහැරව කටයුතු කිරීම විශ්ලේෂණයේ ප්‍රතිඵලවලට ඉතා අහිතකර ලෙස බලපා ඇති බව සනාථ කිරීමෙනි. ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ඉහත දැක්වෙන උපකල්පන ප්‍රතික්ෂේප කිරීමට හේතු වශයෙන් විශ්ලේෂණාත්මක තොරතුරුවලට ඉතා අහිතකර ලෙස බලපෑ හැකි ආකාරයෙන් රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් බැහැරව කටයුතු කර ඇති බව සඳහන් කර ඇත්නම්, එහිදී එකී ප්‍රමිතීන්ගෙන් බැහැරවීම තුළින් විශ්ලේෂණාත්මක තොරතුරුවලට අහිතකර ලෙස බලපෑමක් සිදු වී නොමැති බව තහවුරු කිරීමේ වගකීම ජාතික උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු විය යුතු ය.

10. නීති සංග්‍රහයේ හෝ මේ උත්තේජක මර්දන රීතිවල දක්වා ඇති වෙනත් යම් ජාත්‍යන්තර ප්‍රමිතියකින් හෝ වෙනත් උත්තේජක මර්දන රීතියකින් හෝ ප්‍රතිපත්තියකින් වන බැහැරවීමක් විශ්ලේෂණාත්මක ප්‍රතිඵල හෝ වෙනත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක සාක්ෂි අවලංගු කිරීමක් නොවිය යුතු අතර එය උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා වන ආරක්ෂාවක් නොවිය යුතු යඃ

එසේ වුව ද, අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් හෝ වතගොත පිළිබඳ කරුණු දැක්වීම අසමත් වීම මත පදනම් වී, ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින්, පහත ලැයිස්තුගත නිශ්චිත ජාත්‍යන්තර ප්‍රමිති විධිවිධානයන්ගෙන් එක් විධිවිධානයකින් හෝ බැහැරවීමක්,උත්තේජන මර්දන රීති උල්ලංඝනය කිරීමකට සාධාරණ ලෙස හේතු විය හැකි බව සනාථ කරනු ලබන්නේ නම්, එවිට අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් හෝ වතගොත පිළිබඳ කරුණු දැක්වීම අසමත් වීම සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයේ බැහැරවීමක් හේතු නොවූ බව සනාථ කිරීමේ භාරය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු වේ.

(අ) අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් මත පදනම් වී උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා සාධාරණ ලෙස හේතු විය හැකි නියැදි එකතු කිරීම හෝ නියැදි හැසිරවීමට, අදාළ පරීක්ෂා කිරීම සහ විමර්ශන සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් බැහැරවීමක්;

(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා සාධාරණ ලෙස හේතු විය හැක ගමන් බලපත්‍ර පිළිබඳ අහිතකර තීරණයකට අදාළ ප්‍රතිඵල පාලනය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් හෝ පරීක්ෂා කිරීම සහ විමර්ශනය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් බැහැරවීමක්;

(ඇ) අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් මත පදනම් වී උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා සාධාරණ ලෙස හේතු විය හැකි 'බී' නියැදිය විවෘත කිරීම පිළිබඳ ක්‍රීඩකයාට දැන්වීමක් ලබා දීමේ ඉල්ලීමට අදාළව ප්‍රතිඵල පාලනය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් බැහැරවීමක් හෝ පරීක්ෂා කිරීම සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් බැහැරවීමක්;

(ඈ) කරුණු දැක්වීමට අපොහොසත් වූ වතගොත පිළිබඳ කරුණක් මත පදනම් වී උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා සාධාරණ ලෙස හේතු විය හැකි ක්‍රීඩකයාගේ නිවේදනයට අදළ ප්‍රතිඵල පාලනය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් බැහැරවීමක්.

11. පවත්නා අභියාචනයක ප්‍රස්තුත කාරණයක් නොවන්නා වූ අධිකරණ තීරණයක් මගින් හෝ නිසි අධිකරණමය බලය සහිත වෘත්තිමය විනය විනිශ්චය සභාවක තීන්දුවක් මගින් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කළ බවට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් සනාථ කරනු ලබන්නේ නම් මිස, එම සාධකවල තීරණය අදළ වන ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට එරෙහිව වන වැරදි බව ඔප්පු කළ නොහැකි සාක්ෂි විය යුතු ය.

12. නඩුව විභාග කිරීමට ප්‍රථම, සාධාරණ වේලාවක දී, නඩු විභාගයේ දී පෙනී සිටීමට (නඩු විභාග කිරීමේ මණ්ඩලය විසින් විධාන කර ඇති පරිදි පුද්ගලිකව හෝ දුරකතනයෙන්) සහ නඩු විභාග කිරීමේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු, ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ප්‍රතික්ෂේප කිරීම මත පදනම් වී, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධ නඩු විභාගයක නඩු විභාග කිරීමේ මණ්ඩලය විසින්, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇතැයි ප්‍රකාශ කරනු ලබන ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු වෙත අහිතකර නිගමනයක් ලබා දිය හැකි ය.

<u>තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම</u>

13. තහනම් ද්‍රව්‍ය ලේඛනයේ හෝ එහි ප්‍රතිශෝධනයක අන්‍යාකාරයෙන් දක්වා ඇත්නම් මිස, තහනම් කරන ලද ලැයිස්තුව සහ එහි ප්‍රතිශෝධනය, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් යම් වැඩිදුර කටයුතු කිරීමේ ඉල්ලීමකින් තොරව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ලැයිස්තුව සහ එහි ප්‍රතිශෝධනය පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක (3) කාලයකින් පසුව මේ උත්තේජක මර්දන රීති යටතේ බලාත්මක විය යුතු ය. යම් ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු තහනම් ද්‍රව්‍ය ලැයිස්තුවට සහ ඊට සිදුකරන ලද යම් ප්‍රතිශෝධනයකට බැඳී සිටිය යුතු ය. තහනම් ද්‍රව්‍ය ලැයිස්තුවේ සහ ඊට සිදු කරන ලද සියලු ප්‍රතිශෝධනයන්හි වඩාත්ම යාවත්කාලීන අනුවාදය පිළිබඳ මනා අවබෝධයකින් පසුවීම සෑම ක්‍රීඩයකුගේම සහ අනෙක් සෑම තැනැත්තකුගේ ම වගකීම විය යුතුය.

14. තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව මගින් තරඟය තුළ දී මෙන්ම තරඟයෙන් පිටත දී උත්තේජක ද්‍රව්‍ය වශයෙන් තහනම් කරන ලද,

තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම හඳුනාගත යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් යම් නිශ්චිත ක්‍රීඩාවක් සඳහා තහනම් කරන ලද ලැයිස්තුව දීර්ඝ කළ හැකි ය. පොදු කාණ්ඩයේ හෝ යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් සඳහා වන විශේෂිත සඳහන් කිරීමක් මගින් තහනම් කරන ලද ද්‍රව්‍ය සහ ක්‍රම තහනම් ලැයිස්තුවට ඇතුළත් කළ හැකි ය.

15. 43 වන රීතියේ සිට 63 වන රීතිය දක්වා වන රීති අදාළ වීමේ කාර්ය සඳහා, තහනම් කරන ලද ලැයිස්තුවෙහි හඳුනාගනු ලැබූ පරිදි හැර, සෑම තහනම් ද්‍රව්‍යක්ම, නිශ්චිත ද්‍රව්‍යයක් විය යුතු ය. තහනම් කරන ලද ලැයිස්තුවෙහි නිශ්චිත ක්‍රමයක් ලෙස නිශ්චිත වශයෙන් හඳුනාගනු ලැබුවේ නම් මිස, කිසිදු තහනම් ක්‍රමයක් නිශ්චිත ක්‍රමයක් නොවිය යුතු ය. එම රීතියේ ම කාර්යය සඳහා, අනිසි ලෙස භාවිතා කිරීමේ ද්‍රව්‍ය යන්නට, තහනම් කරන ලද ලැයිස්තුවෙහි අනිසි ලෙස භාවිතා කිරීමේ ද්‍රව්‍ය ලෙස නිශ්චිත වශයෙන් හඳුනාගනු ලැබූ තහනම් ද්‍රව්‍ය ඇතුළත් වේ.

16. තහනම් ලැයිස්තුවට ඇතුළත් කරනු ලබන තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම තහනම් ලේඛනයේ ඇති ද්‍රව්‍ය වර්ගීකරණය කිරීම සහ යම් කිසි ද්‍රව්‍යයක් සෑම විටම හෝ තරගයක් තුල දී පමණක් තහනම් වීම හෝ ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ නිශ්චිත ක්‍රමයක් පිළිබඳව හෝ අනිසි ලෙස භාවිතා කරන ලද ද්‍රව්‍යයක් පිළිබඳව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලබාදෙනු ලබන නිගමනය අවසාන නිගමනය වන අතර එකී ද්‍රව්‍ය හෝ ක්‍රමය, වැළැක්වීම් කාරකයක් සෞඛ්‍ය අවධානමක් නොමැති බව හෝ කාර්ය සාධනය වැඩි කිරීමෙහිලා ශක්‍යතාවයක් නොමැති බව හෝ ක්‍රීඩාවේ ජීව ගුණයට බාධාවක් නොමැත්තේ ය යන කරුණු පදනම් කරගෙන ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ඉදිරිපත් කරන අභියෝගවලට යටත් නොවිය යුතු ය.

<u>චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය (ටී.යූ.ඊ.)</u>

17. තහනම් ද්‍රව්‍යයක් හෝ එහි පරිවෘත්තීය සංඝටකයන් හෝ සලකුණු තිබීම හෝ තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට තැත් කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් පරිපාලනය කිරීම හෝ පරිපාලනය කිරීමට තැත් කිරීම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය පිළිබඳ විධිවිධානවලට අනුකූල වන්නේ නම්, එය උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

18. ''ටී. යූ. ඊ.'' සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය පහත දැක්වෙන පරිදි විය යුතුය:-

(1) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 13 වන සහ 16 රීති අදාළ වන අවස්ථාවක, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු නොවන යම් ක්‍රීඩකයකු විසින්, හැකිතාක් ඉක්මනින්, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත අයදුම් කළ යුතුය. එම අයදුම්පත චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 6 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙබ් අඩවියේ පළ කර ඇති පරිදි විය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, චිකිත්සක භාවිතය පිළිබඳ වන මුක්තිය සඳහා වන ඉල්ලීම සලකා බැලීම සඳහා (මෙහි මින් මතු '' ටී. යූ. ඊ. සී.'' යනුවෙන් සඳහන් කරනු ලබන) චිකිත්සක භාවිතය පිළිබඳ වන මුක්තිය කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(3) ටී. යූ. ඊ. වෙත එලෙස, සම්පූර්ණ කරන ලද ඉල්ලීමක් ලැබුණු දින සිට දින විසි එකක් (21) ඇතුළත, චිකිත්සක භාවිතය සඳහා වන නිදහස් කිරීම් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව වහාම එම ඉල්ලීම ඇගයීමට ලක්කර ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙනු ලැබිය යුතු ය. යම් ඉසව්වක් ආරම්භවීමට සාධාරණ කාලයකට පෙරාතුව යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, එම ඉසව්ව ආරම්භ වීමට පෙර එහි තීරණය ලබා දීමට ටී. යූ. ඊ. සී විසින් උපරිම උත්සාහයක් දරනු ලැබිය යුතුය.

(4) ටී. යූ. ඊ. හි කමිටුවේ තීරණය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අවසාන තීරණය විය යුතු අතර මෙහි 21 වන රීතියට අනුකූලව ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ටී. යූ. ඊ. හි තීරණය චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව අදාළ ක්‍රීඩකයා වෙත සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යාතනය සහ අනෙකුත් උත්තේජක මර්දන සංවිධාන වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එසේම එය ( මෙහි මින් මතු ''ඒ. ඩී. ඒ. එම්. එස්.'' යනුවෙන් සඳහන් කරනු ලබන) උත්තේජක මර්දන පරිපාලන සහ කළමනාකරණ පද්ධතිය වෙත ද වාර්තා කරනු ලැබිය යුතු ය.

<u>අතීතයට බලපාන චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය හා සම්බන්ධ ඉල්ලීම්</u>

19. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ජාත්‍යන්තර මට්ටමේ නොවන හෝ ජාතික මට්ටමේ ක්‍රීඩකයකු නොවන යම් ක්‍රීඩකයකු පරීක්ෂා කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එම ක්‍රීඩකයා විසින් චිකිත්සක හේතු මත භාවිත කරනු ලබන යම් තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් සඳහා අතීතයට බලපාන චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ලබාගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට ඔහුට හෝ ඇයට අවසර දෙනු ලැබිය යුතු ය.

20. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරනු ලබන චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් යම් රටක් තුළ ජාතික මට්ටමේ දී වලංගු වන අතර එය වෙනත් යම් ජාතික උත්තේජක මර්දන සංවිධානයක් විසින් නිල වශයෙන්

පිළිගැනීම අවශ්‍ය නොවන්නේ ය. එසේ වුව ද, අදාළ ක්‍රීඩකයා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙකු බවට පත්වුවහොත් හෝ ජාත්‍යන්තර ඉසව්වක් සඳහා තරග කරනු ලැබුවහොත් එය පහත දක්වෙන පරිදි චිකිත්සකයකු භාවිතය සඳහා වන නිදහස් කිරීම් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව අදාළ ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන ඉසව් සංවිධානය විසින් අනුකූල වන ලෙස පිළිගනු ලබන්නේ නම් මිස, එවැනි යම් චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් වලංගු නොවන්නේ යඃ-

(අ) (i) ප්‍රශ්නගත ද්‍රව්‍ය හෝ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් දැනටමත් ක්‍රීඩකයාට ලැබ ඇති අවස්ථාවක, ඔහුගේ හෝ ඇයගේ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන ඉසව් සංවිධානය විසින් ස්වයං ප්‍රවර්තක ලෙස පිළිගනු ලබන්නේ නම් මිස, ඒ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය පිළිගන්නා ලෙස එම ක්‍රීඩකයා විසින් ඔහුගේ හෝ ඇයගේ ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන ඉසව් සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ඒ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන නිර්ණායක සපුරාලන්නේ නම්, එවිට ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන ඉසව් සංවිධානය විසින් ජාත්‍යන්තර මට්ටමේ තරගවල කාර්යය සඳහා ද එය පිළිගනු ලැබිය යුතු ය.

(ii) ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන තරඟ සංවිධානය විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධ නිර්ණායක සපුරාලනු නොලබන ලෙස සලකා ඒ හේතුවෙන් එම චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, වහාම ඒ සම්බන්ධයෙන් හේතු සහිතව එම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයා සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කිරීමට එම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයාට එම දැනුම් දීමේ දින සිට දින විසි එකක (21) කාලයක් හිමි විය යුතු ය.

(iii) 21 වන රීතියට අනුකූලව එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දනය නියෝජ්‍යායතනය වෙත යොමු කරනු ලබන අවස්ථාවක, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි තීරණය ලැබෙන තෙක් , ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාතික මට්ටමේ සහ තරගවලින් බාහිරව සිදුකරන පරීක්ෂණ සඳහා වලංගු වන නමුත් එය ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා වලංගු නොවන්නේ ය.

(iv) දින විසි එකක (21) කාලසීමාව ඇතුළත එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කරනු නොලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ප්‍රදනය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාතික මට්ටමේ තරග සහ තරගාවලින් පිටත සිදුකරන පරීක්ෂණ සඳහා වලංගු වන්නේ ද යන්න තීරණය කරනු ලැබිය යුතු ය.

එසේ වුවද, ක්‍රීඩකයා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු වීම අවසන් වන අතර ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සහභාගී නොවිය යුතුය.

(v) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි තීරණය ලබා දීමට ඉතිරිව පවත්නා අවස්ථාවක, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාතික මට්ටමේ තරග සහ තරගවලින් පිටත සිදුකරන පරීක්ෂණ සඳහා වලංගු වන නමුත් එය ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා වලංගු නොවන්නේ ය.

(ආ) (i) ප්‍රශ්නගත ද්‍රව්‍ය හෝ ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳව මුක්තියක් ක්‍රීඩකයා සතුව දැනටමත් නොමැති අවස්ථාවක, ක්‍රීඩකයා විසින්, චිකිත්සක භාවිතය සඳහා වන මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති ක්‍රියාවලියට අනුකූලව චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් සඳහා ජාත්‍යන්තර සම්මේලනය වෙත කෙළින්ම ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ii) ජාත්‍යන්තර සම්මේලනය විසින් ක්‍රීඩකයාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එම සම්මේලනය විසින්, ඒ පිළිබඳ හේතු සහිතව ක්‍රීඩකයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(iii) ජාත්‍යන්තර සම්මේලනය විසින් ක්‍රීඩකයාගේ ඉල්ලීමට ඉඩ ලබා දෙනු ලබන අවස්ථාවක, එම සම්මේලනය විසින්, ඒ පිළිබඳ ක්‍රීඩකයා සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඇ) (i) ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය සඳහා වන මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති නිර්ණායක සපුරාලනු නොලබන බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සලකනු ලබන අවස්ථාවක එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත එම දැනුම් දීමේ දින සිට දින විසි එකක (21) කාලයක් හිමි වන්නේ ය.

(ii) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කරනු නොලබන අවස්ථාවක, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි තීරණය ලැබෙන තෙක්, ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාත්‍යන්තර මට්ටමේ තරග සහ තරගවලින් පිටත සිදුකරන පරීක්ෂණ සඳහා වලංගු වන නමුත් එය ජාතික මට්ටමේ තරග සඳහා වලංගු නොවන්නේ ය.

(iii) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම කරුණ සමාලෝචනය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කරනු නොලබන අවස්ථාවක, සමාලෝචනය කිරීම සඳහා එම කරුණ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කිරීමට ඇති දින විසි එකක (21) කාලසීමාව අවසන් වූ විට ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ජාතික මට්ටමේ තරග සඳහා ද වලංගු වන්නේ ය.

<u>චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් කාලය අවසන් වීම, අවලංගු කිරීම, ඉවත් කර ගැනීම හෝ වෙනස් කිරීම</u>

21. (1) මේ උත්තේජක මර්දන රීති ප්‍රකාර ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් -

(අ) එය ප්‍රදානය කරන ලද්දේ යම් කාලයක් සඳහා ද, එම කාලය අවසන් වූ විට, යම් වැඩිදුර දැන්වීමක් හෝ වෙනත් යම් නියමතාවයක් ඉටුකිරීමේ අවශ්‍යතාවකින් තොරව, ස්වයංක්‍රියව කාලය අවසන් විය යුතු ය**;**

(ආ) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය කමිටුව විසින් චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් ප්‍රදානය කරන විට දී එම කමිටුව විසින් පනවන ලද යම් නියමයන්ට හෝ කොන්දේසියකට අනුකූලව ක්‍රීඩකයා විසින් කටයුතු කරනු නොලැබූ අවස්ථාවක, එම මුක්තිය අවලංගු කරනු ලැබිය හැකි ය**;**

(ඇ) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් ප්‍රදානය කිරීම සඳහා වන නිර්ණායක සැබවින්ම සපුරා නොමැති බවට පසුව තීරණය කරනු ලැබූ අවස්ථාවක, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් ඉවත් කර ගනු ලැබිය හැකි ය**;** හෝ

(ඇ) ලෝක උත්තේජක මර්දන නියෝජනායතනය විසින් කරනු ලබන සමාලෝචනය මත අවලංගු කිරීම හෝ අභියාචනා කිරීම කරනු ලැබිය හැකි ය.

(2) එවැනි අවස්ථාවක චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධ කාලය අවසන් වීම, අවලංගු කිරීම, ඉවත් කර ගැනීම හෝ වෙනස් කිරීම, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය බලාත්මක වන දිනට පෙරාතුව ක්‍රීඩකයා විසින් ප්‍රශ්නගත තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම භාවිතා කිරීම හෝ සන්තකයේ තබා ගැනීම හෝ ලබාගැනීම මත පදනම්ව ඔහු යම් ප්‍රතිඵලයන්ට යටත් කරනු නොලැබිය යුතුය. චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන කාලය අවසන් වීමෙන්, ඉවත් කර ගැනීමෙන් හෝ වෙනස් කිරීමෙන් ඉක්බිතිවම ජාත්‍යන්තර ප්‍රමිතියේ 5.1.1.1 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, වාර්තා කරන ලද යම් අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් සම්බන්ධයෙන් වන ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන සමාලෝචනයට එම සමාලෝචනයේ දිනට පෙරාතුව තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම භාවිත කිරීමට අනුකූල ද යන්න සලකා බැලීම ඇතුළත් විය යුතු අතර, එවැනි අවස්ථාවක, කිසිදු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් කරනු නොලැබිය යුතු ය.

<u>චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සමාලෝචනය සහ ඊට විරුද්ධ වන අභියාචනා</u>

22. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ක්‍රීඩකයා විසින්, මෙහි 70(3) වන රීතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, පිරිනමන ලද චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය පිළිනොගැනීම පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනය විසින් ගනු ලබන සහ ඒ පිළිබඳව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට යොමු කරන ලද ඕනෑම තීරණයක් එම ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාමාලෝචනය කළ යුතු ය. ඩබ්. ඒ. ඩී. ඒ. වසින් අගතියට පත් යම් පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක් මත හෝ, ඩබ්. ඒ. ඩී. ඒ. විසින්ම ආරම්භ කරන ලද ඕනෑම චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

සමාලෝචනයට භාජනය කෙරෙන චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන තීරණය ජාත්‍යන්තර ප්‍රමිතීන්හි දැක්වෙන නිර්ණායකවලට අනුකූලව වේ නම් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ඊට මැදිහත් නොවිය යුතු ය.

එහෙත් ඒවා එකී නිර්නායකවලට අනුකූල නොවේ නම් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එය ප්‍රතිවර්තනය කරනු ඇත.

(3) ඩබ්. ඒ. ඩී. ඒ. විසින් සමාලෝචනය කරනු නොලැබූ ජාත්‍යන්තර සම්මේලනයක් වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම සළකා බැලීමට එකඟ වී ඇති අවස්ථාවක හෝ ඩබ්. ඒ. ඩී. ඒ. විසින් සමාලෝචනය කරන ලද එහෙත් එම සමාලෝචනය මත ප්‍රතිවර්තනය කරනු නොලැබූ ජාත්‍යන්තර සම්මේලනය හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියොජ්‍යායතනයේහි චිකිත්සක භාවිතය පිළිබඳ ඕනෑම තීරණයක් 69 වන රීතියේ සිට 79 වන රීතිය දක්වා වූ රීති ප්‍රකාරව ක්‍රීඩකයා හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (සී. ඒ. එස්) වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(4) බලපෑමට ලක්වූ ක්‍රීඩකයා විසින් එස්. එල්. ඒ. ඩී. ඒ. හෝ ජාත්‍යන්තර සම්මේලනය විසින්, දෙනු ලැබූ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධ තීරණයක් වෙනස් කිරීම සඳහා ඩබ්. ඒ. ඩී. ඒ. විසින් ගන්නා ලද තීරණයකට විරුද්ධව ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් ලබාගැනීම සඳහා පිළිගැනීමක් ලබා දීම හෝ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් සමාලෝචනය කිරීම සඳහා නිසි පරිදි ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් සාධාරණ කාලයක් ඇතුළත ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැරීම එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමක් ලෙස සළකනු ලැබිය යුතු අතර, එමගින් අදාළ සමාලෝචනය / අභියාචනා කිරීමේ අයිතිවාසිකම්වලට මඟ පෑදිය යුතු ය.

<u>පරීක්ෂණ සහ විමර්ශන</u>

23. (1) පරීක්ෂණ සහ විමර්ශන උත්තේජක මර්දන කාර්ය සඳහා පමණක් සිදුකරනු ලැබිය හැකිය. පරීක්ෂණ සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්වල විධිවිධාන සහ ඒ ජාත්‍යන්තර ප්‍රමිතීන් පරිපූරක ලෙස පවතින්නා වූ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිශ්චිත පිළිවෙත්වලට අනුකූලව පරීක්ෂණ සහ විමර්ශන සිදු කරනු ලැබිය යුතු ය.

(2) ක්‍රීඩකයා විසින් 5(අ) රීතිය හෝ 5(ආ) රීතිය උල්ලංඝනය කර ඇත් ද යන්න පිළිබඳව විශ්ලේෂණාත්මක සාක්ෂි ලබා ගැනීම සඳහා පරීක්ෂණ සිදුකළ යුතු ය.

(3) මෙහි 23(7) වන සහ 23(8) වන රීතියේ සඳහන් ඉසව් සඳහා වන පරීක්ෂණ සම්බන්ධයෙන් වන සීමාවන්ට යටත්ව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට මෙහි 2 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති සියලු ක්‍රීඩකයින් සම්බන්ධයෙන් තරඟ කළ සහ තරඟවලින් පිටත පරීක්ෂණ සිදුකිරීමේ අධිකාරී බලය තිබිය යුතු ය.

(4) යෝග්‍යතාවය ලබා නොමැති කාලසීමාවක් ගත කරන යම් ක්‍රීඩකයකු ඇතුළුව එම අධිකාරියේ බලය යටතේ පරීක්ෂා කරනු ලැබිය හැකි ඕනෑම ක්‍රීඩකයකුට ඕනෑම වේලාවක දී ඕනෑම ස්ථානයක දී නියැදියක් ඉදිරිපත් කළ යුතු බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉල්ලා සිටිය හැකි ය.

(5) නීති සංග්‍රහයේ 20.07.10 වන ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති තරඟය ඇතුළත සහ තරඟවලින් පිටත පරීක්ෂණ සිදුකිරීමේ අධිකාරී බලය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු විය යුතු ය.

(6) ජාත්‍යන්තර සම්මේලනයක් හෝ ප්‍රධාන ඉසව් සංවිධානයක් විසින් කෙළින්ම හෝ ජාතික සම්මේලනයක් මාර්ගයෙන් පරීක්ෂණවල යම් කොටසක් සිදු කිරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ පරීක්ෂණවල යම් කොටසක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමඟ ඒ සඳහා ගිවිසුමකට එළඹෙනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, අතිරේක නියැදි එක්රැස් කිරීම හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වියදම් දැරීමට යටත්ව අතිරේක විශ්ලේෂණ වර්ග සිදුකරන ලෙස රසායනාගාරයට විධාන කිරීම හෝ කරනු ලැබිය හැකිය. අතිරේක නියැදි එක්රැස් කරනු ලැබූ හෝ අතිරේක විශ්ලේෂණ වර්ග සිදුකරනු ලැබූ අවස්ථාවක, ඒ පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන ඉසව් සංවිධානයක් වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ඉසව්වක් පැවැත්වෙන කාලසීමාව තුළ ඉසව්ව පැවැත්වෙන ස්ථානවලදී පරීක්ෂණ සිදුකිරීමේ අධිකාරී බලය එක් සංවිධානයකට පමණක් සතු විය යුතුය. ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන ජාත්‍යන්තර ඉසව්වල දී, පරීක්ෂණ සිදුකිරීමේ අධිකාරී බලය පාලක මණ්ඩලය වන්නා වූ ජාත්‍යන්තර සම්මේලනය සතුවිය යුතුය. ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන ජාතික ඉසව්වල දී පරීක්ෂණ කිරීමේ අධිකාරී බලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු විය යුතුය. ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන ජාතික ඉසව්වල දී, ඉසව්වක පාලක මණ්ඩලයේ ඉල්ලීම මත, ඉසව්ව

පැවැත්වෙන කාලසීමාව තුළ ඉසව්ව පැවැත්වෙන ස්ථානවලින් පිටත සිදුකරන යම් පරීක්ෂණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හෝ ඉසව්වේ පාලක මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලැබිය යුතු ය.

(8) අන්‍යාකාරයකින් පරීක්ෂණ සිදුකිරීමට අධිකාරි බලය හිමිවන්නා වූ නමුත් ඉසව්වක දී, පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කිරීමට සහ මෙහෙය වීමට වගකිව යුතු නොවන්නා වූ යම් උත්තේජක මර්දන සංවිධානයක් විසින්, ඉසව්ව පැවැත්වෙන කාලසීමාව තුළ ඉසව්ව පැවැත්වෙන ස්ථානවල දී ක්‍රීඩකයන් පිළිබඳ පරීක්ෂණ සිදුකරනු ලැබීමට කැමැත්ත පළකරනු ලබන අවස්ථාවක, එම උත්තේජක මර්ධන සංවිධානය විසින්, ප්‍රථමයෙන්ම, එම පරීක්ෂණ සිදු කිරීම සහ සම්බන්ධීකරණ කිරීම සඳහා අවසර ලබා ගැනීම සඳහා එම ඉසව්වේ පාලක මණ්ඩලය සමඟ සාකච්ඡා කරනු ලැබිය යුතුය. ඉසව්වේ පාලක මණ්ඩලයේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් උත්තේජක මර්දන සංවිධානය සෑහීමට පත් නොවන අවස්ථාවක උත්තේජක මර්දන සංවිධාය විසින්, පරීක්ෂණ සහ විමර්ශන සිදු කිරීම සඳහා එම පරීක්ෂණ සම්බන්ධීකරණය කළ යුත්තේ කෙසේද යන්න නිශ්චය කිරීම සඳහා ද ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් අවසරය ඉල්ලා සිටිනු ලැබිය හැකිය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ඒ සම්බන්ධයෙන් තරග ඉසව්වේ පාලක මණ්ඩලය වෙත ඒ බව දැන්වීමට පෙර එම පරීක්ෂණ සිදු කිරීම සඳහා අනුමතය ලබාදෙනු නොලැබිය යුතුය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තීරණය ඒ සම්බන්ධයෙන් වන අවසාන තීරණය වන අතර එය අභියාචනා කිරීමට යටත් නොවිය යුතුය. පරීක්ෂණ සිදුකිරීම සඳහා වන බලය ලබා දීමට අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, එකී පරීක්ෂණ තරගවලින් පිටත සිදුකරන පරීක්ෂණ ලෙස සළකනු ලැබිය යුතුය. ඉසව්වේ පාලක මණ්ඩලයේ රීතිවල අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස එකී පරීක්ෂණයක් සඳහා වන ප්‍රතිඵල කළමණාකරණය කිරීම එම පරීක්ෂණ ආරම්භ කරන උත්තේජක මර්දන සංවිධානයේ වගකීම විය යුතු ය.

<u>පරීක්ෂණ පිළිබඳ නියමයන්</u>

24. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, පරීක්ෂණය සහ විමර්ශනය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ නියමකර ඇති පරිදි පරීක්ෂණ විභජන සැලසුම් කිරීම සහ පරීක්ෂණ සිදු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) එසේ කිරීම සාධාරණ ලෙස ශක්‍ය වන අවස්ථාවක සාමූහික පරීක්ෂණ ප්‍රයත්නවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ හෝ අනවශ්‍ය ලෙස නැවත නැවත පරීක්ෂණ සිදුකිරීම වැළැක්වීම ද පිණිස උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන හා කළමනාකරණ පද්ධතිය මගින් පරීක්ෂණ සම්බන්ධීකරණය සිදු කළයුතු ය.

<u>ක්‍රීඩකයන්ගේ වතගෙත පිළිබඳ තොරතුරු</u>

25. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, පරීක්ෂණ සහ වීමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ නිශ්චිතව දක්වෙන ආකාරයෙන් ක්‍රීඩකයන්ගේ වතගොත පිළිබඳ තොරතුරු සැපයීමට නියම කර ඇත්තා වූ ද 45(ආ) වන රීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි 5(ඇ) වන රීතිය උල්ලංඝන කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිඵලවලට යටත් වන්නා වූ ද ක්‍රීඩකයන් සම්බන්ධයෙන් වන ලියාපදිංචි පරීක්ෂණ සංචිතයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එම ක්‍රීඩකයන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ වතගොත පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ජාත්‍යන්තර සම්මේලනය සමඟ සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එහි ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ඇතුළත් ක්‍රීඩකයන් ඔවුන්ගේ නමින් හඳුනාගත හැකි වන්නා වූ ලැයිස්තුවක් උත්තේජක මර්දනය පිළිබඳව පරිපාලන හා කළමනාකරණ පද්ධතිය මගින් ලබා ගැනීමට සලස්වනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ක්‍රීඩකයන් ඇතුළත් කිරීම සඳහා වන නිර්ණායක සමාලෝචනය කර අවශ්‍ය පරිදි එම නිර්ණායක යාවත්කාලීන කරනු ලැබිය යුතු අතර, ලැයිස්තුගත ක්‍රීඩකයන් අදාළ නිර්ණායක අඛණ්ඩව සපුරාලන බවට වගබලා ගැනීම සඳහා එහි ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ ක්‍රීඩක ලැයිස්තුව මාස තුනකට නොඅඩු කාලයකට වරක් කාලානුරූපීව ප්‍රතිශෝධනය කරනු ලැබියුතු ය. ක්‍රීඩකයන් ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ඇතුළත් කිරීමට පෙර සහ ඔවුන් ඒ සංචිතයෙන් ඉවත් කිරීමට පෙර ඒ පිළිබඳ ඔවුන්ට දැනුම් දිය යුතු ය. එකී නිවේදනයේ පරීක්ෂණ සහ විමර්ෂණ සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති තොරතුරු අන්තර්ගත විය යුතු ය.

(3) යම් ක්‍රීඩකයෙකු තම ජාත්‍යන්තර සම්මේලනය විසින් ජාත්‍යන්තර ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ජාතික ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ද ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක ඒ ක්‍රීඩකයාගේ වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම භාර ගන්නේ ඔවුන් අතරින් කවුරුන් ද යන්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ජාත්‍යන්තර සම්මේලනය විසින් එකඟතාවකට එළඹෙනු ලැබිය යුතු අතර, කිසිදු විටක දී ඔවුන්ගෙන් එක් අයකුට වැඩි සංඛ්‍යාවකට එම වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කරන ලෙස යම් ක්‍රීඩකයෙකු නියම කරනු නොලැබිය යුතු ය.

(4) පරීක්ෂණ සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව, ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ සිටින එක් එක් ක්‍රීඩකයා විසින්:-

(අ) ඔහුගේ / ඇයගේ වතගොත පිළිබඳ තොරතුරු ත්‍රෛමාසික පදනමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැන්වීම;

(ආ) එම තොරතුරු සෑම විටම නිරවද්‍ය සහ සම්පූර්ණ ලෙස පවත්වා ගැනීම පිණිස අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම; සහ

(ඇ) එකී එන යන තැන් පිළිබඳ තොරතුරුවල සඳහන් ස්ථානයේ දී ඔහු හෝ ඇය පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීම,

කරනු ලැබිය යුතු ය.

(5) 5 ''ආ'' වන ඇමුණුමේ දක්වා ඇති කොන්දේසි සපුරා ඇති අවස්ථාවක යම් ක්‍රීඩකයකු විසින් 5(ඇ) වන රීතියේ කාර්ය සඳහා පරීක්ෂණ සහ විමර්ශණ සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම, ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ ''ආ'' වන ඇමුණුමේ අර්ථ නිරූපණය කර ඇති පරිදි ඉදිරිපත් කිරීම පැහැරහැරීමක් ලෙස හෝ පරීක්ෂණය මගහැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ සිටින යම් ක්‍රීඩකයෙකු -

(අ) ඔහු හෝ ඇය විශ්‍රාම ගොස් ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ලිඛිත දැන්වීමක් ලබා දීම; හෝ

(ආ) ඔහු හෝ ඇය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ඇතුළත් කිරීම සඳහා වන නිර්ණායක තවදුරටත් සපුරාලනු නොලබන බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඔහුට හෝ ඇයට දැන්වීම,

සිදු කරනු ලබන්නේ නම් මිස එසේ සිදු කරනු ලබන තෙක් පරීක්ෂණ සහ විමර්ෂණ සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමේ වගකීමට දිගටම යටත් විය යුතු ය.

(7) 22 (3) - 22 (6) වන රීතිවල දක්වා ඇති විධිවිධාන පරිදි යම් ක්‍රීඩකයකු පිළිබඳ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා එම ක්‍රීඩකයා ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ සිටින අතරතුර ඔහු විසින් ලබා දෙනු ලබන ඔහුගේ වතගොත පිළිබඳ තොරතුරු වෙත ඒ සඳහා බලය ඇති ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ අනෙකුත් උත්තේජක මර්දන සංවිධානවලට, උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලනය සහ කළමනාකරණ පද්ධතිය හරහා ප්‍රවේශය ලබා ගැනීමට හැකි ය. තව ද, එම තොරතුරු උත්තේජක පාලනය සැලසුම් කිරීමේ දී සම්බන්ධීකරණය කිරීමේ දී හෝ සිදු කිරීමේ දී ක්‍රීඩකයාගේ ජෛව විද්‍යාත්මක ගමන් බලපත්‍රයට හෝ වෙනත් යම් විශ්ලේෂණාත්මක ප්‍රතිඵලවලට අදාළ තොරතුරු සැපයීමේ දී සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු වූ බවට චෝදනා කරමින් ගොනු කර ඇති නඩු කටයුත්තකට සහාය වීමේ කාර්ය සඳහා පමණක් එම තොරතුරු භාවිත කරනු ලැබිය යුතු අතර, මේ කාර්ය සඳහා තවදුරටත් අදාළ නොවන විට දී පෞද්ගලිකත්වය සහ පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව එම තොරතුරු විනාශ කරනු ලැබිය යුතු ය.

(8) පරීක්ෂණ සහ විමර්ශණ සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලියාපදිංචි පරීක්ෂණ සංචිතයට ඇතුළත් ක්‍රීඩකයන්ගේ වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළ නියමයන්ට වඩා දැඩිබවින් අඩු වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ නියමයන්ට යටත් වන ක්‍රීඩකයන් ඇතුළත් වන්නා වූ පරීක්ෂණ සංචිතයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(9) පරීක්ෂණ සංචිතයට ක්‍රීඩකයන් ඇතුලත් කිරීමට පෙර සහ පරීක්ෂණ සංචිතයෙන් ක්‍රීඩකයන් ඉවත් කිරීමට පෙර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඒ පිළිබඳ ක්‍රීඩකයන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය. එම නිවේදනයෙහි 2021 ශ්‍රී ලංකා උත්තේජක මර්දන රීතිවල 25 වන රීතියේ නිශ්චිතව දැක්වෙන වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ නියමයන් සහ අනනුකූලතාවක් සම්බන්ධයෙන් ආදළ වන ප්‍රතිපල ඇතුලත් විය යුතු ය.

(10) පරීක්ෂණ සංචිතයට ඇතුලත් ක්‍රීඩකයන් විසින්, ඔවුන් ස්ථානගතව සිටිය හැකි වන්නා වූ ද පරීක්ෂණවලට භාජනය විය හැකි වන්නා වූ ද පහත දැක්වෙන වතගොත පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත

සපයනු ලැබිය යුතු ය.

(අ) රාත්‍රියෙහි සිටින ස්ථානයේ ලිපිනය;

(ආ) තරඟයේ / තරඟ ඉසව්වේ කාලසටහන; සහ

(ඇ) සාමාන්‍ය පුහුණුවීමේ කටයුතු.

(11) යම් ක්‍රීඩකයෙකු විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරනු ලබන දින හෝ එදිනට පෙර තම වතගොත පිළිබඳ තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ එම ක්‍රීඩකයා විසින් ඔහුගේ වතගොත පිළිබඳ තොරතුරු නිරවද්‍ය ලෙස සැපයීම පැහැර හැරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ක්‍රීඩකයා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ලියාපදිංචි පරීක්ෂණ සංචිතය දක්වා ඉහළ දැමීමට හේතු වන්නේ ය.

(12) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, පරීක්ෂණ සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව, ලියාපදිංචි පරීක්ෂණ සංචිතයකට ඇතුළත් නොවන ක්‍රීඩකයන්ගේ වතගොත පිළිබඳ තොරතුරු එක් රැස් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එසේ කිරීමට තීරණය කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරනු ලබන දින හෝ එදිනට පෙර ඉල්ලා සිටිනු ලැබූ වතගොත පිළිබඳ තොරතුරු සැපයීම යම් ක්‍රීඩකයකු විසින් පැහැර හැරීම හෝ එම ක්‍රීඩකයා විසින් එම වතගොත පිළිබඳ තොරතුරු නිරවද්‍ය ලෙස සැපයීම පැහැර හැරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ක්‍රීඩකයා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලියාපදිංචි පරීක්ෂණ සංචිතය දක්වා ඉහළ දැමීමට හේතු වන්නේ ය.

විශ්‍රාම ගිය ක්‍රීඩකයන් තරඟ කිරීමට නැවත පැමිණීම

26. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ සිටින ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙකු හෝ ජාතික මට්ටමේ ක්‍රීඩකයෙකු විශ්‍රාම ගොස් ඉන්පසු නැවත සක්‍රීය ලෙස ක්‍රීඩාවලට සහභාගීවීමට පැමිණීමට අදහස් කරන අවස්ථාවක, තම ජාත්‍යන්තර සම්මේලනය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත මාස හයක පූර්ව ලිඛිත දැන්වීමක් ලබාදී පරීක්ෂණවලට ඉදිරිපත් වීමට ඔහු හෝ ඇය විසින් ඉඩ සලසනු ලබන තෙක්, එම ක්‍රීඩකයා විසින්, ජාත්‍යන්තර ඉසව් හෝ ජාතික ඉසව් සඳහා තරඟ කරනු නොලැබිය යුතු ය.

(2) මාස හයක ලිඛිත දැන්වීමක් ලබා දීමේ රීතිය දැඩි ලෙස අදාළ කර ගැනීම ක්‍රීඩකයා සම්බන්ධයෙන් අසාධාරණ වන අවස්ථාවක දී ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනය විමසා මාස හයක ලිඛිත දැන්වීමක් ලබාදීමේ රීතිය සඳහා නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. මෙම තීරණයට විරුද්ධව 69 වන රීතියේ සිට 83 වන රීතිය දක්වා වූ රීති යටතේ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) මෙය ජාත්‍යන්තර ඉසව්වක් නැතහොත් ජාතික ඉසව්වක් බව දැන ගැනීමට ඔහුට හෝ ඇයට සාධාරණ හැකියාවක් නොතිබූ බව ක්‍රීඩකයා විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, 26 (1) වන රීතිය උල්ලංඝනය කරමින් ලබාගත් යම් තරඟ ප්‍රතිඵලයක් සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(4) අයෝග්‍යතා කාලසීමාවකට යටත්ව සිටින අතරතුර යම් ක්‍රීඩකයකු ක්‍රීඩාවෙන් විශ්‍රාම ගනු ලබන අවස්ථාවක, එම ක්‍රීඩකයා විසින්, එම විශ්‍රාම ගැනීම පිළිබඳව එම අයෝග්‍යතා කාලසීමාව පනවන ලද උත්තේජක මර්දන සංවිධානය වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ඉන්පසු එම ක්‍රීඩකයා නැවත සක්‍රීය ලෙස තරඟවලට ක්‍රීඩා කිරීමට පැමිණීමට අපේක්ෂා කරන අවස්ථාවක, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ එම ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනය වෙත මාස හයක පූර්ව ලිඛිත දැන්වීමක් හෝ ක්‍රීඩකයා විශ්‍රාම ගිය දින වන විට නොගෙවී ඉතිරිව පවතින අයෝග්‍යතා කාලසීමාව මාස හයකට (6) වැඩි නම්, එම කාලසීමාවට සමාන දැන්වීමක් ලබාදීමෙන් පසු පරීක්ෂණවලට ඉදිරිපත් වීමට ඔහු හෝ ඇය විසින් ඉඩ සලසනු ලබන තෙක්, එම ක්‍රීඩකයා විසින්, ජාත්‍යන්තර ඉසව් හෝ ජාතික ඉසව් සඳහා තරඟ කරනු නොලැබිය යුතු ය.

ස්වාධීන නිරීක්ෂණ වැඩසටහන

27. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ශ්‍රී ලංකාව තුළ ජාතික ඉසව් සංවිධානය කරන යම් සංවිධානයක කමිටු විසින්, එකී ඉසව්වේ දී ස්වාධීන නිරීක්ෂක වැඩසටහනක් පැවැත්වීමට අවසර දී ඒ සඳහා පහසුකම් සලසනු ලැබිය යුතු ය.

<u>නියැදි විශ්ලේෂණය කිරීම</u>

28. (1) පහත දැක්වෙන මූලධර්මවලට අනුකූලව නියැදි විශ්ලේෂණය කරනු ලැබිය යුතු ය.

(අ) 5 වන රීතිය යටතේ කෙලින්ම අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් තහවුරු කිරීමේ කාර්ය සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතීතනය කරන ලද රසායනාගාර හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අන්‍යාකාරයකින් අනුමත කරන ලද රසායනාගාර තුළ දී පමණක් නියැදි විශ්ලේෂණය කරනු ලැබිය යුතු ය. නියැදි විශ්ලේෂණය කිරීම සඳහා භාවිත කරන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතීතනය කරන ලද හෝ උත්තේජක මර්දන නියෝජ්‍යායනය විසින් අනුමත කරන ලද රසායනාගාර පිළිබඳ තීරණය කිරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පමණක් සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම්වලට අදළ කරුණු ඕනෑම විශ්වසනීය මාර්ගයකින් තහවුරු කරනු ලැබිය හැකි ය. මීට උදහරණයක් ලෙස , ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතීතනය කරන ලද හෝ අනුමත කරන ලද රසායනාගාරවලින් පිටත සිදු කරනු ලබන විශ්වසනීය රසායනාගාර පරීක්ෂණ හෝ වෙනත් යම් අධිකරණයක් විසින් සිදුකරන ලද පරීක්ෂණයක් ද ඇතුළත් වේ.

(2) තහනම් ලැයිස්තුවෙන් හඳුනාගෙන ඇති තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම සහ නීති සංග්‍රහයේ 4.5 වන ව්‍යවස්ථාවේ විස්තර කර ඇති අධීක්ෂණ වැඩසටහන ප්‍රකාරව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් ද්‍රව්‍ය හඳුනා ගැනීම, ඩීඑන්ඒ ජීව විද්‍යාත්මක තොරතුරු හෝ ජානමය සැකසීම ඇතුළු ක්‍රීඩකයන්ගේ මුත්‍රා ,රුධිරය හෝ වෙනත් මාධ්‍යයක් සම්බන්ධයෙන් අදාළ වන පරාමිතික සැකසීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහායවීම හෝ වෙනත් යම් නීත්‍යානුකූල උත්තේජක මර්දන කාර්යයක් සඳහා නියැදි සහ අදළ විශ්ලේෂණාත්මක දත්ත හෝ උත්තේජක පාලන තොරතුරු විශ්ලේෂණය කරනු ලැබිය යුතු ය.

(3) නියැදි, අදාළ විශ්ලේෂණාත්මක දත්ත හෝ උත්තේජක පාලන තොරතුරු උත්තේජක මර්දන පර්යේෂණ කාර්ය සඳහා භාවිත කළ හැකි නමුත් ක්‍රීඩකයාගේ ලිඛිත කැමැත්ත නොමැතිව කිසිම නියැදියක් පර්යේෂණ සඳහා භාවිත කරනු නොලැබිය හැකි ය. පර්යේෂණ කාර්ය සඳහා භාවිත කරන නියැදි, අදාළ විශ්ලේෂණාත්මක දත්ත හෝ උත්තේජක පාලන තොරතුරු, නියැදි යම් ක්‍රීඩකයෙකුගේ බව හඳුනා ගැනීමට හැකිවීම වැළැක්වෙන පරිදි යම් ආකාරයකින් පළමුව පිරිසැකසිය යුතුය. නියැදි, අදාළ විශ්ලේෂණාත්මක දත්ත හෝ උත්තේජක පාලන තොරතුරු ඇතුළත් වන යම් පර්යේෂණයක් නීති සංග්‍රහයේ 19 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලධර්මවලට අනුකූල විය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, නීති සංග්‍රහයේ 6.4 වන ව්‍යවස්ථාවට අනුකූලව, රසායනාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට සහ පරීක්ෂණ සහ විමර්ශන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 47 වන ව්‍යවස්ථාවට අනුකූලව නියැදි විශ්ලේෂණය කරන ලෙස රසායනාගාරවලට නියම කරනු ලැබිය යුතු ය.

(5) රසායනාගාර විසින් ස්වකීය මෙහෙයීම සහ වියදම යටතේ හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කරන ලද ඉල්ලීමක් මත හෝ සම්මත නියැදි විශ්ලේෂණ ලේඛනයට ඇතුළත් නොවන තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම සම්බන්ධයෙන් නියැදි විශ්ලේෂණය කරනු ලැබිය හැකි ය. එවැනි යම් විශ්ලේෂණයක ප්‍රතිඵල ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර , ඊට වෙනත් යම් විශ්ලේෂණාත්මක ප්‍රතිඵලයක ඇති වලංගුභාවය සහ ප්‍රතිඵලයම තිබිය යුතු ය.

(6) එකී නියැදිය 5 වැනි රීතියේ සඳහන් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ චෝදනාවක පදනම වන බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයාට දැනුම්දෙනු ලැබූ අවස්ථාවට පෙරාතුව වූ යම් නියැදියක් සම්බන්ධයෙන් නැවත නැවත විශ්ලේෂණය සිදු කිරීම හෝ අතිරේක විශ්ලේෂණයක් සිදුකිරීම සඳහා රසායනාගාරයකට ඇති අධිකාරි බලය සම්බන්ධයෙන් කිසිදු සීමාවක් නොතිබිය යුතු ය. එකී දැනුම්දීමෙන් පසු, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ඒ නියැදිය සම්බන්ධයෙන් අතිරේක විශ්ලේෂණයක් සිදු කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා එම ක්‍රීඩකයාගේ කැමැත්ත සහ නඩු විභාග මණ්ඩලයක අනුමැතිය ඇතිව එසේ සිදු කරනු ලැබිය හැකි ය.

(7) යම් නියැදියක්, රසායනාගාරයක් විසින් සෘණාත්මක යයි නැතහොත් අන්‍යාකාරයකින් උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීමේ චෝදනාවක් මතුවීමේ ප්‍රතිඵලය ගෙන දී නොමැති යයි වාර්තා කරනු ලැබූ අවස්ථාවක නියැදි එක් රැස් කිරීම් ආරම්භකර මෙහෙයවන ලද උත්තේජක මර්දන සංවිධානයේ හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වෙනත් මෙහෙයවීමක් මත පමණක්, ඕනෑම විටක දී, 28(2) වන රීතියේ කාර්යය සඳහා එය ගබඩා කර වැඩිදුර විමර්ශණයට භාජනය කරනු ලැබිය හැකි ය. ක්‍රීඩකයා සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීමේ අධිකාරි බලය ඇත්තා වූ ද ගබඩා කළ නියැදියක් සම්බන්ධයෙන් වැඩිදුර විශ්ලේෂණයක් සිදුකිරීමට අදහස් කරන්නා වූ ද වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයක් විසින්, නියැදිය එක් රැස් කිරීම ආරම්භ කර මෙහෙයවන ලද උත්තේජක මර්දන සංවිධානයේ හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අවසරය ඇතිව එසේ කරනු ලැබිය හැකි අතර, ප්‍රතිඵල කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන

යම් පසු විපරමක් සම්බන්ධයෙන් එය වගකිව යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හෝ වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයක් විසින් ආරම්භ කරන ලද යම් නියැදි ගබඩා කිරීමක් හෝ වැඩිදුර විශ්ලේෂණයක් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ ඒ සංවිධානයේ වියදමින් සිදුකරනු ලැබිය යුතු ය. නියැදි සම්බන්ධයෙන් සිදු කරන වැඩිදුර විශ්ලේෂණ රසායනාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සිදුවිය යුතුය.

(8) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ අධිකාරී බලය ඇති යම් උත්තේජක මර්දන සංවිධානයක සහ /හෝ ( ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ අධිකාරී බලය ඇති උත්තේජක මර්දන සංවිධානයක අනුමතය ඇතිව) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතීතනය කරන ලද රසායනාගාරයක් විසින්, වෙන් කළ නියැදියේ පළමු කොටස ''ඒ'' නියැදි විශ්ලේෂණය සඳහා ද වෙන්කළ නියැදියේ දෙවන කොටස තහවුරු කිරීම සඳහා ද භාවිතා කිරීමේ කාර්යය සඳහා ''ඒ'' හෝ ''බී'' නියැදියක් වෙන් කිරීමට අදහස් කරනු ලබන්නේ නම්, එවිට, රසායනාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

(9) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එහි තනි අභිමතය මත ඕනෑම විටක දී පූර්ව දැන්වීමක් ලබා දී හෝ නොදී, රසායනාගාරයක් හෝ උත්තේජක මර්දන සංවිධානයක් සන්තකයේ ඇති යම් නියැදියක් සහ අදළ විශ්ලේෂණාත්මක දත්ත හෝ තොරතුරු තම භෞතික සන්තකයට ගනු ලැබිය හැකිය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉල්ලීමක් කරනු ලැබූ විටකදී නියැදිය හෝ දත්ත සන්තකයේ ඇති රසායනාගාරය හෝ උත්තේජක මර්දන සංවිධානය විසින්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට එම නියැදිය හෝ දත්ත වෙත ප්‍රවේශ වී එම නියැදි හෝ දත්ත තම සන්තකයට ගැනීමට ඉඩ ලබා දෙනු ලැබිය යුතු ය. නියැදියක් හෝ දත්ත තම සන්තකයට ගැනීමට පෙර ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකී රසායනාගාරය හෝ උත්තේජක මර්දන සංවිධානය වෙත පූර්ව දැන්වීමක් ලබා දී නොමැති අවස්ථාවක, එය විසින් නියැදි හෝ දත්ත තම සන්තකයට ගැනීමෙන් පසු සාධාරණ කාලයක් ඇතුළත, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියැදි හෝ දත්ත ලබාගෙන ඇත්තේ යම් රසායනාගාරයකින්ද නැතහොත් උත්තේජක මර්දන සංවිධානයකින් ද එම රසායනාගාරය සහ එම එක් එක් උත්තේජක මර්දන සංවිධානය වෙත එකී දැන්වීම ලබා දෙනු ලැබිය යුතු ය. තහනමට ගන්නා ලද නියැදියක් හෝ දත්ත විශ්ලේෂණය කර ඒ සම්බන්ධයෙන් යම් විමර්ශණයක් සිදු කිරීමෙන් පසු ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව අනාවරණය වුවහොත්, නියැදිය හෝ දත්ත සම්බන්ධයෙන් ප්‍රතිඵල කළමණාකරණය කිරීමේ වගකීම දරන ලෙස ක්‍රීඩකයා සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීමේ අධිකාරී බලය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයකට විධාන කරනු ලැබිය හැකි ය.

<u>ප්‍රතිඵල කළමනාකරණය: වගකීම, ආරම්භක සමාලෝචනය, දැන්වීම සහ තාවකාලික අත්හිටුවීම්</u>

29\. (1) 28(7) වන, 28(9) වන රීතියේ සහ නීති සංග්‍රහයේ 7.1 වන ව්‍යවස්ථාවේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ප්‍රතිඵල කළමණාකරණය කිරීම, නියැදි එක්රැස් කිරීම, ආරම්භ කර මෙහෙය වීම, උත්තේජක මර්දන සංවිධානයේ වගකීම විය යුතු අතර, එය නියැදි එක්රැස් කිරීම ආරම්භ කර මෙහෙයවන ලද උත්තේජක මර්දන සංවිධානයේ කාර්ය පටිපාටිමය රීති මගින් පාලනය විය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ රීති මගින් ඒ රටේ පුරවැසියකු නේවාසිකයෙකු, ඒ රටේ ක්‍රීඩා සංවිධානයක බලපත්‍ර දරන්නෙකු හෝ සාමාජිකයෙකු නොවන්නා වූ ක්‍රීඩකයෙකු හෝ වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන අධිකාරී බලය ජාතික උත්තේජක මර්දන සංවිධානයට ලබා නොදෙන නැතහොත් ජාතික උත්තේජක මර්දන සංවිධානය විසින් එම අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවල දී ප්‍රතිඵල කළමනාකරණය කිරීම අදළ ජාත්‍යන්තර සම්මේලනය විසින් හෝ අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ රීති මගින් නියම කරනු ලබන පරිදි ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සම්බන්ධයෙන් අධිකාරී බලය ඇති තුන්වන පාර්ශ්වයක් විසින් සිදු කරනු ලැබිය යුතුය.

(3) සිදුව ඇතැයි කියනු ලබන වතගොත පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හැරීමකට (වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හැරීම හෝ පරීක්ෂණය මග හැරීම ) අදාළ ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රශ්නගත ක්‍රීඩකයා විසින් වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් ජාත්‍යන්තර සම්මේලනයක් හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ද එම ජාත්‍යන්තර සම්මේලනය හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හැරීමක් හෝ පරීක්ෂණය මගහැරීමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන විසින් තීරණයක් ලබා දෙනු ලබන අවස්ථාවක, එය විසින්, ඒ තොරතුරු උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලනය හා කළමනාකරණ පද්ධතිය මාර්ගයෙන් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එහිදී එම තොරතුරු අනෙකුත් අදාළ උත්තේජක මර්දන සංවිධානවලට ලබා ගැනීමට සැලැස්වෙන්නේ ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වගකීමක් දැරිය යුතු එහි අධිකාරී බලය යටතේ වන ක්‍රීඩකයන් සහ අනෙකුත් තැනැත්තන් සම්බන්ධයෙන් වන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම්වලට අදළ ප්‍රතිඵල කළමනාකරණය

සිදු කළ යුතු අනෙකුත් අවස්ථාවන් නීති සංග්‍රහයේ 7 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සහ ඊට අනුකූලව තීරණය කරනු ලැබිය යුතු ය.

(5) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, නිශ්චිත අවස්ථාවන්වලදී ප්‍රතිඵලය කළමනාකරණය සිදු කරන ලෙස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත විධාන කරනු ලැබිය හැකි ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරන ලද සාධාරණ කාලසීමාවක් ඇතුළත ප්‍රතිඵල කළමනාකරණය සිදු කිරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රතික්ෂේප කිරීම අනනුකූල ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙනුවෙන් ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ වගකීම ගන්නා ලෙස හා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එසේ කිරීමට කැමති, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සම්බන්ධයෙන් අධිකාරි බලය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයකට හෝ එවැනි කිසිදු උත්තේජක මර්දන සංවිධානයක් නොමැති නම්, එසේ කිරීමට කැමති වෙනත් යම් උත්තේජන මර්දන සංවිධානයකට එසේ විධාන කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ප්‍රතිඵල කළමනාකරණය සිදු කිරීමේ වියදම් සහ නීතිඥ ගාස්තු ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නම් කරන ලද අනෙකුත් උත්තේජක මර්දන සංවිධානය වෙත ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු අතර, වියදම් සහ නීතිඥ ගාස්තු ප්‍රතිපූරණය කිරීම පැහැර හැරීම අනනුකූල ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සහ දැනුම් දීම.

30. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සහ දැනුම් දීම සිදු කරනු ලැබිය යුතු ය.

පූර්ව උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම හඳුනා ගැනීම.

31. සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට දැන්වීමක් ලබාදීමට පෙර, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එම දැන්වීම උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන සහ කළමනාකරණ පද්ධතිය වෙත යොමු කර යම් පූර්ව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පවතින්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ අනෙකුත් අදාළ උත්තේජක මර්දන සංවිධාන සම්බන්ධ කර ගනු ලැබිය යුතු ය.

තාවකාලික අත්හිටුවීම

32. (1) නිශ්චිත ද්‍රව්‍යයක් හෝ නිශ්චිත ක්‍රමයක් නොවන තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් සම්බන්ධයෙන් වන අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් හෝ (අහිතකර ගමන් බලපත්‍ර තීරණ සමාලෝචන ක්‍රියාවලිය අවසන් වීමෙන් පසු) අහිතකර ගමන් බලපත්‍ර තීරණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ලැබුණු අවස්ථාවක, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, 29 වන රීතියෙන් නියම කර ඇති සමාලෝචනය සහ දැනුම්දීම සිදු කළ විට දී හෝ සිදු කළ පසු ක්‍රීඩකයා සම්බන්ධයෙන් වහාම තාවකාලික අත්හිටුවීමක් පනවනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන අවස්ථාවල අනිවාර්ය තාවකාලික අත්හිටුවීමක් ඉවත් කරනු ලැබිය හැකි ය.

(i) උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් දූෂිත නිෂ්පාදනයක් ඇතුළත්ව තිබීමට ඉඩ ඇති බව ක්‍රීඩකයා විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලයට පෙන්නුම් කිරීම; හෝ

(ii) උල්ලංඝනය කිරීමට අනිසි ලෙස භාවිත කිරීමේ ද්‍රව්‍යයක් ඇතුළත්ව තිබීම සහ ක්‍රීඩකයා විසින් තමා 45(3) (අ) රීතිය යටතේ වන අඩු කරන ලද අයෝග්‍යතා කාලසීමාවක් සඳහා හිමිකම් ලබන බව ඔප්පු කිරීම.

(3) දූෂිත නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ක්‍රීඩකයා විසින් කරන ලද ප්‍රකාශය හේතුවෙන් අනිවාර්ය තාවකාලික අත්හිටුවීමක් ඉවත් නොකිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයාගේ 'බී' නියැදිය විශ්ලේෂණය කිරීමට හෝ 38 වන රීතියේ විස්තර කර ඇති පරිදි අවසාන නඩු විභාගය පැවැත්වීමට පෙරාතුව 32(1) වන රීතියෙන් ආවරණය නොවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් තාවකාලික, අත්හිටුවීමක් පනවනු ලැබිය හැකි ය.

(5) ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, 38 වන රීතියේ සිට 42 වන රීතිය දක්වා රීති යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලයේ තීරණය ලබාදීමට පෙරාතුව වූ ඕනෑම විටක දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභිමතය පරිදි වෛකල්පීය තාවකාලික අත්හිටුවීමක් ඉවත් කරනු ලැබිය හැකි ය.

<u>නඩු විභාගයක් හෝ අභියාචනයක් සඳහා වන අවස්ථාව</u>

33. (1) 32(1) වන රීතියේ සිට 32(5) වන රීතිය දක්වා වන රීතිවල කුමක් සඳහන් වුව ද, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා වෙත -

(අ) තාවකාලික අත්හිටුවීම පැනවීමට පෙර හෝ තාවකාලික අත්හිටුවීම පැනවීමෙන් පසු කාලානුරූපීව තාවකාලික නඩු විභාගයක් සඳහා අවස්ථාවක් ලබා දී ඇත්නම්; හෝ

(ආ) තාවකාලික අත්හිටුවීම පැනවීමෙන් පසු කාලානුරූපීව 38 වන රීතියට අනුකූලව කඩිනම් නඩු විභාගයක් සඳහා අවස්ථාවක් ලබා දී ඇත්නම්, මිස තාවකාලික අත්හිටුවීමක් පනවනු නොලැබිය හැකි ය.

(2) තාවකාලික අත්හිටුවීමක් පැනවීමක් හෝ තාවකාලික අත්හිටුවීමක් නොපැනවීම සම්බන්ධයෙන් වන තීරණයකට විරුද්ධව 69 වන රීතියට අනුකූලව කඩිනම් නඩු කටයුත්තක දී අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

<u>තාවකාලික අත්හිටුවීම ස්වේච්ඡාවෙන් භාර ගැනීම</u>

34 (1) (i)'බී' නියැදියේ (හෝ 'බී' නියැදිය අත්හැරීමේ) වාර්තාව ලැබුණු දින සිට දින දහයක් (10) නැතහොත් වෙනත් යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳ දැන්වීම ලැබුණු දින සිට දින දහයක් (10) අවසන් වන දිනට; හෝ

(ii) එම වාර්තාව හෝ දැන්වීම ලැබුණු පසු ක්‍රීඩකයා විසින් පළමුවරට තරඟ කරන දිනට,

පෙරාතුව හෝ ඉන්පසු එසේ කරනු ලබන්නේ නම්, ක්‍රීඩකයන් විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ තාවකාලික අත්හිටුවීමක් ස්වේච්ඡාවෙන් භාර ගනු ලැබිය හැකි ය.

(2) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳ දැන්වීම ලැබුණු දින සිට දින දහයක් (10) ඇතුළත එසේ කරනු ලබන්නේ නම්, අනෙක් තැනැත්තන් විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ තාවකාලික අත්හිටුවීමක් ස්වේච්ඡාවෙන් භාර ගනු ලැබිය හැකි ය.

(3) එකී තාවකාලික අත්හිටුවීම එසේ ස්වේච්ඡාවෙන් භාරගනු ලැබූ විට දී, 32(1) වන සහ 32(2) වන රීතිය යටතේ පනවනු ලැබූ සේ පූර්ණ වශයෙන් බලාත්මක විය යුතු වන අතර, එම ආකාරයෙන්ම ඒ සම්බන්ධයෙන් සලකනු ලැබිය යුතු ය.

එසේ වුවද, තාවකාලික අත්හිටුවීමක් ස්වේච්ඡාවෙන් භාර ගැනීමෙන් පසු ඕනෑම විටක දී ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් එම භාර ගැනීම ඉවත් කරගනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී එම තාවකාලික අත්හිටුවීම පවතින අතරතුර කලින් ගත කරන ලද කාලය සඳහා එම ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට යම් ලකුණක් හිමි නොවන්නේ ය.

(4) ඒ නියැදි සම්බන්ධයෙන් වන අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් මත පදනම්ව තාවකාලික අත්හිටුවීම පනවනු ලැබ ඇත්තාවූ ද (ක්‍රීඩකයා හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉල්ලා ඇත්නම්) පසුව කරන ලද 'බී' නියැදි විශ්ලේෂණයකින් එම 'ඒ' නියැදි විශ්ලේෂණය තහවුරු නොකරන්නාවූ ද අවස්ථාවක, 3 වන රීතිය උල්ලංඝනය කිරීමක් හේතුවෙන් එම ක්‍රීඩකයා යම් වැඩිදුර තාවකාලික අත්හිටුවීමකට යටත් කරනු නොලැබිය යුතුය. 5 වන රීතිය උල්ලංඝනය කිරීමක් හේතුවෙන් ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම යම් ඉසව්වකින් ඉවත් කර ඇත්තාවූ ද පසුව කරන ලද 'බී' නියැදි විශ්ලේෂණයෙන් 'ඒ' නියැදි තීරණය තහවුරු නොකරන්නා වූ ද අවස්ථාවක, අන්‍යාකාරයකින් එම ඉසව්වට බලපෑමක් සිදුවීමෙන් තොරව, ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම නැවත එම ඉසව්වට ඇතුළත් කළ හැකි නම්, එම ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම විසින් එම ඉසව්ව සඳහා දිගටම සහභාගී වනු ලැබිය හැකි ය.

<u>ප්‍රතිඵල කළමනාකරණ තීරණ</u>

35. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කරනු ලබන ප්‍රතිඵල කළමනාකරණ තීරණ හෝ විනිශ්චයන් යම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයකට හෝ ක්‍රීඩාවකට සීමාවීමට අදහස් නොවන අතර, සීමාවකින් තොරව, එමගින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ තීරණය කිරීම සිදුවන්නේ ය.

(i) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදුව ඇත් ද නැතහොත් තාවකාලික අත්හිටුවීමක් පනවනු ලැබිය යුතුද යන්න, එම තීරණය සඳහා වන කරුණු පිළිබඳ වූ පදනම සහ උල්ලංඝනය කර ඇති නිශ්චිත ව්‍යවස්ථා ;සහ

(ii) 43 වන රීතිය සහ 55 වන රීතිය යටතේ වන අදාළ නුසුදුසු යයි නියම කිරීම්, යම් පදක්කම් හෝ තෑගි අහිමි කිරීමක් යම් අයෝග්‍යතා කාලසීමාව (සහ එම කාලසීමාව ආරම්භ වන දිනය) සහ යම් මූල්‍ය ප්‍රතිඵල ඇතුළු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමෙන් හෝ උල්ලංඝනය කිරීම්වලින් ඇතිවන ප්‍රතිඵල.

<u>ප්‍රතිඵල කළමනාකරණ තීරණ පිළිබඳ දැනුම්දීම</u>

36. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, 84 වන රීතියේ සහ ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිඵල කළමනාකරණ තීරණ පිළිබඳව ක්‍රීඩකයන්, වෙනත් තැනැත්තන්, අත්සන්කරුවන් සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

<u>ක්‍රීඩාවෙන් විශ්‍රාම යාම</u>

37. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලිය සිදු කරන අතරතුර යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විශ්‍රාම යනු ලැබූ අවස්ථාවක, එහි ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ අධිකාරී බලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන සතු විය යුතු ය. යම් ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට පෙර යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විශ්‍රාම යනු ලැබුවා වූ ද එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කරන ලද අවස්ථාවේ දී එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සම්බන්ධයෙන් වන ප්‍රතිඵල කළමනාකරණය පිළිබඳ අධිකාරී බලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු වන්නා වූ ද අවස්ථාවක, ඒ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිඵල කළමනාකරණය සිදු කිරීමේ අධිකාරී බලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු විය යුතු ය.

<u>ප්‍රතිඵල කළමනාකරණය: සාධාරණ නඩු විභාගයක් සඳහා වන අයිතිය සහ නඩු විභාගයේ තීරණය පිළිබඳ දැන්වීම</u>

38. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නීති සංග්‍රහයට සහ ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව, සාධාරණ, අපක්ෂපාතී සහ මෙහෙයුම් වශයෙන් ස්වාධීන නඩු විභාග මූල මණ්ඩලයක් මගින්, සාධාරණ කාලයක් ඇතුළත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බවට ප්‍රකාශ කරන ලද යම් තැනැත්තකු වෙත සාධාරණ නඩු විභාගයක් ලබා දෙනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, මේ උත්තේජක මර්දන රීතිවලට යටත් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදුකර ඇත් ද යන්න සම්බන්ධයෙන් විභාග කර තීරණය කිරීම ද, අදාළ වේ නම් ඒ සම්බන්ධයෙන් යම් අදාළ ප්‍රතිඵල පැනවීම ද සඳහා අධිකරණ බලය ඇති නඩු විභාග මූල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය, සම්බන්ධතා පිළිබඳ ගැටුම්වලින් තොර බවට ද එහි සංයුතිය, ධුර කාලය, වෘත්තිය පළපුරුද්ද, මෙහෙයුම්මය ස්වාධීනත්වය සහ ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ නියමයන්ට අනුකූල වන බවට ද වගබලා ගනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ එහි මණ්ඩලවල මණ්ඩල සාමාජිකයන්, කාර්ය මණ්ඩල සාමාජිකයන්, කොමිෂන් සභා සාමාජිකයන්, උපදේශකවරුන් සහ නිලධරයන් මෙන්ම එම කරුණ සම්බන්ධයෙන් වන විමර්ශනයට සහ පූර්ව-විනිශ්චයට සම්බන්ධ යම් තැනැත්තකු ද, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලයේ සාමාජිකයන් සහ/හෝ (එම ලිපිකරු විචාරණ ක්‍රියාවලියට සහ/හෝ යම් තීරණයක් කෙටුම්පත් කිරීමට සම්බන්ධ තාක් දුරට) ලිපිකරුවන් ලෙස පත් කරනු නොලැබිය හැකි ය. එකී කිසිදු සාමාජිකයකු මින් පෙර එකී නඩුවේ දී යම් ඉල්ලීමක්, ප්‍රතිඵල කළමනාකරණ තීරණයක් හෝ අභියාචනා සලකා බලා නොතිබිය යුතු ය.

(5) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය ස්වාධීන සභාපතිවරයකුගෙන් ද වෙනත් ස්වාධීන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද සමන්විත විය යුතු ය.

(6) එක් එක් සාමාජිකයා ඔවුන්ගේ නීති, ක්‍රීඩා, වෛද්‍ය සහ/හෝ විද්‍යාත්මක විශේෂඥතාව ඇතුළු ඔවුන් සතුව ඇති උත්තේජක මර්දන පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් පත් කරනු ලැබිය යුතු ය. එක් එක් සාමාජිකයා එක් වරක් අලුත් කළ හැකි වසර තුනක (3) කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(7) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ

හෝ වෙනත් තුන්වන පාර්ශ්වයක මැදිහත්වීමෙන් තොරව එහි නඩු විභාග කිරීමේ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීමට හැකි තත්ත්වයක සිටිය යුතු ය.

<u>නඩු විභාග කිරීමේ ක්‍රියාවලිය</u>

39. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, සිදුව ඇතැයි කියනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ක්‍රීඩකයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට දැනුම් දෙමින් දැන්වීමක් යවනු ලැබූ ද එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් 41(1) වන රීතියට හෝ 41(2) වන රීතියට අනුකූලව නඩු විභාගයක් සිදු කිරීම අත්හරිනු නොලැබූ ද අවස්ථාවක, එම නඩු විභාග කිරීම සහ විනිශ්චය කිරීම සඳහා එම නඩුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 8 වන සහ 9 වන ව්‍යවස්ථාවල විස්තර කර ඇති මූලධර්මවලට අනුකූලව එය පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින්, එම නඩුව විභාග කිරීම සඳහා සාමාජිකයන් තිදෙනෙකු (3) සභාපතිවරයා ද ඇතුළුව පත් කරනු ලැබිය යුතු ය. ඉන්පසු එක් (1) මූල මණ්ඩල සාමාජිකයකු වසර තුනකට (3) නොඅඩු නීතිය පිළිබඳ පළපුරුද්දක් ඇති සුදුසුකම්ලත් නීතිඥවරයකු විය යුතු අතර, තවත් එක් මූල මණ්ඩල සාමාජිකයකු වසර තුනකට (3) නොඅඩු අදාළ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පළපුරුද්ද ඇති සුදුසුකම්ලත් වෛද්‍යවරයකු විය යුතු ය.

(3) සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස යම් සාමාජිකයකු පත් කරනු ලැබූ විට, එම එක් එක් සාමාජිකයා විසින්, අත්සන් කරන ලද ප්‍රකාශනයේ හෙළිදරව් කරන ලද අවස්ථානුගත කරුණු හැර ඔහු හෝ ඇයගේ දැනීමට අනුව, යම් පාර්ශ්වයකට අනුව ඔහුගේ හෝ ඇයගේ අපක්ෂපාතීත්වය අභියෝගයට ලක් කළ හැකි වෙනත් කිසිදු කරුණු හෝ අවස්ථානුගත කරුණු නොමැති බවට වූ ප්‍රකාශනයකට ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය විසින් අවසර දෙනු ලැබූ අවස්ථාවක, මේ උත්තේජක මර්දන රීතිවලට යටත් ක්‍රීඩකයන් සහ වෙනත් තැනැත්තන් සම්බන්ධයෙන් ඉසව්වලට අදාළව පවත්වනු ලබන නඩු විභාග කඩිනම් නඩු කටයුත්තක් මගින් පවත්වනු ලැබිය හැකි ය.

(5) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය සහ ක්‍රීඩකයන්ගේ හෝ අනෙක් තැනැත්තන්ගේ ජාතික සම්මේලනය විසින් නිරීක්ෂකයන් ලෙස නඩු විභාගයට සහභාගි වනු ලැබිය හැකි ය. එවැනි කවර හෝ විටක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් විභාග වෙමින් පවතින නඩුවල තත්ත්වය සහ සියලු නඩු විභාගවල ප්‍රතිඵල පිළිබඳ ඔවුන් පූර්ණ ලෙස දැනුවත් කරනු ලැබිය යුතු ය.

<u>තීරණ පිළිබඳ දැන්වීම</u>

40. (1) නඩු විභාගය අවසානයේ දී හෝ ඉන් ඉක්බිතිවම, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල මණ්ඩලය විසින්, ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 9 වන ව්‍යවස්ථාවට අනුකූල වන්නා වූ ද එම තීරණය සඳහා වූ සම්පූර්ණ හේතු පනවන ලද අයෝග්‍යතා කාලසීමාව 55 වන රීතිය යටතේ ප්‍රතිඵල නුසුදුසු යයි නියම කිරීම සහ අදාළ වේ නම්, නියම කළ හැකි ඉහළම ප්‍රතිඵල නියම නොකළේ මන්ද යන්න පිළිබඳ වන සාධාරණීකරණයක් ඇතුළත් වන්නා වූ ලිඛිත තීරණයක් ලබා දෙනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සහ 74 වන රීතිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධාන වෙත ඒ තීරණය දැනුම් දී එය වහාම උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන හා කළමනාකරණ පද්ධතිය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. 69 වන රීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි එම තීරණයට විරුද්ධ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

<u>නඩු විභාගය පැවැත්වීම අත්හැර දැමීම</u>

41. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ප්‍රකාශ කර ඇත්තේ යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකුට විරුද්ධව ද එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් නඩු විභාගයක් පැවැත්වීම ප්‍රකාශිතව අත්හැර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් යෝජනා කරන ලද ප්‍රතිඵල හා එකඟ වනු ලැබිය හැකි ය.

(2) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ප්‍රකාශ කර ඇත්තේ යම් ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට විරුද්ධව ද එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් දින පහළොවක් (15) හෝ එම උල්ලංඝනය කිරීම ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් යවන ලද දැන්වීමේ අන්‍යාකාරයකින් නියම කර ඇති කාලසීමාව ඇතුළත

එම ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් විවාද කිරීම පැහැර හරිනු ලැබ ඇත්නම්, එවිට, ඔවුන් විසින් නඩු විභාගයක් පැවැත්වීම අතහැර ඇති ලෙස, එම උල්ලංඝනය සිදු කිරීම පිළිගෙන ඇති ලෙස සහ යෝජිත ප්‍රතිඵල පිළිගෙන ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

(3) 40 (1) වන රීතිය සහ 40 (2) වන රීතිය අදාළ වන අවස්ථාවල දී, එම නඩු විභාගය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නඩු විභාග මූල මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වීම අවශ්‍ය නොවන්නේ ය. ඒ වෙනුවට, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 9 වන ව්‍යවස්ථාවට අනුකූල වන්නා වූ ද එම තීරණය සඳහා වූ සම්පූර්ණ හේතු, පනවන ලද අයෝග්‍යතා කාලසීමාව, 55 වන රීතිය යටතේ ප්‍රතිඵල නුසුදුසු යි නියම කිරීම සහ අදාළ වේ නම්, නියම කළ හැකි ඉහළම ප්‍රතිඵල නියම නොකළේ මන්ද යන්න පිළිබඳව වන සාධාරණීකරණයක් ඇතුළත් වන්නා වූ ද ලිඛිත තීරණයක් වහාම ලබා දෙනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තකුට සහ 74 වන රීතිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයක් වෙත එම තීරණය දැනුම් දී වහාම එය උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන හා කළමනාකරණ පද්ධතිය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 86(2) වන රීතියට අනුකූලව එම තීරණය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

<u>ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය ඉදිරියෙහි පවත්වන තනි නඩු විභාගය</u>

42. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන්, ජාතික මට්ටමේ ක්‍රීඩකයන් හෝ වෙනත් තැනැත්තන්ට විරුද්ධව ප්‍රකාශ කර ඇති උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් එම ක්‍රීඩකයාගේ, අනෙක් තැනැත්තාගේ හෝ (29 වන රීතියේ සිට 36 වන රීතිය දක්වා වන රීතිය දක්වා රීතිවලට අනුකූලව ඊට ප්‍රතිඵල කළමනාකරණ වගකීම ඇති විට දී) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කැමැත්ත ඇතිව ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයෙහි දී කෙලින්ම පවත්වන තනි නඩු විභාගයක දී විභාග කරනු ලැබිය හැකි ය.

<u>කේවල ප්‍රතිඵල ස්වයංක්‍රීයව නුසුදුසුභාවයට පත්වීම</u>

43. තරගයක් තුළ දී සිදු කරන ලද පරීක්ෂණයකට සම්බන්ධ කේවල ක්‍රීඩාවක දී සිදු කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පදක්කම්, ලකුණු සහ තෑගි අහිමි කිරීම ඇතුළුව ඉන් ඇති වූ සියලු ප්‍රතිඵල ද සමඟ ඒ තරගයේ දී ලබාගත් ප්‍රතිඵල ස්වයංක්‍රීයව නුසුදුසුභාවයකට පත් කිරීමට හේතු වන්නේ ය.

<u>තැනැත්තන් සම්බන්ධයෙන් වන සම්බාධක</u>

**යම් ඉසව්වක් අතරතුර දී උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් සිදුවීමෙන්, එම ඉසව්වේ ප්‍රතිඵල නුසුදුසුභාවයට පත්වීම**

44. (1) 44 (2) වන රීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මිස, ඉසව්වක් අතරතුර දී හෝ ඉසව්වකට අදාළව සිදු වූ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක දී, එම ඉසව්වේ පාලක මණ්ඩලයේ තීරණය මත සියලු පදක්කම්, ලකුණු සහ තෑගි අහිමි කිරීම ඇතුළු සියලු ප්‍රතිඵල ද සමඟ ඒ ඉසව්වේ දී එම ක්‍රීඩකයා විසින් ලබාගත් කේවල ප්‍රතිඵල සියල්ල නුසුදුසුභාවයට පත් වන්නේ ය.

(2) එම උල්ලංඝනය කිරීමට ඔහු හෝ ඇයගේ කිසිදු වරදක් හෝ නොසැලකිල්ලක් හේතු නොවූ බව ක්‍රීඩකයා විසින් තහවුරු කරනු ලැබුවහොත්, එම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදුවූ තරඟය හැර වෙනත් තරඟවල දී එම ක්‍රීඩකයා විසින් ලබාගත් ප්‍රතිඵල සඳහා ක්‍රීඩකයා විසින් සිදු කළ එම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමෙන් බලපෑමක් සිදුව තිබීමට ඉඩ ඇත්නම් මිස, එවැනි වෙනත් තරඟවල දී ක්‍රීඩකයා විසින් ලබාගත් කේවල ප්‍රතිඵල නුසුදුසු යැයි නියම කරනු ලැබිය යුතු ය.

<u>තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් තිබීම, භාවිත කිරීම හෝ භාවිත කිරීමට උත්සාහ කිරීම හෝ සන්තකයේ තබා ගැනීම සඳහා වන අයෝග්‍යතාව</u>

45. (1) (අ) යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම හිතාමතා කරන ලද්දක් නොවන බව ඔහු විසින් තහවුරු කරනු ලැබිය හැකි නම් මිස, උත්තේජක මර්දන රීති උල්ලංඝනය, නිශ්චිත ද්‍රව්‍යයක් හෝ නිශ්චිත ක්‍රමයක් හා සම්බන්ධ නොවන අවස්ථාවක; හෝ

(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය, නිශ්චිත ද්‍රව්‍යයක් හෝ නිශ්චිත ක්‍රමයක් හා සම්බන්ධ වන අවස්ථාවක සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එය හිතාමතා කරන ලද්දක් බව තහවුරු කළ හැකි අවස්ථාවක,

45(3) වන රීතියට යටත්ව, අයෝග්‍යතා කාලසීමාව අවුරුදු හතරක් (4) විය යුතු ය.

(2) 45(1) වන රීතිය අදාළ නොවන්නේ නම්, 45(3)(අ) වන රීතියට යටත්ව, අයෝග්‍යතා කාලසීමාව අවුරුදු දෙකක් (2) විය යුතු ය.

(3) 44 වන රීතියේ වෙනත් යම් විධිවිධානයක් නොතකා, උත්තේජක මර්දන රීති උල්ලංඝනය, යම් අයථා භාවිතයක් හා සම්බන්ධ වන අවස්ථාවක-

(අ) යම් ක්‍රීඩකයකු විසින් යම් අන්තර්ග්‍රහණයක් හෝ භාවිතයක් තරගයෙන් පිටත දී සිදු වූ බව සහ ක්‍රීඩා කටයුත්තකට සම්බන්ධ නොවන බව තහවුරු කළ හැකි නම්, එවිට අයෝග්‍යතා කාලසීමාව මාස තුනක් (3) විය යුතු ය. ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත අයථා භාවිතය හා සම්බන්ධ ප්‍රතිකාර වැඩසටහනක් සතුටුදායක ලෙස අවසන් කරනු ලබන්නේ නම්, 45(3)(අ) රීතිය යටතේ ගණනය කරන ලද අයෝග්‍යතා කාලසීමාව මසක් (1) දක්වා අඩු කළ හැකිය. 45(3)(අ) වන රීතියේ පිහිටුවන ලද අයෝග්‍යතා කාලසීමාව, 48 වන රීතියේ යම් විධිවිධානයකට අනුව යම් අඩු කිරීමකට යටත් නොවිය යුතු ය; සහ

(ආ) අන්තර්ග්‍රහණය, භාවිතය හෝ සන්තකයේ තබා ගැනීම තරගය ඇතුළත දී සිදුවූයේ නම්, සහ අන්තර්ග්‍රහණය කළ, භාවිත කළ හෝ සන්තකයේ තබාගත් අවස්ථාව ක්‍රීඩා කටයුත්තකට සම්බන්ධ නොවූ බව ක්‍රීඩකයා විසින් තහවුරු කළ හැකි නම්, එවිට, 45(1) වන රීතියේ කාර්ය සඳහා එකී අන්තර්ග්‍රහණය, භාවිතය හෝ සන්තකයේ තබා ගැනීම චේතාන්විත ක්‍රියාවක් යැයි සලකනු නොලැබිය යුතු අතර 47 වන රීතිය යටතේ බරපතළ කරුණු සොයාගැනීම සඳහා වන පදනමක් සපයා නොදිය යුතු ය.

<u>උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් සම්බන්ධ නුසුදුසුකම්</u>

46. (1) 49 වන රීතිය හෝ 51 වන රීතිය අදාළ වේ නම්, 45 වන රීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට මිස, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වූ අයෝග්‍යතා කාලසීමාව පහත දැක්වෙන පරිදි වේ:-

(අ) (i) නියැදි එකතු කර ගැනීම ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී හැර, 5(ඇ) වන හෝ 5(ඉ) වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අයෝග්‍යතා කාලසීමාව අවුරුදු 4ක් විය යුතු අතර, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම චේතාන්විත ක්‍රියාවක් නොවන බවට තහවුරු කිරීමට ක්‍රීඩකයාට හැකි වුවහොත්, අයෝග්‍යතා කාලසීමාව අවුරුදු දෙකක් (02) විය යුතු ය;

(ii) වෙනත් සියලු අවස්ථාවල දී, අයෝග්‍යතා කාලසීමාව අඩු කිරීමක් පිළිබඳ සාධාරණීකරණය කරනු ලබන ව්‍යතිරේඛ අවස්ථානුගත කරුණු තහවුරු කිරීමට ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු සමත් වන අවස්ථාවක දී, ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තාගේ වරදේ ස්වභාවය මත රඳාපවතිමින් අයෝග්‍යතා කාලසීමාව අවුරුදු දෙකේ (2) සිට අවුරුදු හතරක (4) කාල පරාසයක පැවතිය යුතු ය;

(iii) ආරක්ෂිත තැනත්තකු හෝ විනෝද ක්‍රීඩා ක්‍රීඩකයකු සම්බන්ධ වන අවස්ථාවක දී, අයෝග්‍යතා කාලසීමාව, එම ආරක්ෂිත තැනැත්තාගේ හෝ විනෝද ක්‍රීඩා ක්‍රීඩකයාගේ වරදේ ස්වභාවය මත රඳාපවතිමින්, උපරිම වශයෙන් අවුරුදු දෙකක් (02) සහ අවම වශයෙන් අවවාද කිරීමක් සහ කිසිදු අයෝග්‍යතා කාලසීමාවක් නොමැතිවීමේ පරාසයක් අතර පැවතිය යුතු ය.

(ආ) 5(ඇ) වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ක්‍රීඩකයාගේ වරදේ ස්වභාවය අනුව රඳා පවතිමින්, අයෝග්‍යතා පිළිබඳ කාල සීමාව අවම වශයෙන් එක් අවුරුද්දක (01) අඩු කිරීමකට යටත්ව අවුරුදු දෙකක (02) කාලසීමාවක් විය යුතු ය. අවසාන අවස්ථාවේ දී ක්‍රීඩකයාගේ වතගොත පිළිබඳ තොරතුරු වෙනස් කිරීම මගින් හෝ වෙනත් ක්‍රියාකලාපයක් මගින් පරීක්ෂණ සඳහා සහභාගී වීම ක්‍රීඩකයා විසින් මගහැරීමට උත්සාහ දරන බවට බරපතළ සැකයක් ඇතිවන අවස්ථාවක දී, මෙම වගන්තියේ සඳහන් අයෝග්‍යතා පිළිබඳ අවුරුදු දෙකක් (02) සහ අවුරුදු එකක් (01) අතර නම්‍යශීලීභාවය ක්‍රීඩකයා වෙත නොපැවතිය යුතු ය.

(ඇ) 5(උ) වන හෝ 5(ඌ) වන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, උල්ලංඝනය කිරීමේ බරපතළ බව මත රඳාපවතිමින්, අයෝග්‍යතා පිළිබඳ කාලසීමාව අවම වශයෙන් අවුරුදු (04) සිට ජීවිතාන්තය දක්වා වූ අයෝග්‍යතාවක් දක්වා වූ කාලසීමාවක් වේ. ආරක්ෂිත තැනැත්තකු ඇතුළත් වන 5(උ) හෝ 5(ඌ) රීති යටතේ වූ යම් උල්ලංඝනය කිරීමක් නිශ්චිත බරපතළ උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර නිශ්චිත ද්‍රව්‍ය සම්බන්ධයෙන් හැර ක්‍රීඩා සහායක තැනැත්තකු විසින් එවැනි උල්ලංඝනය කිරීමක් සිදුකළහොත්, එවිට, එම ක්‍රීඩා සහායක තැනැත්තා සඳහා ජීවිත කාලය පුරා අයෝග්‍යතාවක් සඳහා එය හේතු වේ. ඊට අමතරව, ක්‍රීඩා නොවන නීති සහ නියෝග උල්ලංඝනය වීමක් ද සිදුවිය හැකි 5(උ) හෝ 5(ඌ) වන රීති සැලකිය යුතු ලෙස උල්ලංඝනය කිරීම් නිසි බලධාරී පරිපාලන, වෘත්තීය හෝ අධිකරණ බලධාරීන් වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(ඇ) 5(එ) වන රීතිය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, උල්ලංඝනය කිරීමේ බරපතළ බව මත රඳා පවතිමින්, අයෝග්‍ය වීමේ කාලසීමාව අවම වශයෙන් අවුරුදු දෙකක (02) සිට ජීවිතාන්තය දක්වා වූ අයෝග්‍ය වීමක් දක්වා විය යුතු ය.

(ඉ) 5(ඒ) වන රීතිය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ක්‍රීඩකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වරදේ තත්ත්වය සහ වෙනත් අවස්ථානුගත කරුණු මත පදනම්ව, අවම වශයෙන් එක් අවුරුද්දක (1) අඩුකිරීමකට යටත්ව, අයෝග්‍යතා කාලසීමාව අවුරුදු දෙකක් (2) විය යුතු ය.

(ඊ) 5(ඔ) වන රීතිය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් සිදු කරනු ලබන උල්ලංඝනය කිරීමේ බරපතළ බව මත රඳාපවතිමින්, අයෝග්‍යතා කාලසීමාව අවම වශයෙන් අවුරුදු දෙකක් (2) විය යුතු ය.

<u>අයෝග්‍යතා කාලසීමාව වැඩි විය හැකි බරපතළ අවස්ථානුගත කරුණු</u>

47. ප්‍රමිතිගත සම්බාධක පැනවීමට වඩා වැඩිවන්නා වූ අයෝග්‍යතා කාලසීමාවක් පැනවීම සාධාරණීකරණය කරනු ලබන බරපතළ අවස්ථානුගත කරුණු ඉදිරිපත්වන බවට 5(උ) වන රීතිය යටතේ වූ උල්ලංඝනය කිරීමක් (ජාවාරම් කිරීම හෝ ජාවාරම් කිරීමට උත්සාහ කිරීමක්), 5(ඌ) වන රීතිය යටතේ වූ උල්ලංඝනය කිරීමක් (පරිපාලනය කිරීමක් හෝ උත්සාහ කරන ලද පරිපාලනය කිරීමක්), 5(එ) වන (වරදකට හවුල්වීමක් හෝ හවුල්වීමට උත්සාහ කිරීමක්), හෝ 5(ඔ) වන (වාර්තා කිරීමට එරෙහිව අධෛර්යමත් කිරීමක් හෝ පළිගැනීමේ ක්‍රියාවක් සිදුකරමින් යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ක්‍රියා) හැර යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සංයුක්ත වන යම් එක් අවස්ථානුගත කරුණක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, එවිට, ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් දූන දූනම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදුකර නොමැති බවට තහවුරු කරනු ලබයි නම් මිස, උල්ලංඝනය කිරීමේ බරපතළ බව සහ බරපතළ අවස්ථානුගත කරුණුවල ස්වභාවය මත පදනම්ව, අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව අවුරුදු දෙකක් (2) දක්වා වූ අයෝග්‍යතාවට පත්වීමේ අතිරේක කාලසීමාවක් සඳහා වැඩිකරනු ලැබිය යුතු ය.

<u>කිසිදු වරදක් හෝ පැහැර හැරීමක් නොමැති අවස්ථාවක දී, අයෝග්‍යතා කාලසීමාව ඉවත් කිරීම</u>

48. යම් තනි අවස්ථාවක දී තමා විසින් කිසිදු වරදක් හෝ පැහැර හැරීමක් සිදුකර නොමැති බවට යම් ක්‍රීඩකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, එවිට, අන්‍යාකාරයකින් අදාළ වේ නම් මිස, අයෝග්‍යතා කාලසීමාව අවසන් විය යුතු ය.

<u>කිසිදු සැලකිය යුතු වරදක් හෝ පැහැර හැරීමක් නොමැතිවීම මත පදනම්ව ආයෝග්‍යතා කාලසීමාව අඩු කිරීම.</u>

49. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමෙක් සඳහා නිශ්චිත ද්‍රව්‍යයක් (අපයෝජන ද්‍රව්‍යයක් හැර) හෝ නිශ්චිත ක්‍රමවේදයක් අන්තර්ගත වන අවස්ථාවක දී සහ ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කිසිදු සැලකිය යුතු වරදක් හෝ පැහැර හැරීමක් සිදුකර නොමැති බවට තහවුරු කරනු ලබන අවස්ථාවක දී, අයෝග්‍යතා කාලසීමාව, ක්‍රීඩකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වරදේ ස්වභාවය මත පදනම්ව, අවම වශයෙන් අවවාද කිරීමක් සහ කිසිදු අයෝග්‍යතා කාලසීමාවක් ලබා නොදීමක් සහ උපරිම වශයෙන් අයෝග්‍යතාවය අවුරුදු දෙකක කාලසීමාවක් විය යුතු ය.

(2) කිසිදු සැලකිය යුතු වරදක් හෝ පැහැර හැරීමක් සිදු වී නොමැති බවට සහ (අපයෝජන ද්‍රව්‍යයක් හැර) අනාවරණය වූ තහනම් ද්‍රව්‍ය යම් දූෂක නිෂ්පාදනයක් නිසා පැමිණ ඇති බවට ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, එවිට, ක්‍රීඩකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ පැහැර හැරීමේ තත්ත්වය මත පදනම්ව, අයෝග්‍යතා කාලසීමාව අවම වශයෙන් අවවාද කිරීමක් සහ කිසිදු අයෝග්‍යතා කාලසීමාවක් නොවිය යුතු ය.

(3) ආරක්ෂිත තැනැත්තකු හෝ විනෝද ක්‍රීඩා ක්‍රීඩකයකු විසින් දූෂක ද්‍රව්‍යයක් අන්තර්ගත නොවන උත්තේජක මර්දන නීති උල්ලංඝනය වීමක් සිදුකර ඇති අවස්ථාවක දී, එම ආරක්ෂිත තැනැත්තා හෝ විනෝද ක්‍රීඩා ක්‍රීඩකයා විසින් කිසිදු සැලකිය යුතු වරදක් හෝ පැහැර හැරීමක් සිදු වී නොමැති බවට තහවුරු කරයි නම්, එවිට එම ආරක්ෂිත තැනැත්තාගේ හෝ විනෝද ක්‍රීඩා ක්‍රීඩකයාගේ වරදේ තත්ත්වය මත පදනම්ව, අයෝග්‍යතා කාලසීමාව අවම වශයෙන් අවවාද ලබාදීමක් සඳහා සහ කිසිදු ආයෝග්‍යතා කාලසීමාවක් නොවීම සහ අවම වශයෙන් අවුරුදු දෙකක (2) අයෝග්‍යතා කාලසීමාවක් විය යුතු ය.

50. 49 වන රීතිය අදාළ නොවන අවස්ථාවක දී, යම් තනි සිදුවීමක දී යම් ක්‍රීඩකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සැලකිය යුතු වරදක් හෝ පැහැරහැරීමක් සිදු කර නොමැති බවට තහවුරු කරනු ලබන අවස්ථාවක දී, එවිට, 51 වන රීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට, තවදුරටත් වූ අඩුකිරීමක් හෝ අවසන් කිරීමකට යටත්ව, එම ක්‍රීඩකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වරදේ තත්ත්වය මත පදනම්ව, අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව අඩු කරනු ලැබිය

හැකි නමුත් අඩු කරනු ලබන අයෝග්‍යතා කාලසීමාවෙන් අඩකට වඩා අඩු නොවිය හැකි ය. අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව ජීවිතාන්තය දක්වා වූ කාලසීමාවක් වේ නම්, මෙම වගන්තිය යටතේ වූ අඩු කරනු ලබන කාලසීමාව අවුරුදු අටකට (8) වඩා අඩු නොවිය හැකි ය.

<u>අයෝග්‍යතා කාලසීමාව ඉවත් කිරීම, අඩු කිරීම හෝ අත්හිටුවීම හෝ වරදක් නොවන හේතු සඳහා ප්‍රතිවිපාක</u>

51. (1) ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සංවිධානය, අපරාධ අධිකාරිය හෝ වෘත්තීය විනය පරීක්ෂණ ආයතනය වෙත සැලකිය යුතු සහායක් ලබා දී ඇත්තා වූ එක් එක් තනි අවස්ථාවල දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 69 වන රීතිය යටතේ අභියාචන තීරණයක් ලබා දීමට පෙරාතුව හෝ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය අවසන් වීමට පෙරාතුව, (අයෝග්‍යතාවට සහ විධානාත්මක පොදු හෙළිදරව් කිරීම හැර), පනවා ඇති ප්‍රතිවිපාකයේ යම් කොටසක් පහත දැක්වෙන ප්‍රතිඵල ඇති වන්නා වූ පරිදි අත්හිටුවනු ලැබිය හැකිය; එනම්,

(අ) වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සංවිධානය විසින් අනාවරණය කර ගැනීම හෝ කරුණු ඉදිරිපත් කිරීම;

(ආ) වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ලද අපරාධ වරදක් හෝ වෘත්තීය රීති කඩ කිරීම පිළිබඳව අපරාධ හෝ විනය ආයතනය විසින් අනාවරණය කර ගැනීම හෝ ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම සහ සැලකිය යුතු සහායක් ලබාදෙන තැනැත්තකු විසින් ලබාදෙන තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත හෝ කළමනාකරණ වගකීමක් සහිත උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි වෙනත් ආයතන වෙත ලබා ගැනීමට සැලැස්වීම;

(ඇ) සම්මුතිය, ජාත්‍යන්තර ප්‍රමිතිය හෝ තාක්ෂණික ලේඛනය සමග අනුකූල නොවීම හේතුවෙන් (රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි අර්ථ නිරූපිත ආකාරයට) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අත්සන්කරුවකුට එරෙහිව, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අනුමත රසායනාගාරයකට හෝ ක්‍රීඩා විදේශ ගමන් බලපත්‍ර කළමනාකරණ ඒකකයට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කිරීම; හෝ

(ඇ) (i) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලබාදෙන අනුමතය සහිතව, අපරාධ හෝ විනය ආයතනයක් විසින්, උත්තේජක ද්‍රව්‍ය ගැනීම හැර ක්‍රීඩාවක ගෞරවය උල්ලංඝනය වීමක් හේතුවෙන් උපචිත වන යම් අපරාධ වරදක් හෝ වෘත්තීය හෝ ක්‍රීඩා රීති උල්ලංඝනය වීම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම. 69 වන රීතිය යටතේ අභියාචනය සඳහා වූ කාලසීමාව අවසන්වීමෙන් පසුව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සහ අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ අනුමතය සහිතව අන්‍යාකාරයකින් අදාළ වන ප්‍රතිවිපාකයේ කොටසක් අත්හිටුවීම ද කරනු ලැබිය හැකි ය. අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව අත්හිටුවීමේ ප්‍රමාණය, ක්‍රීඩකයා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ බරපතළ බව මත සහ ක්‍රීඩාවල දී උත්තේජක ද්‍රව්‍ය ගැනීම අවසන් කිරීම, නීති සංග්‍රහය හෝ ක්‍රීඩාවේ ගෞරවය උල්ලංඝනය කිරීම් පිළිබඳ සංග්‍රහය සමග අනුකූලව ක්‍රියා නොකිරීම අවසන් කිරීම සඳහා උත්සාහ දැරීම පිණිස ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සපයන ලද සහයෝගයේ සැලකිය යුතු වැදගත්කම මත පදනම් විය යුතු ය. අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාවෙන් හතරෙන් තුනකට වඩා වැඩි ප්‍රමාණයක් අත්හිටුවනු ලැබිය හැකි ය. අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව ජීවිතාන්තය දක්වා වන කාලසීමාවක් වන අවස්ථාවක දී, මේ ඡේදය යටතේ වූ අත්හිටුවීම සිදුනොකළ කාලසීමාව අවුරුදු අටකට (8) වඩා අඩු නොවිය යුතු ය. මේ ඡේදයේ කාර්ය සඳහා, අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව සඳහා, මෙම ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක මර්දන රීතිවල 53(6) (ආ) වන රීතිය යටතේ එසේ කළ හැකි කිසිදු අයෝග්‍යතා කාලසීමාවක් ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

(ii) සැලකිය යුතු සහායක් ලබාදීම අපේක්ෂා කරනු ලබන යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් එසේ ඉල්ලා ඇති අවස්ථාවක දී, මෙම ගිවිසුමට අගතියක් නොවීමට යටත්ව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත තොරතුරු සැපයීම සඳහා එම ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු වෙත එම අවස්ථාව ලබා දිය යුතු ය.

(iii) ප්‍රතිවිපාක අත්හිටුවීම මත පදනම්ව සහාය දැක්වීම සහ සම්පූර්ණ සහ විශ්වසනීය සැලකිය යුතු සහාය ලබා දීම අඛණ්ඩව සිදු කිරීමට එම ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු අපොහොසත් වුවහොත්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් මූලික ප්‍රතිවිපාක තත්ත්වයට නැවත පත්කරනු ලැබිය යුතු ය. අත්හිටුවන ලද ප්‍රතිවිපාක නැවත තිබූ තත්ත්වයට පත් කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තීරණය කරනු ලැබුවහොත් හෝ අත්හිටුවන ලද ප්‍රතිවිපාක නැවත තිබූ තත්ත්වයට පත් නොකිරීමට ශ්‍රී ලංකා

උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තීරණය කරනු ලැබුවහොත්, 69 වන රීතිය යටතේ අභියාචනය කිරීම සඳහා හිමිකම් ලබන තැනැත්තා විසින් එම තීරණයට එරෙහිව අභියාචනා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි ඉල්ලීම මත උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සංවිධාන සඳහා සැලකිය යුතු සහායක් ලබාදෙන ලෙස ක්‍රීඩකයන් සහ වෙනත් තැනැත්තන් තවදුරටත් උනන්දු කරවනු ලැබිය යුතු අතර උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි රීති හෝ නීති සංග්‍රහය උල්ලංඝනය කිරීම සිදුකර ඇති හෝ සිදු කර ඇති බවට අනාවරණය වී ඇති ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ඉල්ලීම අනුව, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, 68 වන රීතිය යටතේ අභියාචන තීරණයක් ලබාදීම ඇතුළු ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලියේ ඕනෑම අදියරක දී, අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව සහ වෙනත් ප්‍රතිවිපාක අත්හිටුවීමේ කුමන උචිත පියවරක් ගනු ලැබිය යුතු ද යන්න පිළිබඳ එකඟතාවයකට පැමිණිය හැකි ය. ව්‍යතිරේඛ අවස්ථාවල දී, මෙම වගන්තියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට වඩා වැඩි අයෝග්‍යතා කාලසීමාවක් සහ සැලකිය යුතු උපකාර පිළිබඳ වෙනත් ප්‍රතිවිපාක අත්හිටුවීම සඳහා හෝ ආයෝග්‍යතා කාලසීමාවක් ලබා නොදීම හෝ කිසිදු විධානාත්මක මහජන හෙළිදරව් කිරීමක් කර නොතිබීම සහ/හෝ ත්‍යාග, දඩ හෝ පිරිවැය ගෙවීම් ආපසු ලබා දීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකඟ විය හැකි ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අනුමතය මෙම වගන්තියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රතිවිපාක යථා තත්ත්වයට පත් කිරීම සඳහා යටත් විය යුතු ය. 68 වන රීතියේ කුමක් සඳහන් වුව ද, 51(2) වන රීති පිළිබඳ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තීරණයට එරෙහිව අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3) සැලකිය යුතු සහාය හේතුවෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අන්‍යාකාරයකින් අදාළ වන සම්බාධකයක කොටසක් අත්හිටුවනු ලබයි නම්, එවිට, තීරණය සඳහා සාධාරණීකරණයක් ලබා දෙන නිවේදනය 84 වන රීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට 70 වන රීතිය යටතේ අභියාචනය කිරීමේ අයිතිය සමඟින් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි වෙනත් සංවිධාන වෙත භාරදෙනු ලැබිය යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සුබසිද්ධිය වෙනුවෙන් තීරණයක් ලබාදෙනු ලබන සුවිශේෂී අවස්ථානුගත කරුණුවල දී, සැලකිය යුතු සහාය ලබාදීමේ ගිවිසුමේ සඳහන් හෙළිදරව් කිරීම් සීමා කරනු ලබන හෝ ප්‍රමාද කරනු ලබන හෝ සැලකිය යුතු සහාය ලබාදීමේ ස්වභාවය පිළිබඳ උචිත රහස්‍ය ගිවිසුම්වලට ඇතුළත් වීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(4) උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් තහවුරු කරනු ලැබිය හැකි වන්නා වූ සහ එම පිළිගැනීම සිදු කරන අවස්ථාවේ දී සහ එය එකම විශ්වසනීය සාක්ෂිය වන්නා වූ අවස්ථාවක නියැදි රැස්කිරීමක් පිළිබඳ නිවේදනය ලැබීමට පෙරාතුව ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් සිදු වී ඇති බව ස්වේච්ඡාවෙන් පිළිගනු ලබන අවස්ථාවක දී, එවිට, අයෝග්‍යතා කාලසීමාව අවසන් කරනු ලැබිය හැකි නමුත්, එම කාලසීමාව අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාවෙන් අඩකට වඩා අඩු නොවිය යුතු ය.

(5) 51 වන රීතිය යටතේ යම් අඩු කිරීමක් හෝ අත්හිටුවීමක් අදාළ කර ගැනීමට පෙරාතුව 48 වන, 49 වන හෝ 51 වන රීතිවල එක් විධිවිධානයකට වඩා වැඩි ප්‍රමාණයක් යටතේ සම්බාධකවල අඩුකිරීමක් සඳහා ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් හිමිකමක් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කලාසීමාව 45 වන, 47 වන, 48 වන සහ 49 වන රීති ප්‍රකාරව තීරණය කරනු ලැබිය යුතු ය. ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් 51 වන රීතිය යටතේ අයෝග්‍යතා කාලසීමාව අඩුකිරීමක් හෝ අත්හිටුවීමක් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, එවිට, අයෝග්‍යතා කාලසීමාව අඩු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි නමුත් එම කාලසීමාව අන්‍යාකාරයකින් අදාළ වන අයෝග්‍යතා කාලසීමාවෙන් හතරෙන් එකකට වඩා අඩු නොවිය යුතු ය.

<u>ප්‍රතිඵල පාලනය කිරීමේ ගිවිසුම්</u>

52. (1) (46 වන රීතිය යටතේ යම් ප්‍රකාශිත අයෝග්‍යතා කාලසීමාවක් ඇතුළුව) අවුරුදු හතරක (4) හෝ ඊට වැඩි ප්‍රකාශිත අයෝග්‍යතා කාලසීමාවක් සහිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් දැනුම් දීමෙන් අනතුරුව යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු උත්තේජක මර්දන රීති උල්ලංඝන චෝදනාව පිළිබඳ දැනුම් දීම ලැබීමෙන් දින විස්සකට (20) පසු නොවන කාලයක් තුළ උල්ලංඝනය කිරීම පිළිගෙන ප්‍රකාශිත අයෝග්‍යතා කාලසීමාව පිළිගනු ලබන අවස්ථාවක දී, එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශිත අයෝග්‍යතා කාලසීමාවෙන් අවුරුද්දක අඩු කිරීමක් කරනු ලැබිය හැකි ය.

(2) 52 වන රීතිය යටතේ ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට ප්‍රකාශිත අයෝග්‍යතා කාල සීමාවෙන් අවුරුද්දක අඩු වීමක් ලද අවස්ථාවක දී, වෙනත් යම් වගන්තියක් යටතේ ප්‍රකාශිත අයෝග්‍යතා කාලසීමාවෙන් තවදුරටත් කිසිදු අඩු කිරීමක් ලබා නොදිය යුතු ය.

(3) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමකට මුහුණ දීමෙන් පසුව ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පිළිගනු ලබන සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත පිළිගත හැකි අවස්ථානුගත කරුණුවලට ඔවුන්ගේ තනි අභිමතය යටතේ එකඟ වන අවස්ථාවක දී,

(අ) ප්‍රකාශිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම, උල්ලංඝනය කිරීමේ ඇති බරපතලකම, ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තකුගේ වරදෙහි ප්‍රමාණය සහ ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තා කොතරම් ඉක්මනින් උල්ලංඝනය කිරීම පිළිගනු ලැබුවේ ද යන්න පිළිබඳව 51 වන රීතිය හරහා 44 වන රීතියේ යෙදීම පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් තක්සේරු කිරීම මත පදනම්ව එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තාට අයෝග්‍යතා කාලසීමාවෙන් අඩු කිරීමක් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) අයෝග්‍යතා කාලසීමාව නියැදි එකතු කළ දිනයේම හෝ අවසන්වරට වෙනත් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් සිදු වූ දිනයේ ම ආරම්භ විය හැකි ය. එසේ වුව ද, එක් එක් සිදුවීමේ දී මේ රීතිය අදාළ වන අවස්ථාව දී, ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් පසුව පිළිගන්නා ලද තාවකාලික අත්හිටුවීමක් පැනවීම පිළිගත් දිනට කලින් දිනයේ සිට ඉදිරියට ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් එකඟ වූ අයෝග්‍යතා කාලසීමාවෙන් අවම තරමින් අඩක් ගත කරනු ලැබිය යුතු ය. නඩුවක විසඳීමේ ගිවිසුමකට එළැඹීමට හෝ නොඑළැඹීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි තීරණය සහ අඩු කරනු ලබන ප්‍රමාණය, සහ අයෝග්‍යතා කාලසීමාව ආරම්භ වන දිනය විභාග කිරීමේ මණ්ඩලයක් මගින් තීරණය කිරීමට හෝ සමාලෝචනය කිරීමට සිදු වන කාරණා නොවිය යුතු අතර 68 වන රීතිය යටතේ අභියාචනය කිරීමට යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නඩුව විසඳීමේ ගිවිසුමකට එළැඹීමට අපේක්ෂා කරනු ලබන යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලබන්නේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අගති රහිත ගිවිසුමකට යටත්ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමඟ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

<u>බහුවිධ උල්ලංඝනය කිරීම්</u>

<u>දෙවන හෝ තුන්වන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම</u>

54. (1) ක්‍රීඩකයකුගේ හෝ වෙනත් තැනැත්තකු දෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සඳහා අයෝග්‍යතා කාලසීමාව :-

(අ) මාස හයක අයෝග්‍යතා කාලසීමාවකට; හෝ

(අ) (i) පළමු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සඳහා පනවන ලද අයෝග්‍යතා කාලසීමාවට දෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පළමු උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබන්නේ නම් එම දෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමට අන්‍යාකාරයෙන් අදාළ වන අයෝග්‍යතා කාලසීමාව එකතු කිරීමෙන් ලැබෙන කාලසීමාවක්; සහ

(ii) දෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පළමු උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබන්නේ නම්, දෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමට අන්‍යාකාරයෙන් අදාළ වන අයෝග්‍යතා කාලසීමාවේ දෙගුණය, අතර පරාසයේ කාලසීමාවක්,

අතර කාලසීමාවක් විය යුතු ය.

(2) මේ පරාසයේ අයෝග්‍යතා කාලසීමාව දෙවන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ අවස්ථානුගත කරුණු සහ ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තාගේ වරදෙහි ප්‍රමාණය මත පදනම්ව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) තෙවන උල්ලංඝනය කිරීම 47 වන හෝ 48 වන රීති යටතේ අයෝග්‍යතා කාලසීමාව ඉවත් කිරීම හෝ අඩු කිරීම සඳහා වන කොන්දේසි සම්පූර්ණ කරනු ලබන්නේ නම් හෝ 5(ඇ) වන රීතිය උල්ලංඝනය කිරීමක යෙදෙනු ලබන්නේ නම් හැර තෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ජීවිත කාලය දක්වා අයෝග්‍යතා කාලසීමාවක් සඳහා සැම විටම හේතු විය යුතු ය. මේ විශේෂ අවස්ථාවල දී අයෝග්‍යතා කාලසීමාව අවුරුදු අටේ (8) සිට ජීවිත කාලය දක්වා වන අයෝග්‍යතාවයක් සඳහා විය යුතු ය.

(4) 53(1) වන සහ 53(3) වන රීතිවල ස්ථාපනය කර ඇති අයෝග්‍යතා කාලසීමාව 50 වන රීතිය යෙදීම මගින් තවදුරටත් අඩු කරනු ලැබිය හැකි ය.

(5) ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු වරදක් නොමැති වීම හෝ නොසැලකිල්ල ස්ථාපනය කර ඇති යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් මේ 53 වන රීතියේ කාර්ය සඳහා උල්ලංඝනය කිරීමක් ලෙස නොසලකනු ලැබිය යුතු ය. ඊට අමතරව, 45(3) වන රීතිය යටතේ දඬුවම් පනවන ලද යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් 53 වන රීතියේ කාර්ය සඳහා උල්ලංඝනය කිරීමක් ලෙස නොසලකනු ලැබිය යුතු ය.

(6) නිශ්චිත විභව බහුවිධ උල්ලංඝනය කිරීම් සඳහා වන අතිරේක රීති පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) 53(6)(ආ) වන සහ 53(6)(ඇ) වන රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 53 වන රීතිය යටතේ දඬුවම් පැනවීමේ කාර්ය සඳහා, 29 වන රීතිය ප්‍රකාර දැනුම් දීම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ලැබුණු පසු අතිරේක උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු කළ බවට හෝ පළමුවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳව දැනුම්දීම ලබා දීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සාධාරණ උත්සාහයක් ගැනීමෙන් පසුව අතිරේක උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු කළ බවට ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හැකි වන්නේ නම් පමණක් උත්තේජක මර්දන රීති උල්ලංඝනය දෙවන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. මෙය ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපොහොසත් වන්නේ නම්, එම උල්ලංඝනය කිරීම තනි පළමු උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර බරපතළ අවස්ථානුගත කරුණුවල යෙදීම ඇතුළත්ව, වඩා බරපතළ දඬුවම් ඇති උල්ලංඝනය කිරීම් මත පදනම්ව දඬුවම් පනවනු ලැබිය යුතු ය. පෙර උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ දිනයට පසු දිනයන් හි පැවති සියලු තරගවල ප්‍රතිඵල 53(1) වන රීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නුසුදුසු කරනු ලැබිය යුතු ය.

(ආ) ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු දැනුම් දීමට පෙර අතිරේක උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කරන ලද බව සහ පළමු දැනුම් දෙන ලද උල්ලංඝනය කිරීමට පෙර හෝ පසුව මාස දොළහකින් (12) හෝ ඊට වැඩි කාලයකින් අතිරේක උල්ලංඝනය කිරීමක් සිදු වූ බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ස්ථාපනය කරනු ලබන්නේ නම්, එවිට, අතිරේක උල්ලංඝනය කිරීමක් සඳහා අයෝග්‍යතා කාලසීමාව අතිරේක පළමුවන උල්ලංඝනය කිරීමක් ලෙස ගණනය කරනු ලැබිය යුතු අතර මේ අයෝග්‍යතා කාලසීමාව කලින් දැනුම් දෙන ලද උල්ලංඝනය කිරීම සඳහා පනවන ලද ආයෝග්‍යතා කාලසීමාව සමඟ සමගාමීව නොව, අඛණ්ඩව ලබා දෙනු ලැබිය යුතු ය. මේ 53(6)(ආ) වන රීතිය අද ාළ වන අවස්ථාවක දී, එකට ගනු ලබන උල්ලංඝනය කිරීම් 53(1) වන රීතියේ කාර්ය සඳහා තනි උල්ලංඝනය කිරීමක් සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(ඇ) යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු පාදක වූ ප්‍රකාශිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා උත්තේජක ද්‍රව්‍ය පාලනය කිරීමේ ක්‍රියාවලිය සමඟ සම්බන්ධිතව 5 (ඉ) වන රීතිය උල්ලංඝනය කිරීමක් සිදු කරන ලද බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්ථාපනය කරන්නේ නම්, 5(ඉ) වන රීතිය උල්ලංඝනය කිරීම තනි පළමු උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ උල්ලංඝනය කිරීම සඳහා වන අයෝග්‍යතා කාලසීමාව පාදක වූ ප්‍රකාශිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සඳහා අයෝග්‍යතා කාලසීමාවක් පනවා තිබේ නම්, ඒ අයෝග්‍යතා කාලසීමාව සමඟ සමගාමී වීමට වඩා අඛණ්ඩව ලබා දෙනු ලැබිය යුතු ය. මේ 52(6)(ඇ) වන රීතිය අදාළ වන අවස්ථාවකදී, එකට ගනු ලබන උල්ලංඝනය කිරීම් 53 වන රීතියේ කාර්ය සඳහා තනි උල්ලංඝනය කිරීමක් සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(ඈ) අයෝග්‍යතා කාලසීමාවක් අතරතුර දී ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු දෙවන හෝ තෙවන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ස්ථාපනය කරනු ලබන්නේ නම්, බහුවිධ උල්ලංඝනය කිරීම් සඳහා අයෝග්‍යතා කාලසීමාව සමගාමී වීමට වඩා, අඛණ්ඩව විය යුතු ය.

54. 53 වන රීතියේ කාර්ය සඳහා එක් එක් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම බහුවිධ උල්ලංඝනය කිරීම් ලෙස සැලකීම සඳහා එම රීති උල්ලංඝනය කිරීමක් සමාන අවුරුදු දහයක කාලසීමාවක් තුළ සිදු විය යුතු ය.

## නියැදි එකතු කිරීමට හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කිරීමට ආනුෂංගිකව තරගවල ප්‍රතිඵල නුසුදුසු කිරීම

55. 43 වන රීතිය යටතේ ධනාත්මක නියැදිය පැවති තරගයේ ප්‍රතිඵල ස්වයංක්‍රීයව නුසුදුසු වීමට අමතරව, (තරගයේ දී හෝ තරගයෙන් පිටත දී) ධනාත්මක නියැදියක් එකතු කරනු ලැබීම හෝ යම් තාවකාලික අත්හිටුවීමක හෝ අයෝග්‍යතා කාලසීමාවක් හරහා වෙනත් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝන වීමක් සිදුවී තිබීම සඳහා සාධාරණත්වය අන්‍යාකාරයෙන් අවශ්‍ය වන්නේ නම් මිස, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු වූ දිනයේ සිට ක්‍රීඩකයා ලබාගත් වෙනත් පදක්කම්, ලකුණු සහ ත්‍යාග අහිමි කිරීම් ඇතුළුව සියලු තරගකාරී ප්‍රතිඵල වශයෙන් වන සියලු ආනුෂංගික කරුණු සමඟ නුසුදුසු කරනු ලැබිය යුතු ය.

අහිමි කරන ලද ත්‍යාග මුදල්

56. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක ප්‍රතිඵලයක් ලෙස අහිමි කරන ලද ත්‍යාග මුදලක් අයකරගනු ලබන්නේ නම්, අහිමි කරනු ලබන ක්‍රීඩකයා තරග කරනු නොලැබූ විට එයට හිමිකම ඇති ක්‍රීඩකයන්ට මෙම ත්‍යාග මුදල වෙන් කිරීම සහ බෙදා දීම සිදු කිරීමට සාධාරණ පියවර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබිය යුතු ය.

මූල්‍යමය ආනුෂංගික කරුණු

57. (1) ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් කරනු ලබන අවස්ථාවක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එහි අභිමතයෙන් සහ සමානුපාතිකත්වයේ මූලධර්මයන්ට යටත් ව -

(අ) පනවන ලද අයෝග්‍යතා කාලසීමාව නොසලකා, උත්තේජක මර්දන රීතිය හා සම්බන්ධිත වියදම් ක්‍රීඩකයාගෙන් හෝ වෙනත් තැනැත්තකුගෙන් අයකර ගැනීම; සහ/හෝ

(ආ) උපරිම අයෝග්‍යතා කාලසීමාව දැනටමත් පනවා ඇති සිද්ධීන්වල දී පමණක් රු. 200,000/- ක් දක්වා ප්‍රමාණයකින් ක්‍රීඩකයාගෙන් හෝ වෙනත් තැනැත්තකුගෙන් දඩයක්, වියදමක් හෝ ගාස්තුවක් වශයෙන් ලබා ගැනීම.

(2) මූල්‍ය දණ්ඩන පැනවීම හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගාස්තු අයකර ගැනීම මේ උත්තේජක මර්දන රීති යටතේ අන්‍යාකාරයෙන් අදාළ විය යුතු අයෝග්‍යතාවය හෝ වෙනත් දඬුවම් අඩු කිරීම සඳහා පදනමක් ලෙස නොසලකනු ලැබිය යුතු ය.

ආයෝග්‍යතා කාල සීමාව ආරම්භ වීම

58. ක්‍රීඩකයකු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා අයෝග්‍යතා කාලයක් දැනටමත් ගත කරනු ලබන අවස්ථාවක දී, යම් අලුත් අයෝග්‍යතා කාලසීමාවක් දැනට පවතින අයෝග්‍යතා කාලසීමාව ගත කිරීමෙන් පසු පළමුවන දිනයේදී ආරම්භ විය යුතු ය. පහත ආකාරයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අයෝග්‍යතා කාලසීමාව අයෝග්‍යතාව සඳහා අවසාන විභාග කිරීමේ තීරණයේ දිනයේදී ආරම්භ විය යුතු ය. නැතහොත් අයෝග්‍යතා කාලසීමාව විභාග කිරීම අත්හැර දමනු ලබන්නේ නම් හෝ විභාග කිරීමක් නොමැති නම් අයෝග්‍යතාවය පිළිගනු ලබන හෝ අන්‍යාකාරයෙන් බලාත්මක කරනු ලබන දිනයේ දී ආරම්භ විය යුතු ය.

59. විභාග කිරීමේ ක්‍රියාවලියේ හෝ උත්තේජක පාලනයේ වෙනත් පැතිකඩයන්හි සැලකිය යුතු ප්‍රමාදයන් සහිත සහ ඒ ප්‍රමාදයන් ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ආරෝපණය කළ නොහැකි බව ස්ථාපනය කිරීමට ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට හැකි වන අවස්ථාවක දී අදාළ වන්නේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි විභාග කිරීමේ මූල මණ්ඩලය විසින්, නියැදි එකතු කළ දිනයට හෝ වෙනත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් අවසන් වරට සිදු වූ දිනය තරම් වූ කලින් එළැඹෙන දිනයකින් ආරම්භ වන දිනයක අයෝග්‍යතා කාලසීමාව ආරම්භ කරනු ලැබිය හැකි ය. අතීතයට බලපවත්වන අයෝග්‍යතාවය ඇතුළුව අයෝග්‍යතා කාලසීමාව තුළ අත්කර ගන්නා ලද සියලු තරගකාරී ප්‍රතිඵල නුසුදුසු කරනු ලැබිය යුතු ය.

60. (1) තාවකාලික අත්හිටුවීමක් ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් පිළිගනු ලබන්නේ නම්, එවිට අවසානයේ දී පනවනු ලැබිය හැකි යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වන එම තාවකාලික අත්හිටුවීමේ කාලසීමාව සඳහා එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ලකුණක් ලැබිය යුතු ය. ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු තාවකාලික අත්හිටුවීමක් පිළිගනු නොලබන්නේ නම්, එවිට ගත කරනු ලබන යම් තාවකාලික අත්හිටුවීමේ කාලසීමාවක් සඳහා කිසිදු ලකුණක් එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට නොලැබිය යුතු ය. පසුව අභියාචනය කරනු ලබන තීරණයක් ප්‍රකාරව අයෝග්‍යතා කාලසීමාවක් ගතකරනු ලබන්නේ නම්, එවිට අභියාචනයේ දී අවසානයේ පනවනු ලැබිය හැකි යම් අයෝග්‍යතා කාලසීමාවක් සම්බන්ධයෙන් ගෙවනු ලබන එම තාවකාලික අත්හිටුවීමේ කාලසීමාව සඳහා එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ලකුණක් ලැබිය යුතු ය.

(2) යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙතින් තාවකාලික අත්හිටුවීමක් ලිඛිතව ස්වේච්ඡාවෙන් පිළිගන ලබන්නේ නම්, සහ ඉන්පසුව තාවකාලික අත්හිටුවීමට ගරුකරනු ලබන්නේ නම්, අවසානයේ පනවනු ලැබිය හැකි යම් අයෝග්‍යතා කාලසීමාවක් සම්බන්ධයෙන් වන ඒ ස්වේච්ඡා තාවකාලික අත්හිටුවීමේ කාලසීමාව සඳහා එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ලකුණක් ලැබිය යුතු ය. තාවකාලික අත්හිටුවීමක් ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් ස්වේච්ඡාවෙන් පිළිගැනීමෙහි පිටපතක් 84(1) වන රීතිය යටතේ ප්‍රකාශිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳ දැනුම්දීමක් ලැබීමට හිමිකමක් ඇති එක් එක් පාර්ශ්වයන් වෙත වහාම ලබාදෙනු ලැබිය යුතු ය.

(3) ක්‍රීඩකයා තරග කිරීමට තෝරා නොගැනීම හෝ කණ්ඩායමක් විසින් අත්හිටුවීම නොසලකා, තාවකාලික අත්හිටුවීම හෝ ස්වේච්ඡා තාවකාලික අත්හිටුවීම ක්‍රියාත්මක වන දිනයට පෙර යම් කාල සීමාවක් සඳහා අයෝග්‍යතා කාලසීමාවක් සම්බන්ධයෙන් කිසිදු ලකුණක් ලබා දෙනු නොලැබිය යුතු ය.

(4) කණ්ඩායම් ක්‍රීඩාවල දී, අයෝග්‍යතා කාලසීමාව කණ්ඩායමකට පනවන අවස්ථාවක දී සාධාරණත්වය අන්‍යාකාරයෙන් අවශ්‍ය වන්නේ නම් මිස, අයෝග්‍යතා කාලසීමාව අයෝග්‍යතාවය සඳහා අවසාන විභාග කිරීමේ තීරණයේ දිනයේ දී හෝ නඩු විභාගය අත්හැර දමනු ලබන්නේ නම් අයෝග්‍යතාවය පිළිගත් හෝ අන්‍යාකාරයෙන් පනවනු ලබන දිනයේදී ආරම්භ විය යුතු ය. (පනවන ලද හෝ ස්වේච්ඡාවෙන් පිළිගන්නා ලද) යම් කණ්ඩායම්, තාවකාලික අත්හිටුවීමේ කාලසීමාවක් ගත කරනු ලැබිය යුතු සම්පූර්ණ අයෝග්‍යතා කාලසීමාවට එරෙහිව ආරෝපණය කරනු ලැබිය යුතු ය.

<u>අයෝග්‍යතාවය හෝ තාවකාලික අත්හිටුවීම අතර තත්ත්වය</u>

61. (1) අයෝග්‍ය බවට ප්‍රකාශ කර ඇති හෝ තාවකාලික අත්හිටුවීමකට යටත්ව සිටින කිසිදු ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු අයෝග්‍යතා කාලසීමාව තුළ හෝ තාවකාලික අත්හිටුවීමේ කාලසීමාව තුළ කිසිදු ආකාරයකින් යම් අත්සන්කරුවකු, අත්සන්කරුවන්ගේ සාමාජික සංවිධානයක් හෝ සමාජයක් හෝ අත්සන්කරුවන්ගේ සාමාජික සංවිධානයක වෙනත් සාමාජික සංවිධානයක් විසින් බලය ලබා දෙන ලද හෝ සංවිධානය කරන ලද (බලයලත් උත්තේජක මර්දන අධ්‍යාපන හෝ පුනරුත්ථාපන වැඩසටහන් හැර) තරඟයකට හෝ කටයුත්තකට හෝ යම් වෘත්තීමය ක්‍රීඩා සමාජයක් හෝ යම් ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ ඉසව් සංවිධානයක් විසින් බලය ලබා දෙන ලද හෝ සංවිධානය කරන ලද තරඟවලට හෝ රාජ්‍ය නියෝජ්‍යායතනයක් විසින් අරමුදල් සපයනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුත්තකට සහභාගී නොවිය යුතු ය.

(2) අවුරුදු හතරකට (4) වඩා වැඩි අයෝග්‍යතා කාලසීමාවකට යටත්ව සිටින ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට අවුරුදු හතරක (4) අයෝග්‍යතා කාලසීමාව සම්පූර්ණ කිරීමෙන් පසුව, සංග්‍රහ අත්සන්කරුවකුගේ හෝ සංග්‍රහ අත්සන්කරුවකුගේ සාමාජිකයකුගේ අවසරය යටතේ දඬුවම් ලබා නොදෙන ලද හෝ අන්‍යාකාරයෙන් නොවන දේශීය ක්‍රීඩා ඉසව්වකට සහභාගී විය හැකි ය. නමුත් දේශීය ක්‍රීඩා ඉසව්ව ඒ ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට ඍජුව හෝ වක්‍රව ජාතික ශූරතාවක දී හෝ ජාත්‍යන්තර ඉසව්වක දී තරඟ කිරීම සඳහා (හෝ ඒ සඳහා ලකුණු එකතු කරනු ලබන) අන්‍යාකාරයෙන් සුදුසුකම් ලබා දෙන මට්ටමක නොවන තාක් දුරට එවැනි දේශීය ක්‍රීඩා ඉසව්වකට එසේ සහභාගි විය හැකි ය. එමෙන්ම ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු යම් තත්ත්වයකින් ආරක්ෂිත තැනැත්තකු සමඟ කටයුතු කිරීමට නොයෙදවනු ලැබිය යුතු ය.

(3) අයෝග්‍යතා කාලසීමාවකට යටත්ව සිටින යම් ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු පිළිබඳව පරීක්ෂණ කිරීමට සහ එම තැනැත්තාගේ පදිංචි ස්ථානය ආදී තොරතුරු සැපයීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කරනු ලබන යම් නියම කිරීම්වලට තවදුරටත්, යටත් විය යුතුය.

<u>පුහුණුවීම්වලට ආපසු පැමිණීම</u>

62. 61(1) රීතියට ව්‍යතිරේඛයක් ලෙස ක්‍රීඩකයකුගේ අයෝග්‍යතා කාලසීමාවේ අවසාන මාස දෙකක කෙටි කාලය තුළ දී හෝ පනවන ලද අයෝග්‍යතා කාලසීමාවේ අවසාන කාර්තුවේ දී හෝ ක්‍රීඩකයකු කණ්ඩායමක් සමඟ පුහුණුවීම සඳහා හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි වෙනත් සාමාජික සංවිධානයක් හෝ වෙනත් සාමාජික සංවිධානයක් හෝ වෙනත් අත්සන්කරුවන්ගේ සාමාජික සංවිධානයක හෝ පහසුකම් භාවිතා කිරීම සඳහා ආපසු පැමිණීමට හැකිය.

<u>ආයෝග්‍යතාවය හෝ තාවකාලික අත්හිටුවීම අතරතුර සහභාගී වීම තහනම් කිරීම උල්ලංඝනය කිරීම</u>

63. (1) අයෝග්‍ය බවට ප්‍රකාශයට පත් කර ඇති ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු 62 වන රීතියේ විස්තර කර ඇති අයෝග්‍යතාවය අතරතුර දී සහභාගී වීම තහනම් කිරීම උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක දී, ඒ සහභාගීවීමේ ප්‍රතිඵල නුසුදුසු කරනු ලැබිය යුතු අතර මුල් අයෝග්‍යතා කාල සීමාවට සමාන අලුත් අයෝග්‍යතා කාලසීමාවක් මුල් අයෝග්‍යතා කාලසීමාවේ අවසානයට එකතු කරනු ලැබිය යුතු ය. දෝෂාරෝපණය කිරීමක් සහ අයෝග්‍යතාවයක් නොමැති කාලසීමාවක් ඇතුළත් අලුත් අයෝග්‍යතා කාලසීමාවක් ක්‍රීඩකයාගේ හෝ වෙනත් තැනැත්තකුගේ වරදෙහි ප්‍රමාණය සහ සිදුවීමේ වෙනත් අවස්ථානුගත කරුණු මත පදනම්ව සකස 'කරනු ලැබිය හැකි ය. ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු සහභාගී වීම සම්බන්ධයෙන් වන තහනම උල්ලංඝනය කර ඇති ද යන වග සහ සකස් කිරීම සුදුසු වන්නේද යන වග තීරණය පළමු අයෝග්‍යතා කාලසීමාව පැනවීමට මුල් වූ ප්‍රතිඵල කළමණාකණය කරන ලද උත්තේජක මර්දන සංවිධානය විසින් ගනු ලැබිය යුතු ය. මේ තීරණය 69 වන රීතිය යටතේ අභියාචන කරනු ලැබිය හැකි ය.

(2) 60 (1) වන රීතිය යටතේ විස්තර කරන ලද තාවකාලික අත්හිටුවීමක් අතරතුර දී සහභාගී වීම සම්බන්ධයෙන් වන තහනම උල්ලංඝනය කරනු ලබන යම් ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට ගතකරන ලද යම් තාවකාලික අත්හිටුවීමේ කාලසීමාවක් සඳහා ලකුණු හිමිනොවිය යුතු අතර ඒ සහභිගීවීමේ ප්‍රතිඵල නුසුදුසු කරනු ලැබිය යුතු ය.

(3) අයෝග්‍යතාවය හෝ තාවකාලික අත්හිටුවීමක් අතරතුර සහභාගී වීම සම්බන්ධයෙන් වන තහනම උල්ලංඝනය කිරීමේ දී ක්‍රීඩකයකුට සහාය වන තැනැත්තකු හෝ වෙනත් තැනැත්තකු සහාය දක්වනු ලබන අවස්ථාවක දී ඒ සහාය දැක්වීම සඳහා 5 (එ) වන රීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දඬුවමක් පනවනු ලැබිය යුතු ය.

අයෝග්‍යතාවය අතරතුර දී මූල්‍යමය සහාය ලබා දීම නතර කිරීම

64. ඊට අමතරව, 48 වන හෝ 49 වන රීතිවල විස්තර කර ඇති පරිදි අඩුකරන ලද දඬුවමක් නොමැති යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා ඒ තැනැත්තා වෙත ලැබුණු ඇතැම් හෝ සියලු ක්‍රීඩාව සම්බන්ධ මූල්‍ය ප්‍රයෝජන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව, ශ්‍රී ලංකා ජාතික පැරාඔලිම්පික් කමිටුව සහ ජාතික සම්මේලනය විසින් නතර කරනු ලැබිය යුතු ය.

කණ්ඩායම් ක්‍රීඩා පරීක්ෂා කිරීම

65. ක්‍රීඩා ඉසව්වකට සම්බන්ධිත 29 වන හා 37 වන රීති යටතේ යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව කණ්ඩායම් ක්‍රීඩාවක කණ්ඩායමක එක් සාමාජිකයකුට වැඩි සාමාජිකයන් ගණනකට දැනුම් දී ඇති අවස්ථාවක දී, ඉසව්ව සඳහා වන පාලක මණ්ඩලය විසින් ඉසව්වේ කාලසීමාව තුළ කණ්ඩායමේ සුදුසු ඉලක්කගත පරීක්ෂණ පවත්වනු ලැබිය යුතු ය.

කණ්ඩායම් ක්‍රීඩා සඳහා ආනුෂංගික කරුණු

66. කණ්ඩායම් ක්‍රීඩාවක කණ්ඩායමක ක්‍රීඩකයන් දෙදෙනෙකුට වැඩි ගණනක් ඉසව්වේ කාලසීමාව තුළ යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බවට අනාවරණය වන අවස්ථාවක දී ඉසව්වේ පාලක මණ්ඩලය විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු කරනු ලබන තනි ක්‍රීඩකයන් මත පනවනු ලබන යම් ආනුෂංගික කරුණුවලට අමතරව කණ්ඩායම මත සුදුසු දඬුවමක් බලාත්මක කරනු ලැබිය යුතු ය.

ඉසව්වේ පාලක මණ්ඩලය විසින් කණ්ඩායම් ක්‍රීඩා සඳහා දැඩි ආනුෂංගික කරුණු පිහිටුවනු ලැබිය හැකි ය.

67. ඉසව්වක් සඳහා වන පාලක මණ්ඩලය විසින් ඉසව්වේ කාර්ය සඳහා කණ්ඩායම් ක්‍රීඩාවලට මෙහි 66 වන රීතියේ සඳහන් ආනුෂංගික කරුණුවලට වඩා දැඩි ආනුෂංගික කරුණු පනවනු ලබන්නා වූ රීති ක්‍රීඩා ඉසව් පිහිටුවීම සඳහා තෝරාගනු ලැබිය හැකි ය.

වෙනත් ක්‍රීඩා මණ්ඩල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දඬුවම් පැමිණ වීම

68. ශ්‍රී ලංකා ජාතික සම්මේලනය හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතුව බලය පවතින වෙනත් ශ්‍රී ලංකා ක්‍රීඩා මණ්ඩලයක් විසින් ඒ සංවිධානයේ හෝ මණ්ඩලයේ ශක්‍යතා ප්‍රදේශය තුළ මෙම උත්තේජක මර්දන රීති අනුගමනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට සහ බලාත්මක කිරීමට අපොහොසත්ව ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය දැනුවත් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පහත දැක්වෙන අමතර විනය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවට, ශ්‍රී ලංකා රජයට හෝ ජාත්‍යන්තර සම්මේලනයට ඉල්ලීමක් කිරීමට හෝ එයට අධිකාරී බලය ඇති අවස්ථාවක දී, එය විසින් ම පහත දැක්වෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට තෝරාගනු ලැබිය හැකි යː-

(අ) එම සංවිධානයේ හෝ මණ්ඩලයේ සාමාජිකයන් සියල්ල හෝ ඇතැම් කණ්ඩායම්, නිශ්චිත අනාගත ක්‍රීඩා ඉසව්වලින් හෝ නිශ්චිත කාලසීමාවක් තුළ පවත්වනු ලබන සියලු ක්‍රීඩා ඉසව්වලින් බැහැර කිරීම;

(ආ) ඒ සංවිධානයේ හෝ මණ්ඩලයේ පිළිගැනීම, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කටයුතුවලට සහාභාගීවීමට ඔවුන්ගේ සාමාජිකයන්ගේ සුදුසුකම, සහ / හෝ පහත දැක්වෙන කරුණු මත පදනම්ව ඒ සංවිධානයට හෝ මණ්ඩලයට දඩයක්, පිරිවැයක් හෝ ගාස්තුවක් සම්බන්ධයෙන් අමතර විනය ක්‍රියාමාර්ග ගැනීමː-

(i) ඒ සංවිධානය හෝ මණ්ඩලය සමග අනුබද්ධිත ක්‍රීඩකයන් හෝ වෙනත් තැනැත්තකු විසින් මාස දොළහක (12) කාලසීමාවක් තුළ (5 (ඇ) වන රීතියේ ඇති උල්ලංඝනය කිරීම හැර) රීති උල්ලංඝනය කිරීම හතරක් (4) හෝ ඊට වැඩි උල්ලංඝනය කිරීම් ගණනක් සිදු කරනු ලැබීම එවැනි ඉසව්වක දී ඒ සංවිධානයේ හෝ මණ්ඩලයේ සාමාජිකයන් සියල්ල හෝ යම් කණ්ඩායම් ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතන

කටයුතුවලට සහභාගීවීමෙන් අවුරුදු දෙකක (2) කාලසීමාවක් දක්වා තහනම් කරනු ලැබිය හැකි ය සහ/ හෝ ඒ සංවිධානයෙන් හෝ මණ්ඩලයෙන් රු. 200,000/- ක් දක්වා ප්‍රමාණයකින් දඩයක්, පිරිවැයක් හෝ ගාස්තුවක් අයකරගනු ලැබිය හැකි ය.

(ii) ඒ සංවිධානය හෝ මණ්ඩලය සමඟ අනුබද්ධිත ක්‍රීඩකයන් හෝ වෙනත් තැනැත්තකු විසින් මාස දොළහක (12) කාලසීමාවක් තුළ 68 (ආ) (ii) වන රීතියේ විස්තර කරනු ලබන උල්ලංඝනය කිරීම්වලට අමතරව (5 (ඇ) වන රීතියේ ඇති උල්ලංඝනය කිරීම් හැර) මේ උත්තේජක මර්දන රීති හතරක් (4) හෝ ඊට වැඩි උල්ලංඝනය කිරීම ගණනක් සිදු කරනු ලැබීම එවැනි ඉසව්වක දී, ඒ සංවිධානය හෝ මණ්ඩලය අවුරුදු හතරක (4) කාලසීමාවක් සඳහා අත්හිටුවනු ලැබිය හැකි ය.

(iii) ඒ සංවිධානය හෝ මණ්ඩලය සමඟ අනුබද්ධිත එක් ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට වඩා වැඩි ගණනක් විසින් ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වක් අතරතුර දී උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කිරීම. එවැනි ඉසව්වක දී, ඒ සංවිධානයෙන් හෝ මණ්ඩලයෙන් රු. 500,000/- ක් දක්වා ප්‍රමාණයකින් දඩයක්, පිරිවැයක් හෝ ගාස්තුවක් අයකරගනු ලැබිය හැකි ය.

(iv) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙතින් ක්‍රීඩකයාගේ පදිංචි ස්ථානය ආදී තොරතුරු සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසුව එම තොරතුරු පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය දැනුවත් කිරීම සඳහා කඩිනම් උත්සහායන් ගැනීමට ඒ සංවිධානය හෝ මණ්ඩලය අපොහොසත් වීම එවැනි අවස්ථාවක දී, ඒ සංවිධානයේ හෝ මණ්ඩලයේ ක්‍රීඩකයන්ගේ පරීක්ෂණවල දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ඇති වූ සියලු වියදම් ප්‍රතිපූරණය කරගැනීමට අමතරව ඒ සංවිධානයෙන් හෝ මණ්ඩලයෙන් එක් ක්‍රීඩකයකුට රු. 200,000/- ක් දක්වා ප්‍රමාණයකින් දඩයක්, පිරිවැයක් හෝ ගාස්තුවක් අයකරගනු ලැබිය හැකි ය.

(ඈ) ඒ සංවිධානයට හෝ මණ්ඩලයට ලබා දෙන ඇතැම් හෝ සියලු අරමුදල් සැපයීම් හෝ වෙනත් මූල්‍ය සහ මූල්‍ය නොවන සහාය නතර කිරීම.

(ඇ) ඒ සංවිධානය හෝ මණ්ඩලය සමඟ අනුබද්ධිත ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ලද මේ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට සම්බන්ධ (රසායනාගාර ගාස්තු, විභාග කිරීමේ වියදම් සහ ගමන් වියදම් ඇතුළත් එහෙත් ඊට සීමා නොවන) සියලු පිරිවැය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ප්‍රතිපූරණය කිරීමට ඒ සංවිධානයට හෝ මණ්ඩලයට බල කිරීම.

**ප්‍රතිඵල කළමනාකරණය කිරීම: අභියාචන**
**අභියාචනය කිරීමට යටත් වන තීරණ**

69. (1) මේ උත්තේජක මර්දන රීතිවල, නීති සංග්‍රහයේ හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන්හි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි නීති සංග්‍රහය හෝ මේ උත්තේජක මර්දන රීති යටතේ සාදන ලද තීරණ අභියාචනය කරනු ලැබිය හැකි ය. ඒ තීරණ අභියාචන මණ්ඩලය අන්‍යාකාරයෙන් නියම කරනු ලබන්නේ නම් මිස, අභියාචනයට යටත් වන අතරතුර දී බලාත්මකව පැවතිය යුතු ය.

(2) අභියාචනය සමාලෝචනය කිරීමේ විෂය පථයට එම කාරණයට අදාළ සියලු ගැටළු ඇතුළත් විය යුතු අතර එය ප්‍රථම තීරණය ගනු ලබන තැනැත්තා හමුවේ වන ගැටළු හෝ සමාලෝචන විෂය පථයට ප්‍රකාශිතව සීමා නොවිය යුතු ය.

(3) අභියාචනයේ යම් පාර්ශ්වයන් විසින් පළමු අවස්ථාවේ දී විභාග කිරීමේ දී ඉස්මතු කරනු නොලැබූ සාක්ෂි, නීති තර්ක සහ හිමිකම් පෑම්, සමාන නඩු නිමිත්තේ දී ම හෝ පළමු අවස්ථාවේ දී විභාග කිරීමේ දී ඉස්මතු කරන ලද හෝ අවධානය යොමු කරන ලද සමාන සාමාන්‍ය කරුණු හෝ අවස්ථානුගත කරුණු ඉස්මතු වන තාක් දුරට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය විසින් එහි තීරණය ගැනීමේ දී, අභියාචනය කරනු ලබන්නේ යම් මණ්ඩලයක තීරණයක් ද, ඒ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද අභිමතයට වෙනස් අභිමතයක් ලබා දෙනු නොලැබිය යුතු ය.

(5) 68 වන රීතිය යටතේ අභියාචනය කිරීමට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට අයිතියක් ඇති සහ වෙනත් පාර්ශ්වයක් විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි ක්‍රියාවලිය තුළ වන අවසාන තීරණයක් අභියාචන කර නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි ක්‍රියාවලියේ වෙනත් ප්‍රතිකර්ම වෙහෙසට පත් කිරීමෙන් තොරව ඒ තීරණය ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත සෘජුවම අභියාචනය කරනු ලැබිය හැකි ය.

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම, ප්‍රතිවිපාක කරුණු, තාවකාලික අත්හිටුවීම්, තීරණ සහ අධිකාරිය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් වන තීරණයන්ගෙන් වන අභියාචන**

70. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය සිදු කරනු ලද බවට වන තීරණයක්; උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සඳහා ප්‍රතිවිපාක කරුණු පැනවීමක් කරනු ලබන හෝ පැනවීමක් නොකරනු ලබන තීරණයක් හෝ කිසිදු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කර නොමැති බවට වන තීරණයක්; කාර්ය පටිපාටිමය හේතු මත (උදාහරණ ලෙස කාලාවරෝධය ඇතුළත්ව) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳ නඩු කටයුතු ඉදිරියට ගෙන යා නොහැකි බවට වන තීරණයක්; 26 (1) වන රීතිය යටතේ තරඟයට ආපසු පැමිණීමට විශ්‍රාමික ක්‍රීඩකයකුට මාස හයක දැන්වීමක් ලබා දීමේ අවශ්‍යතාවයට ව්‍යතිරේඛයක් ප්‍රදානය නොකිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක්; නීති සංග්‍රහයේ 7.1 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රතිඵල කළමනාකරණය කිරීම පවරමින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක්; උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ලෙස අහිතකර විශ්ලේෂණාත්මක සොයා ගැනීමක් හෝ විෂම සොයාගැනීමක් ඉදිරියට ගෙන නොයාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක් හෝ ප්‍රතිඵල කළමනාකරණය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුව විමර්ශනය කිරීමකට පසුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සමඟ ඉදිරියට ගෙනයැමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක් හෝ ප්‍රතිඵල කළමනාකරණය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුව විමර්ශනය කිරීමකට පසුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සමඟ ඉදිරියට ගෙනයාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක්; තාවකාලික විභාග කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් තාවකාලික අත්හිටුවීමක් බලාත්මක කිරීම හෝ ඉවත් කිරීම සඳහා වන තීරණයක්; 32 වන රීතියට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපොහොසත් වීම; චෝදනා කරනු ලබන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් හෝ එහි ප්‍රතිවිපාක තහනම් කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට අධිකාරි බලය නොමැති බවට තීරණයක්; 51 (1) වන රීතිය යටතේ වන ප්‍රතිවිපාක කරුණු අත්හිටුවීම හෝ අත්හිටුවීම නොකිරීම හෝ නැවත යථාතත්වයට පත් කිරීම හෝ යථාතත්වයට පත් නොකිරීම සඳහා වන තීරණයක්; නීති සංග්‍රහයේ 7.1.4 වන සහ 7.1.5 වන ව්‍යවස්ථාවලට අනුකූල වීමට අපොහොසත් වීම; 52(1) වන රීතියට අනුකූල වීමට අපොහොසත් වීම; 63 වන රීතිය යටතේ වන තීරණයක්; 88 වන රීතිය යටතේ වෙනත් උත්තේජක මර්දන සංවිධානයක තීරණයක් ක්‍රියාත්මක නොකිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබූ තීරණයක් සහ නීති සංග්‍රහයේ 27.3 වන ව්‍යවස්ථාව යටතේ වන තීරණයක්, 70 වන රීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) ජාත්‍යන්තර ඉසව්වකට සහභාගී වීමෙන් පැන නගින නඩු කටයුතු අවස්ථාවල දී හෝ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් සම්බන්ධයෙන් වන නඩු කටයුතු අවස්ථාවල දී එම අදාළ තීරණය විශේෂයෙන් ම ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3) 70 (2) වන රීතිය අදාළ නොවන අවස්ථාවල දී, තීරණය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය. එම අභියාචන ක්‍රියාවලිය, ප්‍රතිඵල කළමනාකරණය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලය ඉදිරිපිට ඇති නඩු විභාග කිරීම්**

71. (1) අමාත්‍යවරයා විසින් ස්වාධීන මූලාසනයක් සහ වෙනත් ස්වාධීන සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු අභියාචන මණ්ඩලයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත පත් කරනු ලැබිය යුතු ය. එක් අභියාචන මණ්ඩල සාමාජිකයකු අවුරුදු තුනකට (3) නොඅඩු අදාළ නෛතික පළපුරුද්ද සහිත සුදුසුකම්ලත් නීතිඥවරයකු විය යුතු අතර එක් මූල මණ්ඩල සාමාජිකයකු අවුරුදු තුනකට (3) නොඅඩු අදාළ වෛද්‍ය පළපුරුද්ද සහිත සුදුසුකම්ලත් වෛද්‍යවරයකු විය යුතු ය.

(2) එක් එක් සාමාජිකයා ඔවුන්ගේ නීති, ක්‍රීඩා, වෛද්‍ය සහ/ හෝ විද්‍යා විශේෂඥතාවය ඇතුළත්ව ඔවුන්ගේ අවශ්‍ය උත්තේජක මර්දන පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් පත් කරනු ලැබිය යුතු ය. එක් එක් සාමජිකයා අවුරුදු තුනක (3) ධුරකාලයකට පත් කරනු ලැබිය යුතු අතර නැවත පත් කරනු ලැබිය හැකි ය.

(3) පත් කරන ලද සාමාජිකයන් මෙහෙයුම් වශයෙන් සහ ආයතනික වශයෙන් ස්වාධීන විය යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සාමාජිකයන්, කාර්ය මණ්ඩල සාමාජිකයන්, කොමිෂන් සභාවේ සාමාජිකයන්, උපදේශකවරුන් සහ නිලධාරීන් හෝ එහි අනුබද්ධිතයන් (බලය පවරන ලද තුන්වන පාර්ශ්වයක් වැනි) මෙන්ම කාරණය විමර්ශනය කිරීම, පූර්ව - විනිශ්චය කිරීම හෝ ප්‍රතිඵල කළමනාකරණය කිරීම සිදු කිරීමෙහි යෙදී සිටිනු ලබන යම් තැනැත්තකු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් සහ/ හෝ ලිපිකරුවන් ලෙස පත් කරනු ලැබිය නොහැකි ය. විශේෂයෙන්ම කිසිදු සාමාජිකයකු දෙන ලද නඩුවක දී එම ක්‍රීඩකයාම සම්බන්ධ වන යම්

චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් සම්බන්ධ ඉල්ලීමක්, ප්‍රතිඵල කළමනාකරණය පිළිබඳ තීරණයක්, පළමු අවස්ථාවක් හෝ අභියාචනයක් කලින් සලකා බලා නොතිබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි හෝ යම් තුන්වන පාර්ශ්වයක මැදිහත්වීමකින් තොරව විභාග කිරීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහිත තත්ත්වයක ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලය පැවතිය යුතු ය.

(5) නඩුවක් ඇසීම සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු යම් හේතුවක් මත නඩුව ඇසීමට අකැමති වන්නේ නම් හෝ ඔහුට නොහැකි වන්නේ නම් අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට සාමාජිකයකු පත් කිරීම හෝ අලුත් විභාග කිරීමේ මණ්ඩලයක් පත් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(6) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අභියාචන මණ්ඩලයේ පූර්ණ අභිමතයෙන් මණ්ඩලයට සහාය වීමට හෝ උපදෙස් ලබා දීමට විශේෂඥයකු පත් කරනු ලැබිය හැකි ය.

(7) නඩු කටයුතුවල පාර්ශ්වයක් හෝ පාර්ශ්ව නොවන්නේ නම් ජාත්‍යන්තර සම්මේලනය, ජාතික සම්මේලනය, ජාතික ඔලිම්පික් කමිටුව සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය යන එක් එක් ආයතනවලට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලයේ නඩු විභාග කිරීම් සඳහා නිරීක්ෂකයකු වශයෙන් සහභාගී වීමේ අයිතිය තිබිය යුතු ය.

(8) 70 වන රීතිය ප්‍රකාරව නඩු විභාග කිරීම් හැකි ඉක්මනින් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. ඉසව් හා සම්බන්ධ නඩු විභාග කිරීම් කාර්යක්ෂම පදනමක් මත පවත්වනු ලැබිය යුතු ය.

<u>ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලයේ නඩු කටයුතු</u>

72. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අභියාචන මණ්ඩලයේ නඩු කටයුතුවල දී ප්‍රතිඵල කළමනාකරණය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්හි 8 වන, 9 වන සහ 10 වන ව්‍යවස්ථාවල විස්තර කරන ලද මූලධර්ම පිළිගනු ලැබිය යුතු ය.

(2) එක් එක් සාමාජිකයා විසින් ප්‍රකාශනයේ අනාවරණය කරන ලද අවස්ථානුගත කරුණු හැර යම් පාර්ශ්වයක් ඉදිරියේ ඒ සාමාජිකයන්ගේ අපක්ෂපාතීභාවය ප්‍රශ්න කිරීමකට කැඳවනු ලැබිය හැකි, එම සාමාජිකයා හෝ සාමාජිකාව දන්නා කිසිදු කරුණක් හෝ අවස්ථානුගත කරුණක් නොමැති බවට වන ප්‍රකාශනයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) අභියාචක විසින් ඔහුගේ/ ඇයගේ නඩුව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර වගඋත්තරකාර පාර්ශ්වය හෝ පාර්ශ්ව විසින් උත්තරයේ දී ඔහුගේ / ඇයගේ/ ඔවුන්ගේ නඩුව හෝ නඩු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) දැනුම් දීමෙන් පසුව යම් පාර්ශ්වයක් හෝ ඔහුගේ/ ඇයගේ නියෝජිතයකු නඩු විභාගයකට සහභාගීවීමට අපොහොසත් වන්නේ වුව ද, නඩු විභාගය පවත්වනු ලැබිය හැකි ය.

(5) එක් එක් පාර්ශ්වයන්ට ඒ පාර්ශ්වයේ වියදමෙන් නඩු විභාගයක දී නීතිඥවරයකු මගින් පෙනී සිටීමට අයිතිය තිබිය යුතු ය.

(6) එක් එක් පාර්ශ්වයන්ට ඒ ඒ පාර්ශ්වයේ වියදමෙන් නඩු විභාගයේ දී භාෂා පරිවර්තකයකු ලබා ගැනීමේ අයිතිය තිබිය යුතු ය.

(7) නඩු කටයුත්තේ එක් එක් පාර්ශ්වයට අදාළ සාක්ෂිවලට ප්‍රවේශ වීමට සහ ඉදිරිපත් කිරීමට, ලිඛිත වාචික දේශන ඉදිරිපත් කිරීමට සහ සාක්ෂිකරුවන් කැඳවීම හා විභාග කිරීමට අයිතිය තිබිය යුතු ය.

<u>ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභියාචනා මණ්ඩලයේ තීරණ</u>

73. (1) විභාගයක් අවසානයේ දී හෝ ඉන් පසුව නොපමවා, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභියාචන මණ්ඩලය විසින් ප්‍රතිඵල කළමනාකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතියේ 9 වන වගන්තියේ නියමයන්ට යටත්ව ලිඛිත දාතම යෙදූ අත්සන් සහිත තීන්දුවක් නිකුත් කළ යුතු ය.

(2) පැනවිය හැකි උපරිම තහනමක් පැනවීම නොකළේ මන්ද යන්න (අදාළ නම්) සාධාරණ හේතුවක් ඇතුළත් කරමින් පනවන යම් තහනම් කාලසීමාවක් සඳහා සහ තීරණයක් සඳහා සම්පූර්ණ හේතු, තීන්දුවේ විශේෂයෙන් ඇතුළත් කළ යුතු ය.

(3) 74 වන රීතිය යටතේ අභියාචනය කිරීමට අයිතිය ඇති, ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තකුට ඔහුගේ හෝ ඇයගේ ජාතික සංගමයට සහ උත්තේජක මර්දන සංවිධානවලට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තීරණය දැනුම් දිය යුතු අතර එය නොපමාව උත්තේජක මර්දන පරිපාලන සහ කළමනාකරණ පද්ධතියට සැල කළ යුතු ය.

(4) 73 වන වගන්තියේ රීතිවල විධිවිධාන සලසා ඇති පරිදි, තීරණය අභියාචනයට ලක් කළ හැකි අතර, 86 වන රීතියේ විධිවිධාන පරිදි ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ හැකි ය.

<u>අභියාචනයට හිමිකම්ලත් තැනැත්තන්</u>

74. (1) 70 (2) වන රීතිය යටතේ වන කාරණා සම්බන්ධයෙන් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට අභියාචනා කිරීමට පහත දැක්වෙන පාර්ශ්වයන්ට, එනම් -

(අ) අභියාචනය සිදුවන තීරණයට යටත් වන ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකු;

(ආ) තීරණය දෙනු ලැබ ඇති නඩුවට අදාළ අනෙක් පාර්ශ්වයට;

(ඇ) අදාළ ජාත්‍යන්තර සංගමයට;

(ඈ) ඒ තැනැත්තා අයිති හෝ අවසරය දරන ඒ තැනැත්තාගේ පදිංචි රට හෝ රටවල්වලට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ ජාතික උත්තේජක මර්දන සංවිධානවලට;

(ඉ) ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩාවල සුදුසුකම්වලට බලපාන තීරණ අතුළුව එම තීරණ ඔලිම්පික් ක්‍රීඩාවල හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් බලපෑමක් තිබිය හැකි තීරණයක් වන අවස්ථාවක දී අදාළ පරිදි, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවට හෝ ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුවට; සහ

(ඊ) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට,

අයිතිය තිබිය යුතු ය.

(2) 70 (3) වන රීතිය යටතේ වන කාරණාවල දී, අභියාචනා කිරීමට පහත දැක්වෙන, එනම්:-

(අ) අභියාචනය කරනු ලබන තීරණයට යටත් වන ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට;

(ආ) තීරණය දෙනු ලැබ ඇති කාරණයේ අනෙක් පාර්ශ්වයට;

(ඇ) අදාළ ජාත්‍යන්තර සංගමයට;

(ඈ) ඒ තැනැත්තා පදිංචි හෝ එම තැනැත්තාගේ අවසරය දරන ඒ තැනැත්තා පදිංචි රට හෝ රටවල ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ ජාතික උත්තේජක මර්ධන සංවිධානයට;

(ඉ) ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සඳහා සුදුසුකම් ලැබීමට බලපාන තීරණ ඇතුළුව, එම තීරණයන් ඔලිම්පික් ක්‍රීඩාවල හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් බලපෑමක් තිබිය හැකි තීරණයක් වන අවස්ථාවක දී අදාළ පරිදි, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවට හෝ ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුවට; සහ

(ඊ) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට,

අයිතිය තිබිය යුතු ය.

(3) 69 (3) රීතිය යටතේ වන කාරණා සඳහා, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභියාචනා මණ්ඩලයේ තීරණයක් සම්බන්ධයෙන් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට අභියාචනා කිරීමට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවට, ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුවට සහ අදාළ ජාත්‍යන්තර සංගමයට ද අයිතිය තිබිය යුතු ය.

(4) අභියාචනයක් ගොනු කරනු ලබන ඕනෑම පාර්ශ්වයක් විසින් තීරණය අභියාචනා කරමින් පවතින උත්තේජක මර්දන සංවිධානය මගින් සියලු අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයේ සහාය ලබාගැනීමට හිමිකම් ලැබිය යුතු අතර එවැනි අවස්ථාවක දී ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය විසින් එම තොරතුරු සැපයිය යුතු ය.

දැනුම් දීමට නීතිමය බැඳීම

75. අභියාචනා කිරීමට අයිතියක් ඇති ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ අනෙක් සියලු පාර්ශ්වයන්ට අභියාචනයේ කාලීන දැන්වීමක් ලබා දී ඇති බවට යම් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයකට අභියාචනය කරන සියලු පාර්ශ්වයන් විසින් සහතික කළ යුතු ය.

තාවකාලික තහනමක් පැනවීමේ අභියාචනා

76. මෙහි වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, තාවකාලික තහනමක් පනවන්නේ යම් ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකුට ද ඒ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා තාවකාලික තහනමක් පැනවීමේ දී අභියාචනය කළ හැකි එකම තැනැත්තා වේ.

68 වන රීතිය යටතේ තීරණවල අභියාචනා

77. 68 වන රීතියට අනුකූලවන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ යම් තීරණයක් ජාතික සංගමයක් හෝ අනෙක් පුද්ගල මණ්ඩලයක් විසින්, විශේෂයෙන් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයකට පමණක් අභියාචනය කළ යුතු ය.

අවසරලත් හරස් අභියාචනා සහ පසුව කරන අභියාචනා

78. ක්‍රීඩා සංග්‍රහය යටතේ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට ගෙන එන ලද නඩුවලට නම් කළ යම් වග උත්තරකරුවකු විසින් ඉදිරිපත් කළ හරස් අභියාචනාවලට සහ පසුව කරන අනෙක් අභියාචනාවලට විශේෂයෙන් අවසර හිමි වේ. 69 වන රීතිය යටතේ අභියාචනයක් කිරීමට අයිතියක් ඇති යම් පාර්ශවයක් විසින් පාර්ශවකරුගේ පිළිතුර සමඟ නිශ්චිත කාලයක් තුළ දී හරස් අභියාචනයක් හෝ පසු අභියාචනයක් ගොනු කළ යුතු ය.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කාලීන තීරණයක් ලබා දීමට අපොහොසත් වීම

79. විශේෂ කාරණයක දී, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දෙන ලද සාධාරණ කාලසීමාවක් තුළ, උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදු කළේ ද නැද්ද යන්න පිළිබඳව තීරණයක් ලබා දීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපොහොසත් වන අවස්ථාවක දී, කිසිදු උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදු වී නොමැති බව තීන්දු කරනු ලබන තීරණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලබා දී තිබූ ලෙස ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට කෙලින්ම අභියාචනා කිරීමට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පත් කළ හැකි ය. උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදුකළ බවට සහ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට කෙලින්ම අභියාචනා කිරීමට පත් කිරීමේ දී ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සාධාරණව ක්‍රියාකර ඇති බවට ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයේ විභාග කිරීමේ එම මණ්ඩලය තීරණය කරන්නේ නම්, එවිට අභියාචන චෝදනා ඉදිරිපත් කිරීමේ දී ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දරන ලද නඩු ගාස්තු සහ නීතිඥ ගාස්තු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ප්‍රතිපූර්ණය කළ යුතු ය.

චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සඳහා ආදාළ අභියාචනා

80. 17 වන රීතියේ සිට 22 වන රීතිය දක්වා වූ රීතිවල විශේෂයෙන් විධිවිධාන සලසා ඇති පරිදි චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධ තීරණ අභියාචනය කළ හැකි ය.

අභියාචනා තීරණ දැනුම් දීම

81. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 84 වන රීතිය යටතේ විධිවිධාන සලසා ඇති පරිදි 74 වන රීතිය යටතේ අභියාචනය කිරීමට හිමිකම් ලැබී තිබිය හැකි ක්‍රීඩකයකුට හෝ වෙනත් තැනැත්තකුට සහ වෙනත් උත්තේජක මර්දන සංවිධානවලට නොපමාව එම අභියාචන තීරණය ලබා දිය යුතු ය.

අභියාචන ගොනු කිරීම සඳහා කාලසීමාව

82. (1) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට අභියාචනයක් ගොනු කිරීමේ කාලසීමාව අභියාචන සිදු කරනු ලබන පාර්ශ්වය විසින් තීරණ ලබා ගන්නා දින සිට දින විසි එකක් (21) විය යුතු ය.

(2) අභියාචනට හිමිකම් ලබන පාර්ශ්වයන් විසින් ගොනු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් 82 (1) වන රීතිය අදාළ විය යුතු අතර,

(අ) ප්‍රතිඵල කළමනාකරණ බලය තිබූ උත්තේජක මර්දන සංවිධානයකින් තීරණයට අදාළ වන සම්පූර්ණ තීරණයේ ලිපිගොනුවක පිටපතක් ඉල්ලා සිටීමට අයිතිය තිබිය යුතු යම් පාර්ශ්වයක් / පාර්ශ්වයන්ට ඒ තීරණය දැනුම් දීමේ සිට දින පහළොවක් තුළ (15), අභියාචනයක් සිදුකරනු ලබන්නේ නම්; හෝ

(ආ) එම ඉල්ලීම සිදු කරනු ලබනුයේ දින පහළොවේ කාලසීමාව තුළ දී නම්, එවිට, එම ඉල්ලීම සිදු කරනු ලබන පාර්ශ්වයට ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට අභියාචනයක් ගොනු කිරීමට දින විසි එකක (21) කාලයක් තිබිය යුතු ය.

එසේ වුව ද, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගොනු කළ අභියාචනයන් සඳහා වන ගොනු කිරීමේ අවසාන කාලසීමාව අභියාචනය කළ හැකි අභියාචනයකට යම් පාර්ශ්වයක් හිමිකම් ලබන අවසාන දිනයෙන් පසු දින විසි එකකට හෝ තීරණය අදාළ වන සම්පූර්ණ වාර්තාව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ලැබීමෙන් පසු දින විසි එකකට (21) පසු නොවිය යුතු ය.

<u>69 (3) වන රීතිය යටතේ අභියාචන</u>

83. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අභියාචන මණ්ඩලයට අභියාචනයක් ගොනු කිරීමට ඇති කාලය අභියාචනය සිදු කරනු ලබන පාර්ශ්වයට තීරණය ලැබෙන දින සිට දින විසි එකක් විය යුතු ය.

(2) අභියාචනයට හිමිකම් ලැබූ පාර්ශ්වයක් විසින් ගොනු කළ අභියාචනා සම්බන්ධයෙන් 83 (1) වන රීතිය අදාළ විය යුතු අතර, අභියාචනයට යටත් වන තීරණයකට මුල් වන නීති කෘත්‍යයන්වලට පාර්ශ්වයක් නොවන්නකුට එම රීතිය අදාළ නොවිය යුතු අතර අභියාචනයට හිමිකම ලැබූ පාර්ශ්වයක් විසින් ගොනු කළ අභියාචනය සම්බන්ධයෙන්-

(අ) එම පාර්ශ්වයට / පාර්ශ්වයන්ට තීරණය පිළිබඳ දැනුම් දීම ලැබී දින පහළොවක් (15) තුළ ප්‍රතිඵල කළමනාකරණ බලය තිබූ උත්තේජක මර්දන සංවිධානයේ තීරණයට අදාළ වන සම්පූර්ණ නඩු ගොනුවේ වාර්තාවක පිටපත ඉල්ලා සිටීමට අයිතිය ඇත; සහ

(ආ) එම ඉල්ලීම දින පහළොවක් (15) කාලසීමාව ඇතුළත සිදුවූයේ නම්, එවිට, ජාතික උත්තේජක මර්දන අභියාචන මණ්ඩලයට අභියාචනයක් ගොනු කිරීම සඳහා එම ඉල්ලීම සිදු කරනු ලබන පාර්ශ්වයට එම ලිපිගොනුව ලැබී දින විසි එකක (21) කාලයක් ලැබිය යුතු ය.

ඉහත කුමක් සඳහන් වුව ද, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගොනු කළ අභියාචනයක් සඳහා වූ කාලසීමාව, අභියාචනය කළ හැකිව තිබූ අභියාචනයකට වෙනත් යම් පාර්ශ්වයක් අයිතියක් දරන අවසාන දිනයෙන් පසු දින විසි එකකට (21) හෝ තීරණයට අදාළ වන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සම්පූර්ණ වාර්තාව ලැබීමෙන් පසු දින විසි එකකට (21) පසු නොවිය යුතු ය.

<u>රහස්‍යභාවය සහ වාර්තාකරණය</u>

84. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කරන ක්‍රීඩකයන්ට හෝ අනෙක් තැනැත්තකුට 28 වන සහ 83 වන රීති යටතේ විධිවිධාන සලසා ඇති පරිදි ඒවාට එරෙහිව දැන්වීමක් සිදු කළ යුතු ය.

(2) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් තහවුරු වීමක් පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනවලට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම් දීමට උත්තේජක මර්දන රීතිවල 28 වන සහ 83 වන රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සිදු විය යුතු අතර ඊට සමගාමීව ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට දැනුම් දීම සිදු විය යුතු ය.

(3) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පිළිබඳව දැන්වීමක ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ නම, රට, ක්‍රීඩා සහ ක්ෂේත්‍රය ක්‍රීඩකයාගේ තරගකාරී මට්ටම, පරීක්ෂණය සිදුවූයේ තරගය තුළදී ද නැතහොත් ඉන් බැහැරව ද යන්න, නියැදි රැස්කිරීමේ දිනය, රසායනාගාරය විසින් වාර්තා කරන ලද විශ්ලේෂණාත්මක ප්‍රතිඵලය, පරීක්ෂණ සහ විමර්ශන සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සහ ප්‍රතිඵල කළමනාකරණය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් නියම කළ පරිදි වෙනත් තොරතුරු, උල්ලංඝනය කළ රීති සහ ප්‍රකාශිත උල්ලංඝනයේ පදනම පිළිබඳව ඇතුලත් කළ යුතු ය.

(4) 83 (1) වන රීතියට අනුකූලව උත්තේජක මර්දන රීති උල්ලංඝනයක කිරීමක් පිළිබඳ දැනුම් දීමට හේතු වී නොමැති විමර්ශණ සම්බන්ධයෙන් හැර, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් වෙනස් වන්නේ නම්, ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තකුගේ ජාතික උත්තේජක මර්දන සංවිධානය සහ ලෝක උත්තේජක මර්දන සංවිධානය විසින් 29 වන, 30 වන

සහ 67 වන රීතිවලට අනුව පවත්වන ලද යම් සමාලෝචනයක හෝ නීති කෘත්‍යවල තත්ත්වයන් සම්බන්ධයෙන් නව තීරණ නිතිපතා යවත්කාලීන කළ යුතු අතර, අදාළ කරුණ පිළිබඳ විස්තර කෙරෙන ප්‍රමාණවත් විස්තරයක් හෝ තීරණ අප්‍රමාදව ලියවිල්ලකින් සැපයීම කළ යුතු ය.

(5) 86 වන රීතියේ අවසර දී ඇති පරිදි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් මෙම තොරතුරු ප්‍රසිද්ධියේ හෙළිදරව් කරන තෙක් (අදාළ ජාතික ඔලිම්පික් කමිටුවක, ජාතික සංගමයක සහ කණ්ඩායම් ක්‍රීඩාවක, කණ්ඩායමක සුදුසු තැනැත්තන් ඇතුළත් විය හැකි) දැනගැනීමට අවශ්‍යතාවයක් ඇති තැනැත්තන්ගෙන් ඔබ්බට මෙම තොරතුරු ප්‍රතිග්‍රාහක සංවිධානවලින් හෙළිදරව් නොකළ යුතු ය.

(6) අහිතකර විශ්ලේෂණ තීන්දු ආදර්ශීය තීන්දු සහ අනෙකුත් ප්‍රකාශිත තොරතුරු 85 වන රීතියට අනුකූලව ප්‍රසිද්ධියේ හෙළිදරව් කරන තෙක් රහසිගතව පවතින බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන සහතික කළ යුතු ය. සම්පූර්ණයෙන්ම බලාත්මක කළ හැකි රහසිගතභාවය පිළිබඳ ගිවිසුම්ගත රාජකාරියකට සහ එවැනි රහසිගත තොරතුරු අනිසි සහ / හෝ අනවසරයෙන් හෙළිදරව් කිරීම පිළිබඳ විමර්ශණ සහ විනයානුකූලභාවය පිළිබඳ සම්පූර්ණයෙන්ම බලාත්මක වන ක්‍රියාපටිපාටියකට කොන්ත්‍රාත්කරුවන්, අනුයෝජිතයන්, උපදේශකවරු සහ නියෝජිත නොවන පාර්ශ්වයන් ලෙස (ස්ථිර හෝ අන්‍යාකාරයේ) එහි සේවකයන් යටත්වන බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහවුරු කළ යුතු ය.

## උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම හෝ තාවකාලික තහනමක් උල්ලංඝනය කිරීම පිළිබඳව තීරණ සහ ලිපිගොනු ඉල්ලා සිටීම

85. (1) 36 වන, 40 වන, 49 වන, 51 වන හෝ 80 වන රීතිවලට අනුව ගන්නා ලද යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට අදාළ තීරණයක හෝ ආයෝග්‍යතාවයක් උල්ලංඝනය කිරීමක් හෝ තාවකාලික තහනමක් උල්ලංඝනය කිරීමකට අදාළ තීරණයක්, සම්බන්ධයෙන් අදාළ වේ නම්, දිය හැකිව තිබූ උපරිම දඬුවම් නොපැමිණවීමට හේතු සාධාරණීයකරණය කිරීමට ද ඇතුළුව සම්පූර්ණ හේතු සඳහන් කළ යුතු ය. තීන්දුව ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ප්‍රංශ භාෂාවෙන් නොවන අවසථාවක දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම තීරණය සහ අදාළ හේතු පිළිබඳ සාරාංශය ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාවෙන් සැපයිය යුතු ය.

(2) 85 (1) වන වගන්තියට අනුකූලව ලැබුණ තීරණයකට අභියාචනා කිරීමට අයිතියක් ඇති උත්තේජක මර්දන සංවිධානයක් විසින් එය ලැබී දින පහළොවක් (15) ඇතුළත තීරණයට අදාළ සම්පූර්ණ කාරණාවේ වාර්තාවක පිටපතක් ඉල්ලා සිටිය හැකි ය.

## ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම

86. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතිඵල කළමනාකරණය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ක්‍රීඩකයකුට හෝ අනෙක් තැනැත්තකුට සහ 84 (2) වගන්තියට අනුකූලව අදාළ උත්තේජක මර්දන සංවිධානවලට සපයා ඇති දැන්වීමකින් පසු සිදුවිය හැකි උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් දැනුම් දෙන යම් ක්‍රීඩකයෙකුගේ හෝ අනෙක් තැනැත්තකුගේ අනන්‍යතාවය, තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම සහ සම්බන්ධ වූ උල්ලංඝනයේ ස්වභාවය සහ තාවකාලික තහනමකට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා යටත් වන්නේ ද යන්න පිළිබඳව ප්‍රසිද්දියේ හෙළිදරව් කළ හැකි ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 70 (2) වන හෝ 70 (3) වන රීති යටතේ අභියාචනයක් තීරණයක් ලබාදීමෙන් පසුව යම් අභියාචනයක් අතහැර දමා ඇති බවට හෝ 37 වන රීතියට අනුකූලව විභාග කිරීම අතහැර දමා ඇති හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කල්වේලාව ඇතිව අභියෝගයට ලක් නොකරනු ලැබූ බව හෝ 52 වන රීතිය යටතේ කාරණය විසඳා ඇති බවට හෝ 63 වන රීතිය යටතේ නව තහනම් කාලසීමාවක් හා අවවාද කිරීමක් නියම කර ඇති බවට තීරණය කර, දින විස්සකට නොඅඩු කාලසීමාවක දී උල්ලංඝනය කළ උත්තේජක මර්දන රීති, උල්ලංඝනය සිදු කරන ක්‍රීඩකයාගේ හෝ තැනැත්තාගේ නම, සම්බන්ධ වූ තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම, සහ සිදු වූ බලපෑම පිළිබඳ ප්‍රසිද්ධියේ හෙළි කළ යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉහත විස්තර කරන ලද තොරතුරු ඇතුළත්ව උත්තේජක රීති උල්ලංඝනයට අදාළ අභියාචන තීරණයේ ප්‍රතිඵල ද දින විස්සක් ඇතුළත ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතු ය.

(3) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 70 (2) වන හෝ 70 (3) වන රීතිය යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු වී ඇති බවට අභියාචන තීරණයක් මගින් තීරණය කිරීමක් හෝ එම තීරණය අතහැර දැම්මක් හෝ අභියාචනයක හෝ 8 වන රීතියට අනුව එවැනි නඩු විභාගයක් අතහැර දමනු ලබන අවස්ථාවක දී හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනය තහවුරු කිරීම කල්වේලා ඇතිව අභියෝගයට ලක් කරනු ලැබුවේ නම් හෝ 51 වන වගන්තිය යටතේ එම කාරණය විසඳා ඇත්නම් විසඳා ඇති උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් පිළිබඳ තීන්දුව හෝ තීරණය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළ හැකි අතර, ඒ කාරණය පිළිබඳ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ හැකි ය.

(4) යම් කාරණයක දී, නඩු විභාග කිරීමෙන් හෝ අභියාචනයකින් පසුව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදු කර නොමැති බවට තීරණය වූයේ නම් එම තීරණය අභියාචනය කරනු ලැබ තිබූ බව ප්‍රසිද්ධියේ හෙළි කරනු ලැබිය හැකි ය. කෙසේ වෙතත්, එම තීරණයට භාජනය වූ ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ එකඟත්වය ඇතිව පමණක් එම තීරණය ප්‍රසිද්ධියේ හෙළිදරව් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එලෙස එකඟත්වය ලබාගැනීම සඳහා ප්‍රමාණවත් උත්සාහයක් දැරිය යුතු අතර, එකඟත්වය ලබාගෙන ඇතිනම් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා අනුමත කළ හැකි පරිදි සම්පූර්ණයෙන්ම හෝ සංස්කරණය කරන ලද ආකාරයකින් ප්‍රසිද්ධියේ එම තීරණය හෙළි කරනු ලැබිය යුතු ය.

(5) යම් අයෝග්‍යතා කාලසීමාවක් තුළ හෝ මසකට අඩු නොවන කාලයක් තුළ එම තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වෙබ් අඩවිය තුළ තිබීමට හැරීමෙන් එම තොරතුරු ප්‍රචාරණය සිදුකළ යුතු ය.

(6) 86 (1) වන සහ 86 (3) වන රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි හැර කිසිදු උත්තේජක මර්දන සංවිධානයක්, ජාතික සංගමයක් හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයක් විසින් පිළිගත් පරීක්ෂණාගාරයක් හෝ එවැනි යම් මණ්ඩලයක් යම් නිලධාරියකු විසින් ක්‍රීඩකයකු, අනෙක් තැනැත්තකු හෝ අනෙක් අන්‍යෝජිතයන් හෝ ඔවුන්ගේ පිරිවර විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව ඔවුන්ට ආරුඪ ප්‍රසිද්ධ ප්‍රකාශයන්ට ප්‍රතිචාර දැක්වීමක දී හැර (ශාස්ත්‍රීය සහ වැඩ කටයුතුවල සාමාන්‍ය විස්තරවලට විරුද්ධ ලෙස යම් විභාගවෙමින් පවතින කාරණයේ විශේෂ සිද්ධි පිළිබඳව) ප්‍රසිද්ධියේ අදහස් දැක්වීම නොකළ යුතු ය.

(7) උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදුකරනු ලැබ ඇති බවට සොයාගනු ලැබ ඇති ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා බාලවයස්කාරයකු ආරක්ෂිත තැනැත්තකු හෝ විනෝදාත්මක ක්‍රීඩකයකු වන අවස්ථාවක දී, 86 (2) වන රීතිය අනුව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු ය. බාලවයස්කරුවකු ආරක්ෂිත තැනැත්තකු හෝ විනෝදාත්මක ක්‍රීඩකයකු සම්බන්ධ වන කාරණාවක දී මනාපය පරිදි සිදුකරන යම් ප්‍රසිද්ධ හෙළිකිරීමක් කාරණයේ සිද්ධිවලට සහ අවස්ථානුගත කරුණුවලට සමානුපාතික විය යුතු ය.

<u>සංඛ්‍යානමය වාර්තාව</u>

87. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සපයන පිටපතක් සමඟ එහි උත්තේජක පාලන කටයුතුවල සාමාන්‍ය සංඛ්‍යානමය වාර්තාවක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අවම වශයෙන් වසරක් පාසාවත් ප්‍රසිද්ධියේ පත් කළ යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එක් එක් පරීක්ෂණයේ දිනයන් සහ පරීක්ෂා කළ ක්‍රීඩකයන්ගේ නම් දක්වා වාර්තා ද පළකල යුතු ය.

<u>උත්තේජක පාලන තොරතුරු දත්ත සමුදාය සහ අනුකූලතා පාලනය කිරීම</u>

88. (1) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට එහි අනුකූලතා පාලන කාර්යභාරය ඉටු කිරීමට හැකි කරවීමට සහ උත්තේජක මර්දන සංවිධාන අතර අදාළ උත්තේජක මර්දන තොරතුරු හුවමාරු කර ගැනීම සහ සම්පත්වල ඵලදායී භාවිතය සහතික කිරීමට,-

(අ) ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් සහ ජාතික මට්ටමේ ක්‍රීඩකයන් සඳහා ජීව විද්‍යාත්මක බලපාන දත්ත;

(ආ) ලියාපදිංචි පරීක්ෂණ සංචිතයේ සිටින අය ඇතුළුව ක්‍රීඩකයන් සඳහා ස්ථානීය තොරතුරු;

(ඇ) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන තීරණ; සහ

(ඈ) ප්‍රතිඵල කළමනාකරණ තීරණ

ඇතුළුව උත්තේජක පාලන ආශ්‍රිත තොරතුරු අනුගමනය කරමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන සහ කළමණාකරණ පද්ධති හරහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම් දිය යුතු ය.

(2) පිළියෙල කරන ලද පරීක්ෂණ බෙදාහැරීමේ සැලසුම්වලදී පහසුකම් සැලැස්වීමට, විවිධ උත්තේජක මර්දන සංවිධාන විසින් පරීක්ෂණ කිරීමේ දී අනවශ්‍ය නැවත නැවතත් සිදුවන පරීක්ෂා කිරීම් වැළැක්වීමට, ක්‍රීඩකයාගේ ජීව විද්‍යාත්මක බලපත්‍ර අංශ යථාවත් කිරීමට උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන සහ කළමනාකරණ පද්ධතියට උත්තේජක පාලන ආකෘති ඇතුළත් කරමින් තරග තුළ දී සහ තරගවලින් බැහැරව සිදු කරනු ලබන සියලු පරීක්ෂණ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම් දිය යුතු ය.

(3) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියේ අඩංගු නියමයන්ට අනුකූලව උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන සහ කළමනාකරණ පද්ධතිය භාවිත කරමින් චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධීක්ෂණය සහ අභියාචන අයිතිවාසිකම් සලසා දීමට චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන සියලු ඉල්ලීම්, තීරණ සහ ආධාරක ලේඛන ලබා දිය යුතු ය.

(4) ප්‍රතිඵල කළමනාකරණය සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධීක්ෂණය සහ අභියාචන අයිතීන්වලට පහසුකම් සැලැස්වීමට ප්‍රතිඵල කළමනාකරණය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියේ දක්වා ඇති කාලසීමා සහ නියමවලට අනුකූලව පහත දැක්වෙන තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලන සහ කළමනාකරණ පද්ධතියට දැනුම් දිය යුතු ය.

(අ) අහිතකර විශ්ලේෂණ තීරණ සඳහා උත්තේජක මර්දන රීති උල්ලංඝනය සහ ආශ්‍රිත තීරණවල දැනුම් දීම්;

(ආ) අහිතකර විශ්ලේෂණ තීන්දු නොවන වෙනත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය සඳහා වන දැනුම් දීම් සහ අදාළ තීරණ;

(ඇ) වතගොත පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් වන අසමත්වීමක්; සහ

(ඈ) තාවකාලික තහනමක් නියම කරන, ඉවත් කරන, නැවත ස්ථාපිත කරන යම් තීරණයක්

(5) මේ රීතියෙන් විස්තර කර ඇති තොරතුරු අදාළ රීති සමඟ උචිත හා අනුකූල වන අවස්ථාවක දී ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාතික උත්තේජක මර්දන සංවිධානයට, ජාත්‍යන්තර සම්මේලනයට සහ ක්‍රීඩකයා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමේ බලය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානවලට එම තොරතුරු ලබා ගත හැකි ය.

<u>දත්තවල පෞද්ගලිකත්වය</u>

89. (1) උත්තේජක මර්දනය සම්බන්ධයෙන් වන යම් ක්‍රියාවක් නීති සංග්‍රහය යටතේ, ජාත්‍යන්තර ප්‍රමිතීන්, මෙම උත්තේජක මර්දන රීති සහ අදාළ කර ගත හැකි නීතිවලට අනුකූලව සිදු කිරීට අවශ්‍ය සහ අදාළ වන අවස්ථාවන්හි දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඒ සම්බන්ධයෙන් එම ක්‍රීඩකයාට සහ අනෙක් තැනැත්තකුට අදාළ පුද්ගලික තොරතුරු රැස්කිරීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ හෙළිදරව් කිරීම කළ හැකි ය.

(2) කලින් සඳහන් කරුණුවලින් සීමා නොවී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්

(අ) වලංගු නීති පසුබිමට අනුකූලව පමණක් පුද්ගලික තොරතුරු සකස් කිරීම;

(ආ) මෙම උත්තේජක මර්දන රීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ අනෙක් තැනැත්තකු ඔවුන්ගේ පුද්ගලික තොරතුරුවල රහසිගතබව සහ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා අද ාළ නීති සහ ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල ආකාරයකින් සහ ආකෘතියකින් මෙම උත්තේජක මර්දන රීතිවලට යටත් වන යම් සහභාගිකරුවකුට හෝ තැනැත්තකුට දැනුම් දීම් සිදු කිරීම;

(ඇ) යම් තුන්වන පාර්ශවයේ නියෝජිතයකුට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, යම් සහභාගිකරුවෙකුගේ හෝ තැනැත්තකුගේ පුද්ගලික තොරතුරු (යම් නියෝජිත තුන්වන පාර්ශ්වයක් ඇතුළුව) බෙදා හැරීම ඒ තොරතුරුවල රහසිගතභාවය සහ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීමට සුදුසු තාක්ෂණික සහ ගිවිසුම්ගත පාලනයට යටත් කරනු ලැබීම,

සිදු කරනු ලැබිය යුතු ය.

<u>තීන්දු ක්‍රියාත්මක කිරීම</u>

90. (1) උත්තේජක මර්දන සංවිධානයක, (නීති සංග්‍රයේ 13.2.2 වන ව්‍යවස්ථාවල) අභියාචනා මණ්ඩලයක හෝ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයක පාර්ශවකරුවකු විසින් ලබාදුන් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සම්බන්ධයෙන්, නඩු කටයුත්තකට සම්බන්ධ පාර්ශ්වයන්ට දැනුම් දීමෙන් පසුව, සෑම ක්‍රීඩාවකම සියලු පාර්ශ්වකරුවන් මෙන්ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන

නියෝජ්‍යායතනය සහ යම් ජාතික සංගමයක් වෙත නඩු කටයුත්තකට අදාළ පාර්ශ්වයන් ඉක්මවා පහත දක්වා ඇති ප්‍රතිඵල සමඟ නිතැනින්ම බැඳී පැවතිය යුතු ය.

(අ) ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු ඕනෑම පාර්ශ්වකරුවකුගේ බලය යටතේ තාවකාලික තහනම් කාලය තුළ (61(1) වන රීතියේ විස්තර කර ඇති පරිදි) සියලු ක්‍රීඩාවලට සහාභාගී වීම ස්වයංක්‍රීයව (තාවකාලික නඩු විභාගය කිරීමෙන් අනතුරුව හෝ ක්‍රීඩකයා හෝ අනෙකුත් තැනැත්තා විසින් 33(1) වන රීතිය යටතේ පිරිනමනු ලබන තාවකාලික තහනම් පිළිගනු ලැබ ඇතිනම් හෝ වේගවත් කරන ලද නඩු විභාගයකට හෝ වේගවත් කරන ලද අභියාචනයකට ඇති අයිතිය අතහැර දමනු ලැබීමෙන් පසු) වැළැක්වීමට ඉහත විස්තර කරන ලද ආයතන මගින් පනවනු ලබන තාවකාලික නියෝගයක්;

(ආ) තහනම් කාලසීමාවක් සඳහා යම් පාර්ශ්වකරුවකුගේ අධිකාරි බලය ඇතුව සියලු ක්‍රීඩාවලට (61(1) වන රීතියේ විස්තර කර ඇති පරිදි) සහභාගි වීමෙන් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තකු ස්වංක්‍රීයව වළක්වනු ලබන (අත්හැර ඇති හෝ පැවති විභාග කිරීමකින් පසුව) තහනම් කාලසීමාවක් පනවන ඉහත විස්තර කළ යම් මණ්ඩලයක තීරණයක්;

(ඇ) සියලු පාර්ශ්වකරුවන් නිතැතින්ම බැඳී සිටින උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් පිළිගන්නා ඉහත විස්තර කළ යම් මණ්ඩලයක තීරණයක්;

(ඈ) නිශ්චිත කාලසීමාවක් තුළ යම් පාර්ශවකරුවකුගේ අධිකාරි බලය ඇතිව ලබාගත් සියලු තොරතුරු යම් නිශ්චිත කාලසීමාවක් සඳහා නිතැතින්ම නුසුදුසු කර වීම සඳහා 55 වන රීතිය යටතේ ප්‍රතිඵල නුසුදුසු කරවීමට ඉහත සඳහන් විස්තර යම් මණ්ඩලයක තීරණයක්.

(2) තීරණයේ සත්‍ය දැන්වීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ලැබෙන දින හෝ උත්තේජක මර්දන පිළිබඳ පරිපාලන සහ කළමනාකරණ පද්ධතියට යොමු කරනු ලබන දිනයට පෙරාතුව දිනයක දී යම් නියම කළ ඉදිරි ක්‍රියාමාර්ග යකින් තොරව 90(1) වන රීතියෙන් නියම කර ඇති පරිදි එම තීරණය සහ එම තීරණයේ ප්‍රතිඵලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා සංගමයක් විසින් පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු ය.

(3) ප්‍රතිවිපාක තහනමක් හෝ ඉවත් කිරීමක් උත්තේජක මර්දන සංවිධානයක් විසින්, අභියාචනා මණ්ඩලයක් හෝ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයක් විසින් ලබාදෙනු ලබන තීරණයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ ශ්‍රී ලංකාවේ යම් ජාතික සම්මේලනයක් විසින් උත්තේජක මර්දනය පිළිබඳව පරිපාලන සහ කළමනාකරණ පද්ධතියට තීරණය යොමු කරන ලද දිනය හෝ තීරණය පිළිබඳ සත්‍ය දැන්වීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට කලින්ම ලැබෙන දිනයට, වෙනත් වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව බැඳී සිටිය යුතු ය.

(4) 90(1) වන රීතියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කඩිනම් නොවන ක්‍රියාපටිපාටියක් යටතේ අභියාචන කිරීමේ අවස්ථාවක් ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තකුට ප්‍රධාන ඉසව් සංවිධාන රීතිවලින් සැලසී ඇතිනම් මිස, කඩිනම් ක්‍රියාවලියක් තුළින් ප්‍රධාන ඉසව් සංවිධානයක් විසින් සිදු කරන උත්තේජක මර්දන රීති උල්ලංඝනය සම්බන්ධයෙන් වන තීරණයකින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හෝ ශ්‍රී ලංකා ජාතික සම්මේලනය බැඳී නොසිටිය යුතු ය.

<u>උත්තේජක මර්දන සංවිධාන විසින් වෙනත් තීරණ ක්‍රියාත්මක කිරීම</u>

91. ක්‍රීඩකයා හෝ අනෙත් තැනැත්තා විසින් තාවකාලික විභාගයකට හෝ පිළිගැනීමකට පෙරාතුව තාවකාලික තහනමක් ලෙස ඉහත 90(1) වන රීතියේ විස්තර කර නොමැති උත්තේජක මර්දන සංවිධානවලින් දෙන ලද වෙනත් උත්තේජක මර්දන තීරණ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ වෙනත් ශ්‍රී ලංකා ජාතික සම්මේලනයක් විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

<u>පාර්ශ්වකරුවකු නොවන මණ්ඩලයක් විසින් තීරණ ක්‍රියාත්මක කිරීම</u>

92. යම් තීරණයක් නීති සංග්‍රහයට අන්‍යාකාරයකින් අනුකූල වන පාර්ශවකරුවක නොවන මණ්ඩලයක උත්තේජක මර්දන රීති සහ ඒ මණ්ඩලයේ අධිකාරිය තුළ අරමුණු කළ යුතු තීරණයක් බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිශ්චය කරනු ලබන්නේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ වෙනත් ශ්‍රී ලංකා ජාතික සම්මේලනයක් විසින් නීති සංග්‍රහයට පාර්ශ්වකරුවකු නොවන මණ්ඩලයකින් දෙන ලද උත්තේජක මර්දන තීරණයක් ක්‍රියාත්මක කළ හැකි ය.

ව්‍යවස්ථා සීමා

93. ප්‍රකාශිත උල්ලංඝනය සිදු වී ඇති දිනයේ සිට වසර දහයක (10) කාලසීමාව තුළ ඔහු හෝ ඇය විසින් දැනුම් දීමකට සාධාරණව උත්සාහ කර ඇති නම් හෝ 28 වන රීතියේ විධිවිධාන සලසා ඇති පරිදි උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් දැනුම් දෙනු ලැබ ඇත්නම් මිස, ක්‍රීඩකයකුට හෝ අනෙක් තැනැත්තකුට එරෙහිව කිසිදු උත්තේජන මර්දන රීති උල්ලංඝන නඩු කටයුත්තක් ආරම්භ කළ නොහැකි ය.

අධ්‍යාපනය

94. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, අධ්‍යාපනය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නීති සංග්‍රහයේ 18.2 වන ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව අධ්‍යාපනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීමට ලක් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කළ යුතු ය.

ජාතික සම්මේලනවල අතිරේක කාර්යභාරය සහ වගකීම්

95. (1) ජාත්‍යන්තර සම්මේලනයේ ප්‍රමිති සහ මෙම උත්තේජක මර්දන රීති සමඟ ශ්‍රී ලංකා සියලු ජාතික සම්මේලන සහ ඔවුන්ගේ සාමාජිකයන් අනුකූල විය යුතු ය. මෙම උත්තේජක මර්දන රීතිවල හැඳින්වීමේ දී නිශ්චිතව දක්වා ඇති පරිදි, ඔවුන්ගේ උත්තේජක මර්දන අධිකාරිය යටතේ ක්‍රීඩකයා සහ අනෙක් තැනැත්තන් සම්බන්ධයෙන් කෙලින්ම (පරීක්ෂණ කරගෙන යාම ඇතුළුව) මෙම උත්තේජක මර්දන රීති බලාත්මක කිරීම ශ්‍රී ලංකා ජාතික උත්තේජක මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වගකීම සහ අධිකාරී බලය පිළිගැනීමට අවශ්‍ය විධිවිධාන, වැඩසටහන් සහ රීති ශ්‍රී ලංකා සියලු ජාතික සම්මේලන සහ අනෙක් සාමාජිකයන්, ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුවෙන් සහ/හෝ ශ්‍රී ලංකා රජයෙන් වෙනත් සහායක් සහ/හෝ මුදල් ලැබීමේ කොන්දේසියක් ලෙස මෙම උත්තේජක මර්දන රීති සහ ශ්‍රී ලංකා ජාතික උත්තේජක මර්දන වැඩසටහන්වල නියමයන් සහ හරයන් එක් එක් ශ්‍රී ලංකා ජාතික සම්මේලනය විසින් පිළිගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ එක් එක් ජාතික සම්මේලනයන් විසින් කෙලින්ම නැතහොත් එහි පාලන ලේඛනවල සඳහනකින්, ව්‍යවස්ථාව මගින් සහ / හෝ ක්‍රීඩා රීතිවල කොටසක් ලෙස එහි සාමාජිකයන් බැඳී සිටින රීති මගින් මෙම රීති සංස්ථාපනය කළ යුතු ය. ජාතික සම්මේලනය මගින් උත්තේජක මර්දන අධිකාරිය යටතේ එවැනි රීති, ක්‍රීඩකයන් සහ අනෙක් තැනැත්තන් සම්බන්ධයෙන් කෙලින්ම බලාත්මක කළ හැකි ය.

(4) ජාතික සම්මේලනය විසින් මෙම උත්තේජක මර්දන රීති පිළිගැනීමෙන් සහ ඔවුන්ගේ පාලන ලේඛනවලට, ක්‍රීඩා රීතිවලට ඒවා සංස්ථාගත කිරීමෙන් සහ ඒ කර්තව්‍යයන්වලදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහාය ලබා දී ඒ හා සහයෝගයෙන් කටයුතු කළ යුතු ය. ජාතික සම්මේලනයේ අධිකාරිය යටතේ එම තැනැත්තන් මත පනවන දඬුවම් ඇතුළුව මෙම උත්තේජක මර්දන රීතිවලට අනුකූලව සිදුකළ තීරණයන් ඔවුන් විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමෙන් ඒ අනුව කටයුතු කළ යුතු ය.

(5) ශ්‍රී ලංකා ජාතික සම්මේලනය විසින් වෙනත් දේ අතර -

(අ) ජාත්‍යන්තර සම්මේලනයේ ලේඛනගත බලය යටතේ පමණක් පරීක්ෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වෙනත් දත්ත එකතු කිරීමේ බලය ඇති ආයතනයක් යොදා ගනිමින් පරීක්ෂණ සිදු කිරීමෙන්;

(ආ) ඔවුන්ගේ ක්‍රීඩා සඳහා ජාතික පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමඟ සුදුසු පරිදි සහාය දක්වමින් සහ නීති සංග්‍රහයේ 5.2.1 වන ව්‍යවස්ථාවලට අනුකූලව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධිකාරී බලය පිළිගැනීමෙන්;

(ඇ) 28(1) වන රීතියට අනුකූලව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කළ හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිළිගත් පරීක්ෂණාගාරයක් භාවිත කරමින් එකතු කළ සියලු නියැදි විශ්ලේෂණය කිරීමෙන්; හෝ

(ඈ) ප්‍රතිඵල කළමනාකරණය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතිය සහ 38(2) වන රීතිය හා අනුකූලව ක්‍රියාකාරී ස්වාධීන විමසුම් මණ්ඩලයකින් ජාතික සම්මේලනය විසින් සොයාගත් ජාතික මට්ටමේ උත්තේජක මර්දන රීති උල්ලංඝන තීරණ විනිශ්චය කරන බවට තහවුරු කිරීමෙන්,

මෙම උත්තේජක මර්දන රීති ජාත්‍යන්තර ප්‍රමිති සහ නීති සංග්‍රහයට අනුකූලව බලාත්මක කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය.

(6) යම් සහභාගී වීමක කොන්දේසියක් ලෙස නීති සංග්‍රහයට අනුකූලව උත්තේජක මර්දන සංවිධානයක ප්‍රතිඵල කළමනාකරණ අධිකාරියට භාරදීමට සහ මෙම උත්තේජක මර්දන රීතිවලින් බැඳී සිටිය යුතු බවට එකඟ වීමට ඒ ක්‍රීඩකයන් හා සම්බන්ධ සියලු ක්‍රීඩා සහායකයන් සහ ජාතික සම්මේලනයේ හෝ එහි සාමාජික සංවිධානවලින් එකක් විසින් සංවිධානය තුළ හෝ බලය දුන් තරඟයකට හෝ ක්‍රියාකාරකමකට සියලු ක්‍රීඩකයන් සහභාගී කරවීම සඳහා හෝ සහභාගී කරවීමේ දී, ප්‍රදානය කිරීමේ දී, අවශ්‍ය කරන රීති ජාතික සම්මේලනය විසින් ස්ථාපිත කළ යුතු ය.

(7) සෑම ජාතික සම්මේලනයක් විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනයට අදාළ වන හෝ යෝජනා කරන ඒ හා සම්බන්ධ ඕනෑම තොරතුරක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ ඔවුන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට දැනුම් දිය යුතු අතර විමර්ශනය පැවැත්වීමට බලය ඇති යම් උත්තේජක මර්දන සංවිධානයක් විසින් පවත්වනු ලබන විමර්ශනය හා සහයෝගීව ක්‍රියා කළ යුතු ය.

(8) සියලු ජාතික සම්මේලනවලට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ ජාතික සම්මේලනයේ අධිකාරි බලය යටතේ ක්‍රීඩකයකුට සහාය සැපයීමේ වලංගු හේතුවක් නොමැතිව තහනම් ක්‍රම හෝ තහනම් ද්‍රව්‍ය භාවිත කරන ක්‍රීඩා සහායක තැනැත්තකු වැළැක්වීමට සුදුසු විනය රීති තිබිය යුතු ය.

(9) සියලු ජාතික සම්මේලන විසින්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සම්බන්ධීකරණය ඇතිව උත්තේජක මර්දනය පිළිබඳ අධ්‍යාපනය පවත්වාගෙන යා යුතු ය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ (SLADA) අතිරේක කාර්යභාරය සහ වගකීම**

96\. (1) ජාතික උත්තේජක මර්දන සංවිධානය සඳහා වන නීති සංග්‍රහයේ 20.5 ව්‍යවස්ථාවේ විස්තර කර ඇති කාර්යභාරය සහ වගකීම්වලට අමතරව නීති සංග්‍රහයේ 24.1.2 වන ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, නීති සංග්‍රහයට සහ ජාත්‍යන්තර ප්‍රමිතිවලට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය දක්වනු ලබන අනුකූලතාවය ලෝක උත්තේජක මර්දන සංවිධානයට වාර්තා කළ යුතු ය.

(2) නීති සංග්‍රහයේ 20.5.10 වන ව්‍යවස්ථාවට අනුව සහ අදාළ නීතිවලට යටත්ව නීති සංග්‍රහයට අනුකූලතාවයක් දක්වමින් සෘජු සහ සිතාමතාම සිදු කරනු ලබන විෂමාචාර සඳහා වූ උත්තේජක මර්දන රීතිවලින් පුද්ගලිකව බැඳී සිටීමට එකඟවෙමින්, යම් උත්තේජක පාලන අරමුණකට සම්බන්ධ වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සියලු මණ්ඩල සාමාජිකයන්, අධ්‍යක්ෂවරු, නිලධරයන් සහ (පත්කළ තෙවැනි නියෝජිත පාර්ශ්වවයන්ගේ) එවැනි සේවකයන් විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සපයනු ලබන පෝරමයකට අත්සන් කළ යුතු ය.

(3) (පුනරුත්ථාපන වැඩසටහන් හෝ බලයලත් උත්තේජක මර්දන අධ්‍යාපනය හැර) උත්තේජක මර්දනය පාලනයට සම්බන්ධ වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ යම් සේවකයකු විසින් නීති සංග්‍රහයේ 20.5.11 වන ව්‍යවස්ථාවට අනුකූලව සහ අදාළ නීතිවලට යටත්ව, නීති සංග්‍රහයට අනුකූල රීති ඔවුන්ට අද ාළව තිබුණේ නම් උත්තේජක රීති උල්ලංඝනයක් සිදුවිය හැකිව තිබූ පසුගිය වසර හයක (6) කාලය තුළ කෙලින්ම හෝ හිතාමතාම සම්බන්ධ වී නොමැති බවට සහ ඔවුන් තාවකාලිකව තහනම් කළ හෝ තහනම් කාලසීමාවක් ගත නොකරන බවට සහතික කරමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සපයන ලද ප්‍රකාශයකට, අත්සන් තැබිය යුතු ය.

<u>ක්‍රීඩකයන්ගේ අතිරේක කාර්යභාරය සහ වගකීම</u>

97\. සෑම ක්‍රීඩකයකු ම -

(අ) මෙම උත්තේජක මර්දන රීති පිළිබඳ දැනුම්වත්ව ඒවාට අනුකූල වීම;

(ආ) සියලු අවස්ථාවලදී නියැදි ලබා ගැනීම සඳහා ඉදිරිපත් වීම;

(ඇ) ඔවුන් විසින් ආමාශගත කරනු ලබන සහ භාවිත කරනු ලබන දෑ පිළිබඳව වගකීම දැරීම;

(ඈ) ලබාගන්නා යම් වෛද්‍ය ප්‍රතිකාරයක් මෙම උත්තේජක මර්දන රීති උල්ලංඝනය නොකරන බවට සහතික වීමට වගකීම භාර ගැනීමට සහ තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම භාවිත නොකරන බවට ඔවුන් යටත් වන්නා වූ බව වෛද්‍ය කාර්ය මණ්ඩලයට දැනුම් දීම;

(ඉ) පසුගිය වසර දහයක (10) කාලය තුළ ක්‍රීඩකයා විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් කර ඇති බවට පාර්ශ්වකරුවකු නොවන තැනැත්තකුගේ යම් තීරණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ ජාත්‍යන්තර සම්මේලනයට හෙළිකිරීම

(ඊ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය සම්බන්ධ විමර්ශනයකදී උත්තේජක මර්දන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, උත්තේජක මර්දන රීති උල්ලංඝනය පිළිබඳ විමර්ශනයක දී උත්තේජක මර්දන සංවිධාන සමඟ සම්පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීමට යම් ක්‍රීඩකයකු විසින් අපොහොසත් වීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ වන උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් වීම;

(උ) ක්‍රීඩකයා පිළිබඳ බලය පවතින වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානයක් හෝ ජාතික සම්මේලනයක් හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ඉල්ලීම මත ඔවුන්ගේ ක්‍රීඩා සහායක තැනැත්තකුගේ අනන්‍යතාවය හෙළිකිරීම; සහ

(ඌ) අන්‍යාකාරයකින් වන මැදිහත්වීමක් නොවන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ (විෂමාචාර චෝදනාවක් නොවන) උත්තේජක මර්දනය සම්බන්ධයෙන් වන, ක්‍රීඩකයකු ආමාශගත කරනු ලබන්නේ සහ භාවිත කරනු ලබන්නේ මොනවාද යන්න සම්බන්ධයෙන් උත්තේජක මර්දන නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු අරබයා සිදු කරනු ලබන වරදක්,

එම ක්‍රීඩකයාගේ අතිරේක කාර්ය භාර්ය සහ වගකීම වන්නේ ය.

<u>ක්‍රීඩා සහායක තැනැත්තන්ගේ අතිරේක කාර්යභාරයන් සහ වගකීම්</u>

98. සෑම ක්‍රීඩා සහායක තැනැත්තකු ම:-

(අ) මෙම උත්තේජක මර්දන රීති පිළිබඳ දැනුවත් වී ඒවාට අනුකූල වීම;

(ආ) ක්‍රීඩයන්ගේ පරීක්ෂණ සම්බන්ධ වැඩසටහන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඇ) උත්තේජක මර්දන විරෝධී ආකල්ප ඇති කිරීම සඳහා ක්‍රීඩක වටිනාකම් සහ චර්යාවන් සම්බන්ධයෙන් ක්‍රීඩා සහායක තැනැත්තන්ගේ බලපෑම ක්‍රියාවේ යෙදවීම;

(ඈ) පසුගිය වසර දහය (10) ඇතුළත උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් ක්‍රීඩා සහායක තැනැත්තන් විසින් සිදුකර නොමැති බවට තීරණය කරන පාර්ශ්වකරුවකු නොවන තැනැත්තකුගේ යම් තීරණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හෝ ක්‍රීඩා සහායක තැනැත්තන්ගේ ජාත්‍යන්තර සම්මේලකයට හෙළි කිරීම;

(ඉ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනයක දී උත්තේජක මර්දන විරෝධි සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම.

ක්‍රීඩා සහායක තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සම්බන්ධ විමර්ශනයක දී උත්තේජක මර්දන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අපොහොසත්වීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජනායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ විෂමාචාර චෝදනා ප්‍රතිඵල ලබාදිය හැකි ය. මර්දන සංවිධාන සමඟ සම්පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීමට යම් ක්‍රීඩා සහායක තැනැත්තකු විසින් අසමත් වීමක්;

(ඊ) වලංගු හේතුවක් නොමැතිව යම් තහනම් හෝ තහනම් ද්‍රව්‍යයක් භාවිතයෙන් හෝ සන්තකයේ තබා ගැනීමෙන් වැළකීම, එවැනි යම් භාවිතයත් හෝ සන්තකයේ තබා ගැනීමක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ විෂමාචාර චෝදනාවක් ලෙස උද්ගත විය හැකි වීම;

(උ) ක්‍රීඩා සහායක තැනැත්තකු විසින් අයුතු මැදිහත් වීමක් සංස්ථාපනය නොවන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ විෂමාචාර චෝදනාවක් උද්ගත විය හැකි උත්තේජක පාලනයට සම්බන්ධ වූ උත්තේජක පාලන නිලධරයකු හෝ අනෙත් තැනැත්තකු අරභයා සිදු කරන යම් වරදකින් වැළකී සිටීම,

එම තැනැත්තාගේ කාර්ය භාර්යක් සහ වගකීමක් විය යුතු ය.

<u>මෙම උත්තේජක මර්දන රීතිවලට යටත් වන අනෙක් තැනැත්තන්ගේ අතිරේක කාර්යභාරයන් සහ වගකීම්</u>

99. උත්තේජක මර්දන රීතිවලට යටත් වන අනෙක් තැනැත්තන් විසින් -

(අ) උත්තේජක මර්දන රීති පිළිබඳ දැනුවත්ව ඒවාට අනුකූල වීම;

(ආ) පසුගිය වසර දහය (10) තුළ අනෙක් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් කළ බවට තීරණය කරන පාර්ශ්වකරුවකු නොවන්නකුගේ යම් තීරණයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහ එම තැනැත්තන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට හෙළිකළ යුතු වීම;

(ඇ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනවල දී උත්තේජක මර්දන සංවිධාන සමඟ සහයෝග යෙන් ක්‍රියා කිරීම. වෙනත් යම් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සම්බන්ධ විමර්ශනයක දී උත්තේජක මර්දන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අපොහොසත්වීම, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ විෂමාචාර චෝදනා ප්‍රතිඵල ලබාදිය හැකි ය;

(ඈ) වලංගු හේතුවක් නොමැතිව තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම භාවිතා කිරීම හෝ සන්තකයේ නොගැනීම;

(ඉ) යම් තැනැත්තකු විසින් අන්‍යාකාරයේ අයුතු මැදිහත්වීමක් සංස්ථාපනය නොවන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ආචාරධර්ම සංග්‍රහය යටතේ විෂමාචාර චෝදනාවක් උද්ගත විය හැකි, අන්‍යාකාරයේ අයුතු මැදිහත් වීම නිසා සංස්ථාපනය නොවන, උත්තේජක පාලනයට සම්බන්ධ උත්තේජක පාලන නිලධරයකු හෝ අනෙක් තැනැත්තකු අරභයා සිදු කරන වරදක්,

එම අනෙක් තැනැත්තන්ගේ කාර්ය භාර්ය සහ වගකීම විය යුතු ය.

100. මෙම උත්තේජක මර්දන රීති (මින් මතු ''ක්‍රියාත්මක වන දිනය'' ලෙස හඳුන්වනු ලබන) මස වන දිනයේ සිට ක්‍රියාත්මක වූ සේ සලකනු ලැබිය යුතු ය. ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සිදුවූ කරුණු සම්බන්ධයෙන් මෙම රීති අතීතයට බලපාන පරිදි අදාළ නොවිය යුතු ය. එසේ වී නමුදු :-

(අ) 45 වන රීතියේ සිට 65 වන රීතිය දක්වා වූ රීති යටතේ ක්‍රියාත්මකවන දිනයෙන් පසුව සිදුවන උල්ලංඝනවලදී යම් තහංචියක් නිශ්චය කිරීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සිදුවන යම් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් ''පළමු උල්ලංඝනය'' හෝ ''දෙවන උල්ලංඝනය'' ලෙස සැලකිය යුතු ය;

(ආ) නඩුව විභාග කරනු ලබන මණ්ඩලය විසින් එම නඩු අවස්ථානුගත කරුණු යටතේ ''lex mitior'' මූලධර්මය නිසිලෙස අදාළ වන බව තීරණය කරන්නේ නම් මිස, ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සිදු වූ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් මත පදනම් වූ ක්‍රියාත්මක වන දිනයට පසුව ඉදිරිපත් කළ යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සහ ක්‍රියාත්මක වන දිනයට නොවිසඳා පවතින යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් එම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු වූ අවස්ථාවේ ක්‍රියාත්මකව පැවති උත්තේජක මර්දන රීති යටතේ මිස මෙම රීති යටතේ සාදා ඇති උත්තේජක මර්දන රීති යටතේ පාලනය නොවිය යුතු ය. 53(6)(ඇ) වන රීතිය යටතේ වන බහු විධ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් සඳහා සහ 93 වන රීතිය යටතේ වන ව්‍යවස්ථා සීමා පටිපාටිය රීතිවල කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු පූර්ව උල්ලංඝනවල අතීතයට බලපාන කාලසීමාවක් සඳහා පටිපාටිය නීති මිස හරවත් නීති අදාළ කර ගත නොගත යුතු ය. (කෙසේ වුවද, ක්‍රියාත්මක වන දිනයෙන් සංස්ථා සීමා කාලය දැනටමත් ඉකුත්වී ඇත්නම්, කෙසේ හෝ එම 93 වන රීතිය පමණක් අතීතයේ සිට බලපැවැත්වෙන පරිදි අදාළ කරගනු ලැබිය යුතු ය;

(ඇ) ක්‍රියාත්මකවන දිනට පෙර සිදු වූ ඕනෑම වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අතපසු වීමක් (ප්‍රතිඵල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතිවල අර්ථ නිරූපනය කළ හැකි පරිදි අනුව ගොනු කිරීමට අතපසුවීමක් හෝ අතපසු වූ පරීක්ෂණයක්) සම්බන්ධයෙන් වන ප්‍රතිඵල කළමණාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව කල් ඉකුත් වීමට පෙර විශ්වාස තැබිය හැකි වන අතර සහ එය ඉදිරියට රැගෙන යා හැකි ය. එහෙත් එම සිදුවීම සිදුවී මාස දොළහක් (12) ගතවීමෙන් පසු එය කල් ඉකුත් වූ වා සේ සැලකිය යුතු ය;

(ඈ) ක්‍රියාත්මක දිනයට පෙරාතුව උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අවසන් තීන්දුවක් ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක එහෙත් ක්‍රියාත්මක දිනය වන විට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා තවමත්

අයෝග්‍යතා කාලසීමාවක පසු වන්නේ නම්, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් මෙම උත්තේජක මර්දන රීති අනුව එකී අයෝග්‍යතා කාලසීමාව අඩු කරන ලෙස ඉල්ලා ප්‍රතිඵල කළමනාකරණ වගකීම ඇති අදාළ උත්තේජක මර්දන සංවිධානයට හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

එවැනි ඉල්ලීමක්, අයෝග්‍යතා කාලසීමාව කල් ඉකුත්වීමට පෙර සිදු කළ යුතු ය. එම තීරණය සම්බන්ධයෙන් 70 වන රීතියට අනුව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එසේ වුව ද, උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමට අදාළ අවසන් තීන්දුවක් ලබා දී ඇති අවස්ථාවක සහ අයෝග්‍යතා කාලසීමාව ඉකුත් වූ අවස්ථාවක කිසිදු නඩුවක් සම්බන්ධයෙන් මෙම උත්තේජක මර්දන රීති අදාළ නොවේ;

(ඉ) ක්‍රියාත්මකවන දිනයට පෙරාතුව බලපවත්වන ලද රීති පදනම් කරගෙන පළමු උල්ලංඝනය සඳහා දඬුවම් තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී, 53(1) වන රීතිය යටතේ දෙවැනි උල්ලංඝනයක් සම්බන්ධයෙන් අයෝග්‍යතා කාලසීමාව තක්සේරු කිරීමේ කාර්යය සඳහා මෙම උත්තේජක මර්දන රීති අදාළව තිබුනේ නම්, පළමු උල්ලංඝනය කිරීම සඳහා තක්සේරු කිරීමට තිබූ අයෝග්‍යතා කාලය අදාළ කර ගනු ලැබිය යුතු ය;

(ඊ) අතීතයේ සිට බලපාන පරිදි අදාළ කරගත යුතු යයි අන්‍යාකාරයකින් ඔවුන් විසින් විශේෂයෙන් විධිවිධාන සලසා ඇතිනම් මිස තහනම් ලැයිස්තුවක වූ ද්‍රව්‍ය හෝ ක්‍රමවලට අදාළවන තාක්ෂණික ලේඛනවලට සහ තහනම් ලැයිස්තුවලට වෙනස් කිරීම් නොතිබිය යුතු ය. කෙසේ වුව ද, ව්‍යතිරේකයක් ලෙස අතීතයේ තහනම් කළ ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් හේතුවෙන් දැනට තහනම් කාලසීමාවක් විඳිමින් සිටින ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු විසින් තහනම් ලැයිස්තුවෙන් එම ද්‍රව්‍යය හෝ ක්‍රම ඉවත් කිරීම සහ තහනම් කාලසීමාවට අඩු කිරීමක් සලකා බැලීම සඳහා ප්‍රතිඵල කළමනාකරණ වගකීම පැවති ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හෝ වෙනත් තහනම් උත්තේජක සංවිධානයක් වෙත ඉල්ලුම් කළ හැකි ය.

101. අර්ථකතනය :-

මෙම රීතිවල කාර්යයන් සඳහා -

''තහනම් උත්තේජක පරිපාලන සහ කළමණාකරණ පද්ධතිය (ADAMS) යන්නෙන්, දත්ත ආරක්ෂා කරන නීති සමඟ සම්බන්ධ වී උත්තේජක මර්දන විරෝධී මෙහෙයුම්වල දී එයට සම්බන්ධ පාර්ශවයන්ට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සහාය ලබා දීමට දත්ත ඇතුළු කිරීමට, ගබඩා කිරීමට, හුවමාරු කිරීමට සහ වාර්තාකරණයට නිර්මාණය කළ වෙබ් අඩවියක් මත පදනම් වූ දත්ත සමුදාය කළමනාකරණ මෙවලමක් අදහස් වේ;

''පාලනය'' යන්නෙන්, තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් යම් තැනැත්තකු විසින් භාවිතයට තැත්කරන හෝ භාවිතයේ දී සැපයීම, සැලසීම, අධීක්ෂණය, පහසුකම් සැලසීම හෝ අන්‍යාකාරයකින් සහභාගී වීම අදහස් වේ;

''අහිතකර විශ්ලේෂණාත්මක තීරණ'' යන්නෙන් රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ අදාළ තාක්ෂණික ලිපි ලේඛනවලට අනුකූලව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කරන ලද වෙනත් රසායනාගාරයක් මගින් නියැදියක් තුළ තහනම් ද්‍රව්‍යයක් හෝ අන්තර්ජන්‍ය ද්‍රව්‍ය ඉහළ ප්‍රමාණයක් ඇතුළුව එහි සංඝටක හෝ එහි සලකුණු හෝ තහනම් ක්‍රමයක් භාවිතා කළ බවට සාක්ෂි සහිත වාර්තාවක් අදහස් වේ;

''අහිතකර බලපත්‍ර පිළිබඳ තීරණය'' යන්නේ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්වල විස්තර කර ඇති පරිදි අහිතකර බලපත්‍ර තීරණයක් ලෙස හඳුනාගත් වාර්තාවක් අදහස් වේ;

''බරපතල අවස්ථානුගත කරුණු'' යන්නෙන් සම්මත තහංචියට වඩා වැඩි නුසුදුසු කාලසීමාවක් පැනවීම සුදුසු විය හැකි වන ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තෙකු සම්බන්ධ වන අවස්ථානුගත කාරණා හෝ ක්‍රියාවන් අදහස් වේ. එවැනි අවස්ථානුගත කාරණා හෝ ක්‍රියාවන් විවිධ අවස්ථාවල දී බහු විධ තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම භාවිතා කරනු ලැබූ හෝ සන්තකයේ දැරූ ක්‍රීඩකයෙකුට හෝ අනෙක් තැනැත්තකුට සීමා නොවන අතර එහි එම කරුණු හෝ ක්‍රියා ඇතුළත් විය යුතු ය;

''උත්තේජක මර්දන කටයුතු'' යන්නෙන් උත්තේජක මර්දනය පිළිබඳ අධ්‍යාපනය සහ තොරතුරු, පරීක්ෂණ බෙදා හැරීමේ සැලසුම්, ලියාපදිංචි පරීක්ෂණ සංචිතයන් පවත්වාගෙන යාම, ක්‍රීඩා ජීව විද්‍යාත්මක බලපත්‍ර කළමනාකරණය, පරීක්ෂණ පැවැත්වීම, නියැදි විශ්ලේෂණ සංවිධානය කිරීම, බුද්ධි තොරතුරු රැස්කිරීම සහ විමර්ශන පැවැත්වීම, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධ ඉල්ලීම් සකස් කිරීම, ප්‍රතිඵල කළමනාකරණය අධීක්ෂණය සහ නියම කළ යම් ප්‍රතිඵල හා අනුකූලව බලාත්මක වීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ / හෝ නීති සංග්‍රහයේ දක්වා ඇති

පරිදි උත්තේජක මර්දන සංවිධානයක් විසින් හෝ ඒ මගින් කරගෙන යා යුතු තහනම් උත්තේජකවලට අදාළ වෙනත් සියලු කටයුතු ඇතුළත් වේ;

''උත්තේජක මර්දන සංවිධාන'' යන්නෙන්, උත්තේජක පාලන ක්‍රියාවලියට අදාළ ඕනෑම කොටසක් සම්බන්ධයෙන් වන රීති හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරන පාර්ශ්වකරුවෙකු අදහස් වේ. ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව, ඔවුන්ගේ තරගවල දී පරීක්ෂාවන් පවත්වන්නා වූ වෙනත් ප්‍රධාන තරග සංවිධාන, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය හා ජාත්‍යන්තර උත්තේජක මර්දන සංවිධාන මෙයට ඇතුළත් වේ;

''ක්‍රීඩකයා'' යන්නෙන්, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතුය;

''ක්‍රීඩකයාගේ ජීව විද්‍යාත්මක තොරතුරු බලපත්‍රය'' යන්නෙන්, පරීක්ෂාවන් හා විමර්ෂණ සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියේ සහ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියේ විස්තර කර ඇති පරිදි දත්ත රැස් කිරීමේ සහ සැසඳීමේ වැඩසටහන් සහ ක්‍රම සහ ක්‍රමවේදයන් අදහස් වේ;

''ක්‍රීඩා සහායක තැනැත්තෙකු'' යන්නෙන්, ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩකයකු සූදානම් කරවීමේ දී හෝ සහභාගී වීමේ දී එම ක්‍රීඩකයාට සත්කාර කරමින් හෝ සහාය දෙමින් වැඩ කරන ඕනෑම පුහුණුකරුවෙකු, පුහුණුවන්නෙකු, කළමනාකරුවෙකු, නියෝජිතයෙකු, කණ්ඩායමේ කාර්ය මණ්ඩලය, නිලධාරීන්, වෛද්‍යවරුන්, පරිපූරක වෛද්‍යවරුන්, දෙමාපියන් හෝ වෙනත් යම් අයෙක් අදහස් වේ;

''තැත්කිරීම'' යන්නෙන්, උත්තේජක මර්දන රීති උල්ලංඝනය සිදු කිරීමේ සැලසුම් කළ හැසිරීම් රටාවකින් සමන්විත වන සැලකිය යුතු පියවරක් සංස්ථාපනය වන හැසිරීමකට හිතාමතාම සම්බන්ධවීමක් අදහස් වේ. එසේ වුව ද, තැත් කිරීමකට සම්බන්ධ නොවන බවට තුන්වන පාර්ශ්වයක් විසින් සොයා ගනිමින් පැවතීමට පෙරාතුව ඒ තැනැත්තා තැත් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් වරදක් සිදු කිරීමට තැත් කිරීමක් මත පදනම් වූ කිසිදු උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සඳහා කිසිවිටෙක පැවැත්මක් නොතිබිය යුතු ය;

''අද්විතීය තීරණ'' යන්නෙන්, අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් තීන්දු කිරීමට පෙරාතුව ආශ්‍රිත තාක්ෂණික ලේඛන හෝ පරීක්ෂණාගාර සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඉදිරි විමර්ශන සඳහා අවශ්‍ය කරන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අනුමත කළ වෙනත් පරීක්ෂණාගාරයකින් හෝ ලෝක උත්තේජක මර්දන පරීක්ෂණාගාරයකින් පිළිගත් වාර්තාවක් අදහස් වේ;

''අද්විතීය බලපත්‍ර තීරණ'' යන්නෙන්, අදාළ ජාත්‍යන්තර ප්‍රමිතිය විස්තර කර ඇති පරිදි අද්විතීය බලපත්‍ර තීරණයක් ලෙස විස්තර කර ඇති වාර්තාවක් අදහස් වේ;

''බේරුම් අධිකරණයක් (CAS)'' යන්නෙන්, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ, එයට දී ඇති අර්ථයම තිබිය යුතුය;

''නීති සංග්‍රහය'' යන්නෙන්, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ, එයට දී කර ඇති අර්ථයම තිබිය යුතුය;

''තරගය'' යන්නෙන්, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එහෙි සම්මුති පනතේ, එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

''දූෂිත වූ නිෂ්පාදන'' නිෂ්පාදන ලේබලයේ හෝ ප්‍රමාණවත් අන්තර්ජාල සෝදිසියක පවතින තොරතුරුවලින් හෙළිදරව් කර නොමැති තහනම් ද්‍රව්‍යයක් ඇතුළත් වාර්තාවක් අදහස් වේ;

''තීරණ සීමා'' යන්නෙන්, පරීක්ෂණාගාර සඳහා අන්තර්ජාතික ප්‍රමිතියේ නිශ්චිතව සඳහන් කර ඇති පරදි, අහිතකර විශ්ලේෂණ තීරණයක් මත වාර්තා කළ යුතු වන්නා වූ ඉහත සාම්පලයක ආසන්නතම ද්‍රව්‍යයක් සඳහා තීන්දුවේ අගය අදහස් වේ;

''තෙවන නියෝජිත පාර්ශ්වය'' යන්නෙන්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නිවාරණ නියෝජ්‍යායතනය සඳහා උත්තේජක පාලන සේවා ඉටු කරන ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් ලෙස සේවය කරන තැනැත්තන් හෝ ශ්‍රී ලංකා උත්තේජක

මර්දන නියෝජ්‍යායතනය සඳහා වූ උත්තේජක මර්දනය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් හෝ අනෙක් උත්තේජක පාලන සේවා හෝ නියැදි එකතු කිරීම සිදු කරන අනෙක් උත්තේජක මර්දන සංවිධානවලට හෝ තුන්වන පාර්ශ්වයන්ට සීමා නොවන මුත් ඇතුළත් වන උත්තේජක මර්දන අධ්‍යාපන වැඩසටහන් හෝ යම් උත්තේජක මර්දන අරමුණක් වෙනුවෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නියෝජනය කරන යම් තැනැත්තකු අදහස් වේ;

''නුසුදුසුකම'' යන්නෙන්, යම් විශේෂිත තරගයක දී හෝ ඉසව්වක දී යම් පදක්කම්, ලකුණු සහ ත්‍යාග අහිමිවීම ඇතුළුව උද්ගත වන සියලු ප්‍රතිඵල සමඟ එම ක්‍රීඩකයාගේ ප්‍රතිඵල අවලංගු වීමක් අදහස් වේ;

''උත්තේජක පාලන'' යන්නෙන්, (තාවකාලික තරග තහනමක් හෝ තරග තහනමක් තුළ තත්ත්වය) 61 වන රීතියේ උල්ලංඝනවලට අදාළ නඩු කටයුතු හෝ විමර්ශන සහ ප්‍රතිඵල කළමනාකරණය, පරීක්ෂණාගාර විශ්ලේෂණ, නියැදි රැස්කිරීම සහ පවත්වාගෙන යාම, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය, වතගොත තොරතුරු, විමර්ශන, පරීක්ෂණවලට සීමා නොවන මුත් ඇතුළත්වන, සියලු පියවර සහ වැඩපිළිවෙලවල් අතර ප්‍රතිඵල බලාත්මක කිරීම සහ යම් අභියාචනයක අවසානය දක්වා දිගටම කෙරෙන පරීක්ෂණ බෙදා හැරීමේ සැලසුම්වල සියලු පියවර සහ වැඩපිළිවෙළවල්;

''අධ්‍යාපනය'' යන්නෙන්, චේතාන්විත සහ චේතාන්විත නොවන උත්තේජන වැලැක්වීමට සහ ක්‍රීඩාවේ හරය අරක්ෂා කිරීම සහ පිළිගැනීම උදෙසා චර්යාවන් වැඩිදියුණු කිරීම සහ අගය කාවැද්දීමට පවතින ඉගැන්වීමේ වැඩසටහන් අදහස් වේ;

''ඉසව්ව'' යන්නෙන්, ඔලිම්පික් ක්‍රීඩා, FINA ලෝක ශූරතා හෝ පෑන් (Pan America game) ඇමරිකන් ක්‍රීඩා ඇතුළුව එක පාලන මණ්ඩලයක් යටතේ එකට සිදුකරනු ලබන පුද්ගල තරග මාලාවක් අදහස් වේ;

''ඉසව් කාලය'' යන්නෙන්, ඉසව්ව පාලනය කරන මණ්ඩලය විසින් තහවුරු කළ පරිදි ඉසව්වක ආරම්භය සහ අවසානය අතර කාල සීමාව අදහස් වේ;

''ඉසව් ස්ථාන'' යන්නෙන්, යම් ඉසව්වක් සඳහා පාලන මණ්ඩලයක් විසින් නියම කරන ලද ස්ථාන අදහස් වේ;

''වරද'' යන්නෙන්, යම් විශේෂිත තත්ත්වයකට නිසි සැලකිල්ලක් අඩුවීමේ දී හෝ රාජකාරියක් කඩවීමක දී වන වරදක් අදහස් වේ. ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ වරදේ ප්‍රමාණය තක්සේරු කිරීමේ දී අවදානම් මට්ටම අවබෝධ කරගත යුතුව ඇත්තේ කුමක් සම්බන්ධයෙන් ද යන්න ක්‍රීඩකයා විසින් ක්‍රියාත්මක කරන විමර්ශන සහ ආරක්ෂාවේ මට්ටම සහ ක්‍රීඩකයා විසින් අවබෝධ කරගත යුතු ව තිබෙන අවදානමේ ප්‍රමාණය, යම් හානියක් ලෙස විශේෂ හේතු, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා ආරක්ෂිත තැනැත්තකු වන්නේ ද යන්න, ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ පළපුරුද්ද, ඇතුළත් වන කරුණු සැලකිල්ලට ගත යුතු වේ;

''මූල්‍ය ප්‍රතිවිපාක'' යන්නෙන්, උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සමඟ සම්බන්ධ වූ පිරිවැයක් පියවා ගැනීමට හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සඳහා නියම කළ මූල්‍යමය දණ්ඩනයක් අදහස් වේ;

''තරඟයක් තුළ'' යන්නෙන්, යම් තරගයකට අදාළ නියැදි එකතු කිරීමේ වැඩ සටහනකට සහ ඒ තරගයේ අවසානය දක්වා සහභාගී කරවීමට ක්‍රීඩකයා ලේඛනගත කර තිබෙන තරගයකට පෙරාතුව දිනයේ පස්වරු 11.59න් ආරම්භවන කාලසීමාව අදහස් වේ. කෙසේ වුවද, ජාත්‍යන්තර සම්මේලනය විසින් යම් විශේෂිත ක්‍රීඩාවක් සඳහා විකල්ප අර්ථකථනයක් අවශ්‍ය බවට යම් යුක්ති සහගත බලකිරීමක් සිදු කරනු ලබන්නේ නම් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එවැනි විකල්ප අර්තකථනයක් අනුමත කළ හැකිය. ලෝක  උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදු කරනු ලබන එවැනි අනුමත කිරීමක් මත එම විකල්ප අර්ථකථනය ප්‍රධාන ක්‍රීඩා සංවිධායක විසින් එම විශේෂිත ක්‍රීඩාව සඳහා අදාළ කර ගත යුතු ය;

''ස්වාධීන නිරීක්ෂණ වැඩසටහන්'' යන්නෙන්, ලෝක උත්තේජක නියෝජ්‍යායතනයේ අනුමත පාලන වැඩසටහන්වල කොටසක් ලෙස ඔවුන්ගේ නිරීක්ෂණ පිළිබඳ වාර්තා සහ ඇතැම් ඉසව් තුළ දී හෝ ඒ ඉසව්වලට පෙරාතුව උත්තේජක පාලක වැඩසටහන් පිළිබඳ මාර්ගෝපදේශ, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධීක්ෂණය යටතේ පිළිපදින සහ වාර්තා සපයන නිරීක්ෂකවරු සහ/හෝ විගණකවරු කණ්ඩායමක් අදහස් වේ;

''කේවල තරග'' යන්නෙන්, කණ්ඩායම් ක්‍රීඩාවක් නොවන යම් ක්‍රීඩාවක් අදහස් වේ;

''අයෝග්‍යතාවය'' යන්නෙන්, යම් නිශ්චිත කාල සීමාවක දී උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් හේතුවෙන් යම් තරඟයකට හෝ වෙනත් ක්‍රියාවකට හෝ අරමුදල්වලට සහභාගි වීමේ දී ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු වෙත නියම කරනු ලබන තහනමක් අදහස් වේ;

''ජාත්‍යන්තර ඉසව්'' යන්නෙන්, ඉසව් සඳහා හෝ ඉසව් සඳහා තාක්ෂණික නිලධරයන් පත් කිරීම සඳහා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර සංගමයක්, ප්‍රධාන ඉසව් සංවිධානයක් හෝ වෙනත් ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානයක් පාලන මණ්ඩලයක් වන අවස්ථාවක දී සිදු කරනු ලබන ඉසව් හෝ තරඟ අදහස් වේ;

''ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයා'' යන්නෙන්, පරීක්ෂණ සහ විමර්ශන සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියේ ඇතුළත් වන එක් එක් ජාත්‍යන්තර සම්මේලනය විසින් විස්තර කර ඇති පරිදි ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාවලට තරඟ කරන ක්‍රීඩකයකු අදහස් වේ;

''ජාත්‍යන්තර ප්‍රමිතිය'' යන්නෙන්, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව නිකුත් කළ යම් තාක්ෂණික ලේඛන ඇතුළත් විය යුතු ජාත්‍යන්තර ප්‍රමිතියේ සම්මුති ආධාර කර ගනිමින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පිළිගත් ප්‍රමිතියක් අදහස් වේ;

''ප්‍රධාන ඉසව් සංවිධාන'' යන්නෙන්, යම් මහාද්වීපික, කලාපීය හෝ වෙනත් අන්තර්ජාතික ඉසව් සඳහා පාලන මණ්ඩලයක් ලෙස කටයුතු කරන ජාතික ඔලිම්පික් කමිටුවේ සහ වෙනත් ජාත්‍යන්තර බහුවිධ ක්‍රීඩා සංවිධානවල මහාද්වීපික සංවිධාන අදහස් වේ;

''සලකුණ'' යන්නෙන්, තහනම් ද්‍රව්‍යයක හෝ තහනම් ක්‍රමයක භාවිතය දක්වන මිශ්‍රණයක්, මිශ්‍රණ සමූහයක් හෝ ජීව විද්‍යාත්මක විචල්‍ය (විචල්‍යයන්) අදහස් වේ;

''සංඝටක'' යන්නෙන්, ජීව විද්‍යාත්මක විපර්යාස ක්‍රියාවලියකින් නිපදවූ යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

''අවම වාර්තා මට්ටම'' යන්නෙන්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කරන ලද පර්යේෂණාගාර විසින් අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් ලෙස වාර්තා නොකරන ලද යම් සලකුණුවල, සංඝටකවල හෝ තහනම් ද්‍රව්‍යයක තක්සේරු කරන ලද සාන්ද්‍රණයේ මට්ටම අදහස් වේ;

''බාල වයස්කරු'' යන්නෙන්, වයස අවුරුදු දහ අටට (18) අඩු සහ ස්වභාවික තැනැත්තකු අදහස් වේ;

''ජාතික උත්තේජක මර්දන විරෝධි සංවිධානය'' යන්නෙන්, උත්තේජක මර්දන රීති, ඇති කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, නියැදි රැස්කිරීමට නියම කිරීම, පරීක්ෂණ ප්‍රතිඵල කළමනාකරණය සහ ජාතික මට්ටමින් නඩු විභාග පැවැත්වීම සඳහා මූලික අධිකාරි බලය හා වගකීම සහිතව එක් රාජ්‍යයක් විසින් නම් කරනු ලබන යම් ආස්ථිතියක් අදහස් වේ. මෙම පත්කිරීම රජයේ නිසි අධිකාරියකින් පත්කරනු ලැබ නොමැති නම් අස්ථිත්වය රටේ ජාතික් ඔලිම්පික් කමිටුව හෝ එහි සැලසුම්කරුවකු විය යුතු ය;

''ජාතික ඉසව්'' යන්නෙන්, ජාත්‍යන්තර ඉසව්වක් නොවන ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ ක්‍රීඩකයන් සම්බන්ධ වන ක්‍රීඩා ඉසව්වක් හෝ තරඟයක් අදහස් වේ;

''ජාතික සම්මේලනය'' යන්නෙන්, ජාත්‍යන්තර සම්මේලනය විසින් පිළිගත් එහි සාමාජිකයකු වන ශ්‍රී ලංකාව තුළ ජාතික හෝ කලාපීය අස්ථිත්වයක් අදහස් වේ;

''ජාතික මට්ටමේ ක්‍රීඩකයා'' යන්නෙන්,

(අ) පිළිවෙළින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ක්‍රීඩා සංවිධානයක් විසින් සංවිධානය කළ ජාතික මට්ටමේ යම් ක්‍රීඩාවකට සහභාගී වන ක්‍රීඩකයින්;

(ආ) යම් ක්‍රීඩාවක ජාතික මට්ටමේ ඉහළට තරඟයකට තරඟ කරන ක්‍රීඩකයකු;

(ඇ) ජාත්‍යන්තර සම්මේලනය විසින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු ලෙස ජාත්‍යන්තර ඉසව්වල හෝ ජාතික මට්ටමේ තරඟ කරන ක්‍රීඩකයකු, අදහස් වේ;

එසේ වුව ද, යම් ක්‍රීඩකයකු ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු ලෙස ඔහුගේ අදාළ ජාත්‍යන්තර සම්මේලනය විසින් වර්ගීකරණය කර ඇති අවස්ථාවක දී, මෙම උත්තේජක මර්දන රීතිවල කාර්යය සඳහා එකී ක්‍රීඩකයා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙක් වශයෙන් මිස ජාතික මට්ටමේ ක්‍රීඩකයකු වශයෙන් නොසැලකිය යුතුය.

''ජාතික ඔලිම්පික් කමිටුව'' යන්නෙන්, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් පිළිගත් සංවිධානයක් අදහස් වේ. ශ්‍රී ලංකාව තුළ දී ජාතික ඔලිම්පික් කමිටුව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වේ;

''වරදක් හෝ නොසැලකිලිමත් බවක් නොමැති බව'' යන්නෙන්, තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් හෝ අන්‍යාකාරයේ උල්ලංඝනය කළ තහනම් උත්තේජක මර්දන රීතියක් ක්‍රීඩකයා භාවිත කර තිබූ හෝ ක්‍රියාවෙහි යොදවනු ලැබ තිබූ බවට එම ක්‍රීඩකයා උපරිම අවධානයෙන් ක්‍රියා කිරීමේ දී පවා දැන නොසිටි හෝ සැක නොකළ සහ ප්‍රමාණවත් ලෙස දැනගත හැකිව හෝ සැක කරනු ලැබ නොතිබීමක් අදහස් වේ;

''ක්‍රියාකාරී ස්වාධීනත්වය'' යන්නෙන්, ප්‍රතිඵල කළමනාකරණය සහ එයට අනුබද්ධ වීම සඳහා වගකීම ඇති උත්තේජක මර්දන සංවිධානයේ මණ්ඩල සාමාජිකයන්, කාර්ය මණ්ඩල සාමාජිකයන්, කොමිසමේ සාමාජිකයන්, උපදේශකවරු සහ නිලධරයන් මෙන්ම උත්තේජක මර්දන සංවිධානයේ විභාග කිරීමේ මණ්ඩලයේ ලිපිකරුවකු සහ/හෝ සාමාජිකයකු ලෙස පත් කළ නොහැකි පූර්ව විනිශ්චයට සහ විමර්ශනයට සම්බන්ධ යම් කාරණාවකට අයත්වන යම් පුද්ගලයෙකු; විභාග කිරීමේ මණ්ඩලය උත්තේජක මර්දන සංවිධානයෙන් හෝ යම් තුන්වන පාර්ශ්වයකින් බාධාවකින් තොරව විභාග කිරීමේ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යෑමේ තත්ත්වයකින් පැවතිය යුතු ය. විභාග කිරීමේ මණ්ඩලයේ සාමාජිකයන් හෝ විභාග කිරීමේ මණ්ඩලයේ තීරණවල දී අන්‍යාකාරයකින් සම්බන්ධ වූ තැනැත්තන් නඩු කාරණාව ඉදිරියට පවත්නාගෙන යාමේ විමර්ශනවලට හෝ තීරණවලට සම්බන්ධ නොවන බවට සහතික කිරීම මෙහි පරමාර්ථය වේ;

''තරඟවලින් පිටත'' යන්නෙන්, තරඟ කිරීමක් නොවන යම් කාල සීමාවක් අදහස් වේ;

''සහභාගිකරු'' යන්නෙන්, යම් ක්‍රීඩකයකු හෝ ක්‍රීඩා සහායක තැනැත්තකු අදහස් වේ;

''තැනැත්තා'' යන්නෙන්, ස්වාභාවික තැනැත්තකු හෝ සංවිධානයක් හෝ වෙනත් අස්තිත්වයක් අදහස් වේ;

''සන්තකය'' යන්නෙන්, සැබෑ භෞතික හිමිකාරිත්වය හෝ නිර්මාණාත්මක හිමිකාරිත්වය අදහස් වේ;

''තහනම් ලැයිස්තුව'' යන්නෙන්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත් කළ පරිදි ද්‍රව්‍යවල හෝ ක්‍රමවල ලැයිස්තුව අදහස් වේ;

"තහනම් ක්‍රම'' යන්නෙන්, තහනම් කළ ලැයිස්තුවේ එසේ විස්තර කර ඇති යම් ක්‍රමයක් අදහස් වේ;

"තහනම් ද්‍රව්‍ය'' යන්නෙන්, තහනම් කළ ලැයිස්තුවේ එසේ විස්තර කර ඇති පරිදි යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය කාණ්ඩයක් අදහස් වේ;

"ආරක්ෂිත තැනැත්තා" යන්නෙන්, උත්තේජක මර්දන රීති උල්ලංඝන කාල සීමාවේ දී

(අ) වයස අවුරුදු දහසයට (16) අඩු;

(ආ) වයස අවුරුදු දහඅටට (18) අඩු යම් ලියාපදිංචි පරීක්ෂණ සංචිතයකට ඇතුළත් නොවන සහ විවෘත කාණ්ඩයක් යටතේ යම් ජාත්‍යන්තර ඉසව්වකට කිසිම තරඟ කිරීමක් කර නැති; හෝ

(ඇ) අදාළ ජාතික නීති පැනවීම් යටතේ වයස හැරුණු විට වෙනත් හේතු වෙනුවෙන් නීතිමය අවකාශය අඩු බවට තීරණය කර ඇති,

ක්‍රීඩකයකු හෝ ස්වභාවික තැනැත්තකු අදහස් වේ.

"තාවකාලික විභාග කිරීමක්" යන්නෙන්, ලිඛිත නැතහොත් වාචික ආකාරයෙන් විභාග කළ යුතු අවස්ථාවක් බවට ක්‍රීඩකයාට දැන්වීමක් සපයන 38 වන රීතිය යටතේ විභාග කිරීමකට පෙරාතුව කඩිනම් ලුහුඬු විභාග කිරීමක් අදහස් වේ;

"තාවකාලික තහනමක්" යන්නෙන්, පවත්වන නඩු විභාග කිරීමක අවසාන තීරණයට පෙරාතුව ක්‍රියාකාරකමකට හෝ යම් තරඟයකට ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු සහභාගී වීමෙන් තාවකාලිකව වළක්වන ලද තහනමක් අදහස් වේ;

"ප්‍රසිද්ධ හෙළිකිරීම" යන්නෙන්, 84 වන රීතියට අනුකූලව කලින් දැනුම් දීමකට හිමිකම් ලබන තැනැත්තන් ඉක්මවා සාමාන්‍ය ජනතාවට හෝ තැනැත්තන්ට තොරතුරු බෙදාහැරීම හෝ පළ කිරීම අදහස් වේ;

"කලාපීය උත්තේජක මර්දන සංවිධාන" යන්නෙන්, උත්තේජක මර්දන රීති පිළිගැනීම සහ නියාමනය කිරීම, නියැදි එකතු කිරීම සහ සැකසීම, ප්‍රතිඵල කළමනාකරණය, චිකිත්සක භාවිතය සඳහා වන මුක්තිය පිළිබඳ නිදහස් විචාරය, විභාග පැවැත්වීම සහ කලාපීය මට්ටමේ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම ඇතුළත් විය හැකි ඔවුන්ගේ ජාතික උත්තේජක මර්දන වැඩසටහන් වන පවරන ලද ක්ෂේත්‍රයක් කළමනාකරණයට සහ සමායෝජනයට සාමාජික රටවල් මගින් පත් කරනලද කලාපීය අස්ථිත්වයක් අදහස් වේ;

"ලියාපදිංචි පරීක්ෂණ සංචිතය" යන්නෙන්, ජාත්‍යන්තර සම්මේලනයේ හෝ ජාතික උත්තේජක මර්දන සංවිධානයේ පරීක්ෂණ බෙදා හැරීමේ සැලසුමේ කොටසක් ලෙස තරඟාවලිය තුළ හෝ තරඟාවලියෙන් පිට සිදුවන යොමු කිරීමකට යටත්වන ජාතික උත්තේජක මර්දන සංගමයක් විසින් ජාත්‍යන්තර සම්මේලනය විසින් ජාත්‍යන්තර මට්ටමින් සහ ජාතික උත්තේජක මර්දන සංවිධානය විසින් ජාතික මට්ටමින් වෙන්ව පිහිටුවා ගනු ලැබූ ඉහළ ප්‍රමුඛතා සහිත ක්‍රීඩකයන්ගේ සංචිතයක් අදහස් වේ;

"ප්‍රතිඵල කළමනාකරණය" යන්නෙන්, ජාත්‍යන්තර ප්‍රමිතියේ 5වන වගන්තිය අනුව දැනුම්දීමක් අතර කාල පරාසයක් තුළ පවතින ක්‍රියාවලියක් හෝ ඇතැම් නඩු විභාග වලදී ප්‍රථිඵල කළමනාකරණය කිරීම පිළිබඳව පූර්ව දැනුම්දීමක් සඳහා වන පියවර සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතිවල 5වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි පළමු අවස්ථාවේදීම, විභාග කිරීමේ ක්‍රියාවලිය අවසානය හෝ අභියාචනයක් මත ද යන්න ඇතුළුව චොදනාවේ මුල සිට කාරණාවේ අවසාන බේරුම් කිරීම තෙක් සිදුවන ක්‍රියාවලිය අදහස් වේ.

"සාම්පල හෝ ආදර්ශ" යන්නෙන්, උත්තේජක පාලන අරමුණු සඳහා රැස්කළ යම් ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (එස්. එල්. ඒ. ඩී. ඒ.) යන්නෙන්, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත විසින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අදහස් වේ;

"තාක්ෂණික ලේඛනය" යන්නෙන්, ජාත්‍යන්තර ප්‍රමිතියකින් ඉදිරිපත් කර ඇති පරිදි විශේෂිත උත්තේජක මර්දන මාතෘකා, කාලයෙන් කාලයට ප්‍රකාශයට පත්කළ ලේඛනයක් අදහස් වේ;

"පරීක්ෂණ සංචිත" යන්නෙන්, ක්‍රීඩකයා තරඟයෙන් බැහැර ද යන්න ස්ථානගත කරගැනීමට සහ පරීක්ෂාකිරීම පිණිස අවශ්‍ය කරන ක්‍රීඩකයන්ගේ වතගොත පිළිගත තොරතුරු ඇතුළත් වන ලියාපදිංචි පරීක්ෂණ සංචිතයක් යටතේ සිදුකරන ලද ශ්‍රේණිගත කිරීමක් අදහස් වේ;

"ජාවාරම" යන්නෙන්, ක්‍රීඩකයකු, ක්‍රීඩා සහායක තැනැත්තකු හෝ උත්තේජක මර්දන සංචිතයක අධිකාරියට යටත් වන වෙනත් යම් තැනැත්කු විසින් යම් තුන්වන පාර්ශවයකට (භෞතික හෝ යම් ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් ක්‍රමවලින්) තහනම් කළ ක්‍රමයක් හෝ තහනම් කළ ද්‍රව්‍යයක් (යම් කාරණාවක් සඳහා සන්තකයේ දරන හෝ) බෙදාහැරීමක් හෝ භාරදීමක්, යැවීමක්, ප්‍රවාහනය කිරීමක්, ලබා දීමක්, විකිණීමක් අදහස් වේ.

එසේ වුව ද, අව්‍යාජ සහ නීතිමය චිකිත්සක අරමුණු හෝ වෙනත් පිළිගත් හේතුවක් සඳහා භාවිතා කළ තහනම් කළ ද්‍රව්‍යයකට සම්බන්ධ වන වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සත්භාවයෙන් කරන ලද ක්‍රියාවක් මෙම අර්ථකථනයට ඇතුළත් නොවිය යුතු අතර ඒ තහනම් ද්‍රව්‍ය, ක්‍රීඩා දියුණු කිරීමට අරමුණු කරනවා මිස අව්‍යාජ සහ නීතිමය චිකිත්සක කාර්යයන් සඳහා අරමුණු කරන බවට පූර්ණ ඔප්පු කිරීමක් ලෙස අවස්ථානුගත කරුණු ඇත්නම් මිස තරගවලින් බැහැර පරීක්ෂණවල දී තහනම් නොකළ තහනම් ද්‍රව්‍ය සම්බන්ධ වන ක්‍රියාවක් ඇතුළත් නොවිය යුතු ය;

"පරීක්ෂණ" යන්නට, 2013 අංක 33 දරන ක්‍රීඩා පනතේ උත්තේජක විරෝධී සම්මුතියේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"චිකිත්සක භාවිත නිදහස (TUE) යන්නට, 2013 අංක 33 දරන ක්‍රීඩා පනතේ උත්තේජක විරොධි සම්මුතියේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"භාවිත" යන්නට 2013 අංක 13 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) යන්නට, 2013 අංක 33 දරන ක්‍රීඩා පනතේ උත්තේජක විරෝධී සම්මුතියේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

102. 2020 පෙබරවාරි මස 19 වන දිනැති අංක 2163/ 20 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද රීති ඒ යටතේ කලින් සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

EOG 04 - 0088